# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,932 — 1970 නොවැම්බර් 12 වැනි බ්‍රහස්පතින්ද — 1970.11.12

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


# I වැනි කොටස: (II) වැනි ඡේදය—පලකිරීම්

(වෙන වෙනම ගොනුකර ගතහැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| තනතුරු—ඇබෑර්තු ... ... ... | 1573 | තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1599 | ආණ්ඩුවේ නොවන දැන්වීම් ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... | 1601 | රට බිම විකිණීමේ බලපත්‍ර සඳහා වූ අයදුම් පත් ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... | — | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 1615 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්... ... ... | 1618 |


## තනතුරු—ඇබෑර්තු

### ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයෙහි පළ කෙරෙන රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදාලවන පොදු කොන්දේසි

**දීමනා.**—ගෙවල් කුලී දීමනාව, තාවකාලික ජීවන දීමනාව, තාවකාලික විශේෂ දීමනාව යන මෙම දීමනා ඒ සම්බන්ධයෙන් අන්‍යාකාරයෙන් සඳහන් කොට නැති අවස්ථාවන් හිදී ආණ්ඩුවේ රෙගුලාසි අනුව ගෙවනු ලැබේ.

**2. සේවා කොන්දේසි.**—පත්වීම් වූ කලී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා, මුදල් රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහ රෙගුලාසි දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි, යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධිවිධානවලට හෝ රෙගුලාසිවලට යටත් වන්නේ ය.

**3. සේවයට භාර ගැනීම් පිළිබඳ කොන්දේසි.**—(i) විශ්‍රාම වැටුප් රහිත සංස්ථාවලට කරන පත් කිරීම්වල දී (දවස් පඩි ලබන්නන් හැර) ඒ තනතුරුවලට පත්වන්නන්ට තම පඩියෙන් සියයට 5ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවීමට නියම කරනු ලැබේ. මීට අතිරේක වශයෙන් ස්වකීය මනාපය පරිදි තවත් සියයට 5ක් එක් කිරීමට ඔවුන්ට ඉඩ දෙනු ලැබේ. නිලධාරියා මේ දෙකෙන් කවරක් ගෙව්වත් එක් එක් මුදල් අවුරුද්ද අවසානයේ දී ඔහුට ගෙවා ඇති සම්පූර්ණ වැටුපෙන් සියයට 7½ කට සමාන මුදලක් ඒ අරමුදලට සම්මාදම් වශයෙන් ආණ්ඩුවෙන් ද ගෙවනු ලැබේ.

(ii) ඒ ඒ තනතුරුවලට පත්වන්නන් විසින් "ඇප තැබීම කළ යුතුය" යි ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් විසින් තීරණය කරනු ලැබුවහොත් එවිට ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් (ඇප) ආඥා පනත අනුකූලව ඇප තබන ලෙස ඔවුන්ට නියම කෙරෙනු ඇත.

(iii) තනතුරුවලට පත්වන්නන් අතුරෙන් දැනටම රාජ්‍ය සේවා වෙහි සිටින්නන්ට හැර සෙස්සන්ට ලංකාවේ කවර පෙදෙසක වුවත් සේවය කිරීමට ඔවුන් සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම සඳහා ආණ්ඩුවේ වෛද්‍ය නිලධාරියකු විසින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකට පෙනී සිටීමට නියම කරනු ලැබේ.

**4. රාජ්‍ය සේවයට බැඳෙන නව ප්‍රවේශකයෝ.**—(i) යම් තනතුරක් සඳහා වඩා දීර්ඝ කාලයක් නියම කොට ඇත්නම් මිස, අදාලවන පරිදි විශ්‍රාම වැටුප් සහිත/විශ්‍රාම වැටුප් රහිත තනතුරුවලට පත් කරන ලද නව ප්‍රවේශක නිලධාරීන්ගේ ආධුනික/පරීක්ෂා සේවා කාල පරිච්ඡේදය අවුරුදු තුනක් විය යුතුය.

---

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දැන්වීම් පිළිබඳ

**විශේෂ නිවේදනයයි**

**මුද්‍රණයට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දැන්වීම් භාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථොක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.**

**1970 ජූනි මස 2 වැනි දින,**
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ.

**එල්. ඩබ්ලිව්. පී. පීරිස්,**
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

---

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(ඒ) විශිෂ්ට චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(බී) 1970.11.26 වැනි දිනට වයස අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි බව (දැනට රජයේ සේවයේ නියුක්ත වූවන් කෙරෙහි මෙම උපරිම වයස් සීමාව අදාල නොවේ).

(සී) පිළිගත් විශ්ව විද්‍යාලයක පශු වෛද්‍ය විද්‍යාව පිළිබඳ උපාධිධරයකු බව.

සැ.යු.—ලංකාවේ විශ්ව විද්‍යාලවල අවසාන පරීක්ෂණයට පෙනී සිට ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිටින අයගෙන්ද අයදුම් පත් භාරගනු ලැබේ. එහෙත් විශ්ව විද්‍යාලයයේ ප්‍රතිඵල නිකුත් කළ වහාම එම පරීක්ෂණයෙන් තමා සමත්වී තිබේද යන බව ඔවුන් විසින් මා වෙත දැනුම් දිය යුතුය. නොඑසේ නම් ඔවුන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු නොලැබේ.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටෙක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදානම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (සැ.යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසැලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාරගනු නොලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක්—මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂක තැනගෙන් හෝ විද්‍යාලයීය ආචාර්ය වරයාගෙන් හෝ මහාචාර්ය වරයාගෙන් විය යුතුය.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස්ම විභාග පිළිබඳ සහතික.

සැ.යු.—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුය.

(ii) ඉල්වූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයින්ගේ අයදුම් පත් සලකා බලනු නොලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් කම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙළින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝරමය සමඟ තමන්ට එවන ලද (" බී " සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම් පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත් කිරීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දේසිවලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝරමය සමඟ තම තමන්ට නිකුත් කරන ලද ("ඒ" සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නොලැබේ. මේ නියමය පිළිපදින්නාවූද ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුළත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නොලැබෙන්නාවූ ද අයදුම් කරුවන් විසින් ඒ බව රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 නොවැම්බර් මස 5 වැනි දින,
කොළඹ 1, ගාලු මුවදොර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දීය,
තැ.පෙ. 500.

11–393/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒ. 94/එක්ස්. 2303/70.

## අධ්‍යාපන අමාත්‍යාංශය

### ගෘහ විද්‍යාව පිළිබඳ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ ගෘහ විද්‍යාව පිළිබඳ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුයි.

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර : 1970 නොවැම්බර් මස 26 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර: 1970 දෙසැම්බර් මස 4 වැනිද.

**සටහන්.**—

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපැලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ සේවයේ නියුක්ත නිලධාරියෙක් ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නො වූ ද තම ලිපිනය ලියන ලද්ද වූ ද මුද්දර නොගැසුවා වූ ද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරාගත යුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයින්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාල සීමාව ඇතුලත දී බාරදීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරාගනු ලබන නිලධාරීන්, ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැනගනු පිණිස, පිළිගත් වෛද්‍ය වරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයක් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා කොන්දේසි.**—

(i) මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දයක මුදල් ගෙවිය යුතුය. කාන්තාවක් මෙම තනතුරට පත් කරන ලද නම් ඇයට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභයක් හිමිවනු ඇත. ඇය විසින් තමාගේ වැටුපෙන් සියයට පහක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. ඇය විසින් අවුරුදු 10ක සේවය සම්පූර්ණ කිරීමට පෙරාතුව විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීම හෝ අර්ථසාධක අරමුදලට තවදුරටත් දයක වීම හෝ සඳහා සිය මනාපය ඇය විසින් පළ කල යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරියක ලෙස හා/හෝ අර්ථසාධක අරමුදල් හිමි තනතුරක ඇය දැනටමත් අවුරුදු 10ක් සේවය කර ඇත්නම් මෙම පත්වීම ලැබ මාස 6ක් ඇතුලත ඇයගේ මනාපය පළ කල යුතුයි.

(ii) පත්වීම පළමුවරට අවුරුදු තුනක ප්‍රවාසන කාලයකට යටත්වේ. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරන නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ඇය පළමුවරට එක් අවුරුදු වැඩ බැලීමකට යටත්ව පත් කරනු ලැබේ.

(iii තෝරා ගනු ලබන අයදුම්කරු, සේවයේ ස්ථිර කරනු ලබන්නේ වෙනත් කරුණු අතර, රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග හා පාලන රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද, අධ්‍යාපන නීතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක් ද, ඇතුලත් පරීක්ෂණයකින් සමත්වීම මතය. ආධුනික/පරීක්ෂා/වැඩ බලන කාල සීමාව තුල මෙම පරීක්ෂණයෙන් සමත් නොවුව හොත් 120 හා 121 වැනි පාලන රෙගුලාසි වල විධිවිධාන අදල වනු ඇත.

(iv) තෝරාගනු ලබන අයදුම්කරු පත්වීම ලැබූ දින සිට සතර අවුරුදු කාල සීමාවක් ඇතුලත දී සාමාන්‍ය ලිපිකාර සේවාවේ විධායක ලිපිකරු පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත සිංහල/දෙමළ භාෂා පරීක්ෂණයකින් සාමාර්ථය ලැබිය යුතුය. එසේ කිරීමට අසමත්වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතුවේ. ඉඩ දී ඇති කාල සීමාවට වඩා ගතවන වැඩිපුර කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලබනවා ඇත.

තෝරාගනු ලබන අයදුම්කරු පත්වීමෙහි ස්ථිර කිරීමට පෙර ඔහුගේ/ඇයගේ ආධුනික/පරීක්ෂා කාලය තුලදී අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන පරිදි පහත සඳහන් කරුණු සම්පූර්ණ කල යුතු වේ:—

(අ) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද පරිදි තෝරා ගන්නා ලද එක්තරා ප්‍රදේශයක ප්‍රාථමික හෝ ද්විතියික මට්ටමේ අධ්‍යාපන පරිපාලනය/අධ්‍යාපන සැලැස්ම සහ සංවර්ධනය ගැන මෑතක වූ සංවර්ධනය පිළිබඳ ව විවේචනාත්මකව හැදෑරීම.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති හැදෑරීම් පදනම්කොට, එසේ හදාරන ලද දෑ වලින් ලත් පළපුරුද්ද ලංකාවට ගැල පෙන සේ යොද ගත හැකි අයුරු සවිස්තරව දක්වීම.

3. **වැටුප් සහ දීමනා.**—රු. 11,040ක වාර්ෂික ඒකාබද්ධ වැටුපකින් පටන්ගෙන රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින් යුක්තව රු. 14,880ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් සහිතව රු. 16,320 දක්වා වූ වැටුප් ක්‍රමයක් මීට අදල වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය:—

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව.

(ආ) 1970.11.26 වැනි දිනට අවුරුදු 30ට නො අඩු හා අවුරුදු 45ට නො වැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් කෙරෙහි උපරිම වයස් සීමාව බල නොපායි.

(ඇ) පාඨශාලාවන්හි සහ/හෝ ගුරු විද්‍යාලවල ගෘහ විද්‍යා වැඩ සටහන් සංවිධානය කිරීම සහ පාලනය කිරීම පිළිබඳ අවුරුදු 5 කට නො අඩු පල පුරුද්දක් සහ යටත් පිරිසෙයින් පස් අවුරුද්දක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පිලිගත් විශ්ව විද්‍යාලයක ගෘහ විද්‍යාව පිළිබඳ උපාධිධරයෙකු වීම; හෝ

පිළිගත් ආයතනයක ගෘහ විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමා සහතිකයක් ඇතිව පරිපාලනය පිළිබඳ අවුරුදු 5 කට නො අඩු සේවයක් සහිතව ගෘහ විද්‍යාව ඉගැන්වීම සංවිධානය කිරීම හා පරිපාලනය කිරීම පිළිබඳ අවුරුදු 15 ක පළපුරුද්දක් තිබීම.

(ඈ) ජ්‍යෙෂ්ඨ/අ. පො. ස. විභාගයේ දී හෝ වෙනත් උසස් විභාගයක දී තමන් රාජකාරි කරන භාෂාවෙන් සාහිත්‍යය හෝ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍රවලින් සමර්ථ වී තිබීම.

**සංලක්ෂ්‍යය.**—යටත් පිරිසෙයින් ගෘහ විද්‍යා අධ්‍යාපන කටයුතු පාලනයෙහි අවුරුදු 10ක් හා ගෘහ විද්‍යා අධ්‍යාපන කටයුතු පිළිබඳ අවුරුදු 15ක මුළු සේවා කාලයක් ඇති අධ්‍යාපන උපදේශක තත්ත්වයේ නිලධාරින්ට ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකිය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරිමට සෑම අපේක්ෂකයෙකුම සූදනම් විය යුතුය :—

(ඒ) උප්පැන්න සහතිකය (**සැ. යු.**— අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බවුතීස්ම සහතික භාර ගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස් ම අධ්‍යාපනික සහතිකය.

(සී) චරිත සහතික දෙකක් මින් එකක් අධ්‍යාපන අධ්‍යක්ෂගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යවරයාගෙන් හෝ විය යුතුයි.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂා වලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික.

(එෆ්) පළපුරුදුකම ඔප්පු කිරීම සඳහා අවශ්‍ය සහතික.

**සැ. යු.**—(i) අයදුම්පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නො ඇමිණිය යුතුය.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරින් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දින දී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැන ගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්ම සමග තමන්ට එවන ලද (ආ) ලකුණ දරන මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදල වන පොදු කොන්දෙසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (''අ'' සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නො පිලිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිලිපදින්නාවූ ද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නාවූ ද, අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත් අයදුම්කරුවකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමිවේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 නොවැම්බර් මස 5 දින,
කොළඹ 1, ගාලුමුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදී ය.

11–393/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

අංකය: ඒ. 95/එක්ස්. 2304/70

## අධ්‍යාපන අමාත්‍යාංශයේ හස්ත කර්මාන්ත පිළිබඳ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර

අධ්‍යාපන අමාත්‍යාංශයේ හස්ත කර්මාන්ත පිළිබඳ ප්‍රධාන අධ්‍යාපන නිලධාරි තනතුර සඳහා ඉල්ලුම් පත් එවන ලෙස මෙයින් ආරාධනය කරනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි වූ ඉල්ලුම් පත් පහත සඳහන් දිනයට හෝ ඊට පෙර කොළඹ 1, තැ. පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය:—

(ඒ) මෙරට ඉල්ලුම් පත්‍ර: 1970 නොවැම්බර් මස 26 වැනිද.

(බී) විදේශීය ඉල්ලුම් පත්‍ර: 1970 දෙසැම්බර් මස 4 වැනිද.

**සටහන් :**

(i) මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම තැපෑලෙන් එවන ලෙස ඉල්ලුම් කරන විට අයදුම්කරු රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරියෙක්ද නැද්ද යනු ඉතාමත් පැහැදිලිව සඳහන් කරමින් 9″ × 4″ ප්‍රමාණයට කුඩා නො වූ ද තම ලිපිනය ලියන ලද්දවූද මුද්දර නොගැසුවාවූද ලියුම් කවරයක් එවිය යුතුය.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපෑලේදී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය හැකි නොවේ. අවසාන දිනයන් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි අයදුම්කරුවන් විසින්ම විඳ දරා ගතයුතුය.

(iii) පිටරටවල අයදුම්කරුවන්ට මුද්‍රිත ඉල්ලුම් පත්‍ර පෝර්ම විදේශයෙහි සිටින ලංකා නියෝජිතයන්ගේ කාර්යාලවලින් ලබා ගත හැකිය. තම ඉල්ලුම් පත්‍ර රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත එවනු සඳහා, තමන් පදිංචි හෝ තමන්ට ආසන්නම හෝ රටට පත් කොට සිටින ලංකා නියෝජිතයාගේ කාර්යාලයට නියමිත කාලසීමාව ඇතුළත දී භාර දීමට අයදුම්කරුට සිය අභිමතය පරිදි පිළිවන.

(iv) **වෛද්‍ය පරීක්ෂණය හා නැව් ගාස්තු.**—ලංකාණ්ඩුව යටතේ සේවය සඳහා පත් කරනු පිණිස විදේශයෙන් තෝරා ගනු ලබන නිලධාරින් ඔවුන් සේවය සඳහා ශාරීරික වශයෙන් යෝග්‍ය දැයි දැන ගනු පිණිස, පිළිගත් වෛද්‍යවරයෙකු ඉදිරියෙහි පරීක්ෂණයන් සඳහා පෙනී සිටිය යුතුය. එම පරීක්ෂණය සඳහා ගාස්තුවත් ලංකාවට පැමිණීම සඳහා ඔවුන්ගේ නැව් ගාස්තුවත් ඔවුන් විසින් ම ගෙවිය යුතු වෙයි.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගක්ති හා කොන්දේසි .—**

(i) මේ තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. කාන්තාවක් මෙම තනතුරට පත් කරන ලද නම් ඇයට රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභයක් හිමිවනු ඇත. ඇය විසින් තමාගේ වැටුපෙන් සියයට පහක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය. නිලධාරිනියක අවුරුදු 10ක් සේවය සම්පූර්ණ කිරීමට පෙරාතුව විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීම හෝ අර්ථසාධක අරමුදලට තවදුරටත් දයකවීම හෝ සඳහා සිය මනාපය ඇය විසින් පළ කළ යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ විශ්‍රාම වැටුප් හිමි ගුරුවරියක ලෙස හා/හෝ අර්ථසාධක අරමුදල් හිමි තනතුරක ඇය දැනටමත් අවුරුදු 10ක් සේවය කර ඇත්නම් මෙම පත්වීම ලැබ මාස 6 ක් ඇතුළත ඇයගේ මනාපය පළ කළ යුතුයි.

(ii) පත්වීම පළමුවරට අවුරුදු තුනක ප්‍රවාසන කාලයට යටත් වේ. දැනටමත් රාජ්‍ය සේවයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරක් දරණ නිලධාරියෙකු තෝරා ගනු ලැබුවහොත් ඔහු/ ඇය පළමු වරට එක් අවුරුදු වැඩ බැලීමකට යටත්ව පත් කරනු ලැබේ.

(iii) තෝරා ගනු ලබන අයදුම්කරු, සේවයේ ස්ථිර කරනු ලබන්නේ වෙනත් කරුණු අතර රාජ්‍ය සේවා කොමිෂන් සභා නියෝග හා පාලන රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්ද, අධ්‍යාපන නීතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්ද, මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්ද ඇතුළත් පරීක්ෂණයකින් සමත් වීම මතය. ආධුනික/පරීක්ෂණ/වැඩ

බලන කාල සීමාව තුළ මෙම පරීක්ෂණයෙන් සමත් නො වුව හොත් 120 හා 121 වැනි පාලන රෙගුලාසිවල විධිවිධාන අදල වනු ඇත.

(iv) තෝරා ගනු ලබන අයදුම්කරු පත්වීම ලබන දින සිට සතර අවුරුදු කාල සීමාවක් ඇතුළත දී සාමාන්‍ය ලිපිකාර සේවාවේ විධායක ලිපිකරු පන්තියේ II වන ශ්‍රේණියේ නිලධාරීන් සඳහා නියමිත සිංහල/දෙමළ භාෂා පරීක්ෂණයකින් සාමර්ථ්‍යය ලැබිය යුතුය. එසේ කිරීමට අසමත්වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතු වේ. ඉඩ දී ඇති කාලසීමාවට වඩා ගතවන වැඩිපුර කාලපරිච් ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාලපරිච්ඡේදයක් ලෙස සලකනු ලබනවා ඇත.

(v) තෝරාගනු ලබන අයදුම්කරුගේ පත්වීම ස්ථිර කිරීමට පෙර ඔහුගේ ආධුනික/පරීක්ෂණ/වැඩ බැලීමේ කාලය තුළදී අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් සෑහීමකට පත්වන පරිදි පහත සඳහන් කරුණු සම්පූර්ණ කළ යුතු වේ:—

(අ) අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත කරන ලද පරිදි තෝරා ගන්නා ලද එක්තරා ප්‍රදේශයක ප්‍රාථමික හෝ ද්විතීයික මට්ටමේ අධ්‍යාපන පරිපාලනය/අධ්‍යාපන සැලැස්ම සහ සංවර්ධනය ගැන මෑතක වූ සංවර්ධනය පිළිබඳව විවේචනාත්මකව හැදෑරීම.

(ආ) ඉහත (අ) හි දක්වා ඇති හැදෑරීම පදනම් කොට, එසේ හදරන ලද දෑ වලින් ලත් පළපුරුද්ද ලංකාවට ගැලපෙන සේ යොදා ගත හැකි අයුරු සවිස්තරව දැක්වීම.

3. **වැටුප් සහ දීමනා.**—රු. 11,040 ක වාර්ෂික ඒකාබද්ධ වැටුපකින් පටන්ගෙන රු. 480 වාර්ෂික වැටුප් වැඩිවීම් 11 කින් යුක්තව රු. 14,880ට ප්‍රථම කාර්යක්ෂමතා කඩඉමක් සහිත රු. 16,320 දක්වා වූ වැටුප් ක්‍රමයක් මීට අදල වේ.

4. **අවශ්‍ය සුදුසුකම්:**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :

(අ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බව,

(ආ) 1970.11.26 වැනි දිනට අවුරුදු 30 ට නො අඩු හා අවුරුදු 45ට නො වැඩි විය යුතුය. දැනටමත් රජයේ සේවයේ යෙදී සිටින්නන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බල නොපායි.

(ඇ) වෘත්තීය තත්ත්වයේ හෝ පූර්ව වෘත්තීය තත්ත්වයේ කාර්මික අධ්‍යාපනය පිළිබඳ අවුරුදු 10 කට නො අඩු පරිපාලන පළ පුරුද්දක් සහ පිළිගත් විශ්ව විද්‍යාලයක උපාධියක් තිබීම: හෝ

(ඈ) (i) එක්සත් රාජධානියේ යාන්ත්‍රික ඉංජිනේරු පිළිබඳ උසස් ජාතික සහතිකය හෝ ඩිප්ලෝමාව තිබීම: හෝ;

(ii) ලන්ඩනයේ සිටි ඇන්ඩ් ගිල්ඩ්ස් ආයතනයේ සම්පූර්ණ කාර්මික සහතිකය තිබීම; හෝ

(iii) ඊට සමාන හෝ උසස් සහතිකයක් තිබීම: සහ අවුරුදු 15 කට නො අඩු වෘත්තීය හා/හෝ ඉගැන්වීමේ පළපුරුද්දක් තිබීම;

(ඉ) ජ්‍යෙෂ්ඨ/අ. පො. ස. විභාගයේදී හෝ වෙනත් උසස් විභාගයකදී තමන් රාජකාරි කරන භාෂාවෙන් සාහිත්‍යය හෝ භාෂාව පිළිබඳ ප්‍රශ්න පත්‍ර වලින් සමර්ථවී තිබීම;

(ඊ) අධ්‍යාපන උපදේශකවරයෙකු වශයෙන් අවුරුදු 3 කට හෝ 1 වැනි ශ්‍රේණියේ විදුහල්පති වරයෙකු වශයෙන් හෝ කණිෂ්ඨ කාර්මික විද්‍යාලයක විදුහල්පතිවරයෙකු වශයෙන් හෝ අවුරුදු 5 කට නො අඩු සේවයක් තිබීම; හෝ

(උ) හස්ත කර්මාන්ත ඉගැන්වීමෙහි හා/හෝ පාලනයෙහි යටත් පිරිසෙයින් දස වර්ෂයක පළපුරුද්දක් තිබීම.

**සංලක්ෂ්‍යය.**—කාර්මික අධ්‍යාපනයට සම්බන්ධ අවුරුදු 10 ක මුළු සේවා කාලයක් ඇති අධ්‍යාපන උපදේශක තත්ත්වයේ නිලධාරීන් හෝ කාර්මික අධ්‍යාපනයට සම්බන්ධ ජ්‍යෙෂ්ඨ (වෘත්තීය) උපදේශකයින්ගේ තත්ත්වයේ සිටින අවුරුදු 15 කට නො අඩු මුළු සේවාකාලයක් ඇති කාර්මික ආයතනවල අයට ද මෙම තනතුර සඳහා ඉල්ලුම් කළ හැකි ය.

5. පහත සඳහන් ලියකියවිලි එකක් හෝ සියල්ලම අවශ්‍ය විටක ඉදිරිපත් කිරීමට සෑම අපේක්ෂකයෙකුම සූදනම් විය යුතුය:—

(ඒ) උප්පැන්න සහතිකය. (සැ. යු.—අධ්‍යාපන රෙගුලාසි පරිදි උපකෘත පාසලක ප්‍රයෝජනය සඳහා ඉදිරිපත් කරන ලද සහතික හෝ බව්තිස්ම සහතික භාර ගනු නො ලැබේ.)

(බී) උපාධි හෝ උසස්ම අධ්‍යාපනික සහතිකය,

(සී) චරිත සහතික දෙකක්. මින් එකක් අධ්‍යයන අධ්‍යක්ෂ ගෙන් හෝ විද්‍යාලයීය ආචාර්යවරයාගෙන් හෝ මහාචාර්යයවරයාගෙන් හෝ විය යුතුයි.

(ඩී) වෘත්තීය සහ/හෝ කාර්මික සුදුසුකම් පිළිබඳ සහතික.

(ඊ) සිංහල, දෙමළ හා ඉංග්‍රීසි භාෂාවලින් සමත් උසස් ම විභාග පිළිබඳ සහතික,

(එෆ්) 4(ඉ), (ඊ) හා (උ) ඡේදවල දක්වා ඇති සුදුසුකම් ඔප්පු කිරීම සඳහා අවශ්‍ය සහතික.

**සැලකිය යුතුයි.**—(i) අයදුම් පතට කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ නොඇමිණිය යුතුයි.

(ii) ඉල්ලූ අවස්ථාවක ලියකියවිලි ඉදිරිපත් කිරීමට නොහැකි වන අපේක්ෂකයන්ගේ අයදුම්පත් සලකා බලනු නො ලැබේ.

6. රාජ්‍ය සේවයේ නියුක්ත නිලධාරීන් විසින් තම තමන්ගේ ඉල්ලුම් පත්‍ර ස්වකීය දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. එතෙකුදු වුවත්, තම ඉල්ලුම් පත්‍ර එසේ එව්වේ කවදදැයි ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනගන්නට ලැබෙන සේ ඔහු වෙත කෙලින්ම ලියා එවිය යුතුය. ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තමන්ට එවන ලද (බී සලකුණ දරන) මුද්‍රිත තැපැල් පත මේ සඳහා භාවිතා කළ හැකිය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකුගේ නමට පුද්ගලිකව නො එවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වන කොටසේ (II) වන ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරන පත්වීම් සම්බන්ධයෙන් අදළ වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරනු ලැබේ.

9. අයදුම්කරුවන් විසින්, ඉල්ලුම් පත්‍ර පෝර්මය සමඟ තම තමන්ට නිකුත් කරන ලද (''ඒ'' සලකුණ) මුද්‍රිත තැපැල් පත, එහි සඳහන් කොට ඇති පරිදි සම්පූර්ණ කොට ආපසු එවිය යුතුය. එවිට ඉල්ලුම් පත්‍ර පෝර්මය මේ කාර්යාලයට ලැබුණු බව ඔවුන්ට දන්වනු ලැබේ. මේ නියමය නොපිළිපදින අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් ලැබුණු බව ඔවුන්ට දන්වනු නො ලැබේ. මේ නියමය පිළිපදින්නාවූද, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනයේ සිට සති තුනක් ඇතුලත, තම ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක් නො ලැබෙන්නා වූ ද අයදුම්කරුවන් විසින් ඒ බව වහාම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්ට දැනුම් දිය යුතුය. මේ විධානය ඉටු කිරීම පැහැර හැරියහොත්, අයදුම්කරුවෙකු ගැන සලකා බලනු ලැබීම සම්බන්ධයෙන් ඔහුට ඇති අයිතිය අහිමි වේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 නොවැම්බර් මස 5 වන දින,
කොළඹ 1, ගාලු මුවදෙර මහ ලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේදීය.
තැ.පෙ. 500

11—393/3—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

අංකය : ඒබී. 112/එක්ස්. 2305/70.

## වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය

### (සේවක පාලන හා කර්මාන්ත සම්බන්ධතා) අධ්‍යක්ෂ තනතුර

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශයේ (සේවක පාලන හා කර්මාන්ත සම්බන්ධතා) අධ්‍යක්ෂ තනතුර සඳහා අයදුම් පත් කැඳවනු ලැබේ. මීට යාකොට ඇති ආකෘතියේ සකැස්විය යුතු අයදුම් පත් 1970 නොවැම්බර් මස 26 වැනි දිනට පෙර, කොළඹ 1, තැ.පෙ. 500, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් වෙත ලැබෙන සේ එවිය යුතුය.

2. **සේවයේ නියුක්ත කරවීමේ වගන්ති හා සේවා කොන්දේසි.**—මෙම තනතුර තාවකාලිකය. ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත නිලධාරියකු තෝරා ගනු ලැබුවහොත් ඔහු වැඩ බැලීමේ පදනමක් මත පත්කරනු ඇත.

3. **වැටුප් සහ දීමනා.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ වැටුප් පරිමාණය මෙසේය—වර්ෂයකට රු. 20,640—2 × 600—රු.21,840.

**(සංලක්ෂ්‍යය).**—69.10.1 දිනට පෙර පැවති අනුරූප මූලික වැටුප් ක්‍රමය—වර්ෂයකට රු. 17,400—2 × 600—රු.18,600).

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවකුම පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදයක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයයක උපාධිධරයෙකු වීම ;

(ආ) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශරීර සනීපයෙන් යුක්ත බව ;

(ඇ) සේවක පාලනය පිළිබඳව වෘත්තීය සුදුසුකම් හා රජයේ සේවයේ හා/හෝ රාජ්‍ය සංස්ථාවක හා/හෝ වෙළඳ ආයතනයක සේවක පාලනය හා කර්මාන්ත සම්බන්ධතාවය පිළිබඳව අවම වශයෙන් අවුරුදු 5 ක පළපුරුද්ද ලබා තිබීම.

(ඈ) සිංහල භාෂාව පිළිබඳ ඉතාම හොඳ දැනීමක්,

(ඉ) වයස අවුරුදු 30 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි වීම. (රජයේ හෝ සංස්ථාවන්හි දැනට සේවයේ නියුතුවූවන්ට මෙම වයස් සීමාවන් බල නොපාන්නේය.)

5. අයදුම්කරුවන්ගේ සුදුසුකම් පිළිබඳ සහතික ඉදිරිපත් කළයුතු වෙනවා ඇත.

**සංලක්ෂ්‍යය.**— (i) කිසිම ලියවිල්ලක් හෝ එහි පිටපතක් හෝ අයදුම්පතට යා නොකළ යුතුය.

(ii) ලියකියවිලි ඉදිරිපත් කිරීමට අවශ්‍ය වෙන අවස්ථාවේ දී එසේ ඉදිරිපත් කිරීමට අසමත් වන අයදුම්කරුවන්ගේ ඉල්ලුම්පත්‍ර ගැන සලකා නොබලනවා ඇත.

6. අයදුම්පත් රජයේ දෙපාර්තමේන්තු/රාජ්‍ය සංස්ථා ප්‍රධානීන් මාර්ග යෙන් ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, අයදුම්කරුවන් තමන්ගේ ඉල්ලුම් පත්‍ර එවූ දිනය, ඉල්ලුම්පත්‍ර භාරගැනීමේ අන්තිම දිනයේදී හෝ ඊට පෙර හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම් තැනට දැනගන්නට ලැබෙන සේ කෙළින්ම ඔහු වෙත දන්වා යැවිය යුතුය.

7. අයදුම්පත් හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම් තැනට හැර මෙම දෙපාර්තමේන්තුවේ කිසිම නිලධාරියකුගේ නමට පෞද්ගලිකව නොඑවිය යුතුය.

8. මෙම ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරු වලට කරන පත්කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි වලට අවධානය යොමු කරවනු ලැබේ.

එස්. පී. නානායක්කාර,
රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලේකම්.

1970 නොවැම්බර් මස 5 දින,
කොළඹ 1, ගාලුමුවදෙර මහලේකම් ගොඩනැගිල්ලේ,
රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ දී ය.

තැ.පෙ. 500.

අංකය : ඒබී. 112/එක්ස්. 2305/70.

## ආදර්ශ ආකෘතිය

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යාංශය—(සේවක පාලන හා කර්මාන්ත සම්බන්ධතා) අධ්‍යක්ෂ තනතුර

1. නම හා නිල තනතුර :————.
2. ලිපිනය :————.
3. වයස හා උපන් දිනය :————.
4. අධ්‍යාපන සුදුසුකම් :————.
5. සිංහල දැනීම පිළිබඳව සුදුසුකම් :————.
6. සේවක පාලනය පිළිබඳ වෘත්තිය සුදුසුකම් :————.
7. සේවක පාලනය හා කර්මාන්ත සම්බන්ධතාවය පිළිබඳ පළපුරුද්ද : ————.
8. පත්වීම් හා උසස්වීම් දිනයන් සහිතව සේවා සටහන් :————.
9. දැන් ලබන වැටුප හා අන්තිම වේතනාධික දිනය :————.
10. තනතුර සඳහා ඇති වෙනත් විශේෂ සුදුසුකම් හා අයිතිවාසිකම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11—393/4—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

අංකය : විඅා/2/221

## අධ්‍යාපන අමාත්‍යාංශය

### 1971/72 බ්‍රිතාන්‍ය සභා ශිෂ්‍යත්ව

1971 ඔක්තෝබර් මස සිට එක්සත් රාජධානියේ ඉගෙනීම සඳහා බ්‍රිතාන්‍ය සභාව විසින් පිරිනමන ශිෂ්‍යත්ව සඳහා අයදුම්පත් කැඳවනු ලැබේ. ශිෂ්‍යත්ව පිරිනැමෙනුයේ පහත සඳහන් විෂයයන්හි අධ්‍යයන සඳහායි :—

(අ) විදේශීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීම—ශිෂ්‍යත්ව 2

(ආ) භාෂා පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාව—ශිෂ්‍යත්ව 1

ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු ආපසු පැමිණ මෙරට ජීවයට සැලකිය යුතු සේවයක් ඉටු කරනු ඇතැයි බලාපොරොත්තු විය හැකි මනා බුද්ධිමතුන් සඳහා මේ ශිෂ්‍යත්ව අදහස් කෙරේ.

2. **ශිෂ්‍යත්ව කාලය.**—ශිෂ්‍යත්ව කාලය සාමාන්‍යයෙන් මාස 10ක් පමණ වන්නේය.

එහෙත්, අයථා හැසිරීම, අක්‍රමවත් පැමිණීම, බලධාරීන්ගේ අවසරය රහිතව විද්‍යාලයට හෝ ශිෂ්‍ය නිවාසයට නොපැමිණ සිටීම, ඉගෙනීමේ දියුණුවක් නොදක්වීම හෝ විභාගවලින් සමත් විය නොහැකි වීම නිසා හෝ බ්‍රිතාන්‍ය බලධාරීන්ගේ අභිමතය පරිදි ශිෂ්‍යත්ව කාලය තුළ ඕනෑම අවස්ථා වක ශිෂ්‍යත්වය අවසන් කරනු ලැබීමට පුළුවන. එවැනි අවස්ථාවකදී ශිෂ්‍යත්වධාරියාට තමාගේම වියදමින් ලංකාවට ආපසු පැමිණීමට නියෝග කිරීමට ඉඩ ඇත්තේය.

3. **සුදුසුකම්.**—අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් ලබා සිටිය යුතු යි :—

(i) ලංකාවේ පුරවැසියන් විය යුතු යි.

(ii) 1971.10.1 වැනි දිනට, වයස අවුරුදු 25 හා 35 අතර විය යුතුයි. (පළපුරුද්ද හෝ තත්ත්වය හෝ අනුව විශිෂ්ට ලෙස සුදුසු යයි සැලකිය හැකි අයදුම්කරුවන් සම්බන්ධයෙන් ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශිෂ්‍යත්ව සඳහා පමණක් උපරිම වයස් සීමාව අවුරුදු 40 දක්වා දීර්ඝ කිරීමට ඉඩ ඇත.)

(iii) ඉංග්‍රීසි (කථා කිරීම හා ලිවීම දෙකම) පිළිබඳ උසස් ප්‍රවීණත්වයක් තිබිය යුතුයි.

(iv) (අ) අයදුම්කරන්නේ ඉංග්‍රීසි ඉගැන්වීම පිළිබඳ ශිෂ්‍යත්ව සඳහා නම්—ඉහත (i), (ii) හා (iii) යටතේ නියමිත සුදුසුකම්වලට අමතරව, පහත සඳහන් ශ්‍රේණීන්ගෙන් එකකට අයත් විය යුතුයි :—

(1) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී හෝ ලන්ඩන්/ලංකා කලා මධ්‍යම විභාගයේ දී හෝ ඊට උසස් විභාගයකදී හෝ ඉංග්‍රීසි විෂයයෙන් සමත් වී ඇත්තාවූ ද, 1971.10.1 දින වන විට යටත් පිරිසෙයින් අවුරුදු 3ක පාඨමාලා පරීක්ෂක සේවයේ හෝ ගුරු වෘත්තියේ හෝ පළපුරුද්ද ඇත්තාවූ ද ප්‍රධාන අධ්‍යාපන නිලධාරීන්, අධ්‍යාපන උපදේශකයින් හෝ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරීන් හෝ,

(2) ගුරු විද්‍යාලවල ඉංග්‍රීසි ඉගැන්වීමෙහි නියුක්තව සිටින (අ) විශේෂඥ (ඉංග්‍රීසි) පුහුණු හෝ ද්විතීය (සාමාන්‍ය පාඨමාලා) පුහුණු කථිකාචාර්යවරුන් සහ අභ්‍යාසාචාර්යවරුන් හෝ (ආ) අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී හෝ ලන්ඩන්/ලංකා කලා මධ්‍යම විභාගයේදී හෝ ඊට උසස් වෙනත් විභාගයකදී ඉංග්‍රීසි විෂයයෙන් සමත් උපාධිධර, කථිකාචාර්යවරුන් සහ අභ්‍යාසාචාර්යවරුන්, 1971.10.1 වන විට ගුරු වෘත්තියේ අවුරුදු 3ක පළපුරුද්දක් ද තිබිය යුතුය. හෝ,

(3) 1971.10.1 වැනි දින වන විට යටත් පිරිසෙයින් අවුරුදු 3ක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇත්තාවූ ද දැනට සතියකට පැය 10 කට නොඅඩුව ද්විතීය භාෂාවක් ලෙස ඉංග්‍රීසි ඉගැන්වීමේ නියුක්තව සිටින්නා වූ ද ඉංග්‍රීසි විෂයයක් ලෙස උපාධියක් ඇත්තාවූ ද උපාධිධර ගුරුවරුන් විය යුතුයි.

(ආ) අයදුම්කරන්නේ භාෂා පිළිබඳ පශ්චාත් උපාධි පාඨමාලාවක් සඳහා නම්—

ඉහත (i), (ii) හා (iii) යටතේ නියමිත සුදුසුකම්වලට අමතරව, ඉංග්‍රීසි භාෂාව පිළිබඳ විශේෂ උපාධියක් ඇත්තාවූ ද, 1971.10.1 වැනි දින වන විට යටත් පිරිසෙයින් අවුරුදු 3ක විශ්ව විද්‍යාලයක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇත්තාවූ ද කථිකාචාර්යවරුන් විය යුතුයි.

සංලක්ෂය 1.—රජය යටතේ හෝ මණ්ඩලයක, සංයුක්ත මණ්ඩලයක, විශ්ව විද්‍යාලයක හෝ රජයෙන් ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනයක නියමිත කාලයක් සේවය කිරීමට ඔප්පුවකින් හෝ ගිවිසුමකින් හෝ බැඳී සිටින අපේක්ෂකයන්, ඒ කාල සීමාවේ සේවය සම්පූර්ණ කොට 1971.10.1 දින වන විට ඔප්පුවෙන් හෝ ගිවිසුමෙන් සම්පූර්ණ වශයෙන් නිදහස් වී ඇත්නම් මිස, මේ ශිෂ්‍යත්ව සඳහා අයදුම් කිරීමට සුදුසු නොවන්නේ ය.

4. **ප්‍රදානයට අයත් ප්‍රතිලාභයන්.**—ශිෂ්‍යත්ව ප්‍රදානයට පහත සඳහන් ප්‍රතිලාභයන් ඇතුළත් ය :—

(අ) එක්සත් රාජධානියට යාම සහ ආපසු පැමිණීම සඳහා ගමන් පහසුකම්

(ආ) පෞද්ගලික යැපීම් දීමනාවක්

(ඉ) පොත් හා උපකරණ සඳහා පවුම් 25ක දීමනාවක්

(ඊ) ඉගැන්වීමේ ගාස්තු

(උ) එක්සත් රාජධානිය තුළ අනුමත කළ ගමන් වියදම්.

සංලක්ෂය.—මේ ශිෂ්‍යත්ව සඳහා තෝරාගනු ලබන රජයේ සේවකයන්ට නිවාඩු දීම, අවස්ථාවට වලංගුව පවත්නා භාණ්ඩාගාර හා දෙපාර්තමේන්තු නීති රීතින්ට යටත් වන්නේ ය.

5. **සම්මුඛ පරීක්ෂණය.**—සුදුසුකම් ලත් අයදුම් කරුවන්, නියමිත ස්ථානයක හා නියමිත වේලාවක කොළඹ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණ යකට පෙනී සිටිය යුතුය. මෙම සම්මුඛ පරීක්ෂණය සම්බන්ධයෙන් ගමන් හෝ වෙනත් වියදම් පිළිබඳ ගාස්තුවක් නොගෙවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණෙන විට තමන්ගේ අධ්‍යාපනික සහතික, උප්පැන්න සහතිකය හා සුදුසුකම් පිළිබඳ වෙනත් ලියවිලිවල මුල් පිටපත් රැගෙන ඒමට සූදානම් වී සිටිය යුතු ය.

6. **ගිවිසුම.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් එක්සත් රාජධානිය බලා පිටත්ව යාමට පෙර—

(අ) අනෙකුත් කරුණු අතර, නියමිත අධ්‍යයන පාඨමාලාව අවංකව හා අනලස්ව හදාරා සතුටුදායක ලෙස එය සම්පූර්ණ කිරීමට හා ශිෂ්‍යත්වය සම්පූර්ණ කිරීමෙන් පසු අවශ්‍ය වුවහොත්, රජය විසින් නියම කරනු ලබන යම්කිසි කාලසීමාවක් තුළ රජය යටතේ සේවය කිරීමට ද,

(ආ) තමාගේ ගිවිසුමේ සඳහන් කොන්දේසි හා නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමට නොහැකි වන අවස්ථාවකදී, ශිෂ්‍යත්වයේ සම්පූර්ණ වටිනාකම (එනම්, සම්පූර්ණ ශිෂ්‍යත්වය සම්බන්ධයෙන් ලංකා රජයට හා ප්‍රදන අධිකාරීන්ට දරන්නට සිදුවූ සියලුම වියදම් හා රජයේ සේවකයෙක් නම්, ඊට අමතරව වේතනය, දීමනා ආදිය ඇතුළු වියදම් ලංකා රජයට ආපසු ගෙවීමට ද,

පොරොන්දු වන ගිවිසුමකට අත්සන් කළ යුතු ය.

7. **වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගනු ලබන අපේක්ෂකයන් එක්සත් රාජධානියේ අධ්‍යයන පාඨමාලාවක් අනුගමනය කිරීමට සුදුසු ශාරීරික හා මානසික යෝග්‍යතාවක් ඇති බවට රජය විසින් පත් කරනු ලබන විශේෂ වෛද්‍ය මණ්ඩලයක් මගින් පැවැත්වෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුයි.

8. රජයේ සේවකයන් සම්බන්ධයෙන්, බලාපොරොත්තු වන පුහුණුව ඔවුන් විසින් දැනට දරන තනතුරෙහි වැඩි වේතනයක් හෝ උසස්වීමක් ලැබීමට සුදුසුකමක් නොවන්නේය. සෙසු අය සම්බන්ධයෙන් ශිෂ්‍යත්වය සම්පූර්ණ කොට ආපසු පැමිණීමෙන් පසු රක්ෂා ලබාදීමට රජය පොරොන්දු නොවන්නේය.

9. මෙම ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි වැරැදි ප්‍රකාශයක් කර ඇති බව තෝරා ගැනීමට කලින් අනාවරණය වුවහොත් අයදුම්කරු එයින් නුසුදුසු බවට පත්වේ. තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුවහොත් ප්‍රදනය අවලංගු කරනු ලැබේ.

10. තෝරාගනු ලැබූ අපේක්ෂකයෙකු තෝරා ගැනීමෙන් පසු නාම යෝජනා කරනු ලැබීම හෝ නාමයෝජනා කිරීමෙන් පසු ප්‍රදනයක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂෙප කළහොත්, අවුරුදු දෙකක කාල පරිච්ඡෙදයක් ගතවන තුරු, අන් කවර ශිෂ්‍යත්ව ප්‍රදනයක් සඳහා හෝ ඔහු සලකා බලනු නොලැබේ.

11. කිසියම් අපේක්ෂකයකු ලංකා අධිකාරීන් විසින් නාමයෝජනා කරනු ලැබීම, ශිෂ්‍යත්ව ප්‍රදනයක් සඳහා තමා පිළිගනු ලැබීමක් ලෙස නොසිතිය යුතු බව පැහැදිලිව අවබෝධ කටයුතු ය. ශිෂ්‍යත්ව ප්‍රදනය කිරීම, සම්පූර්ණයෙන්ම, නාමයෝජනා ඉදිරිපත් කරනු ලබන ප්‍රදන අධිකාරීන්ගේ අභිමතය පරිදිම සිදුවන්නක් හෙයිනි.

12. යම් අපේක්ෂකයකු තෝරාගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපැවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුව හොත්, ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

13. මේ නිවේදනජය් හා අයදුම්පත් ආකෘතියේ සඳහන් අවශ්‍යතාවන් සියල්ල සෑම ආකාරයට සම්පූර්ණ නොකෙරෙන අයදුම් පත් ප්‍රතික්ෂෙප කරනු ලබන්නේය.

14. මේ කාර්යාලයෙන් ලබාගත යුතු විශේෂ ආකෘතියක පිළියෙළ කළ යුතු අයදුම් පත්, 1970.11.26 වැනි දින හෝ ඉන් පෙර ලැබෙන සේ, කොළඹ 2, මැලේ වීදියේ, අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත එවිය යුතු ය. ප්‍රමාද වී ලැබෙන අයදුම් පත් භාරගනු නොලැබේ.

15. සෑම අයදුම් පතක් සම්බන්ධයෙන්ම රුපියල් 10ක මුද්දර ගාස්තුවක් ගෙවිය යුතු වන්නේය. අයදුම්පත් ආකෘතියේ මුල් පිටුවේ ඒ සඳහා වෙන් කොට ඇති කොටුවේ රුපියල් 10ක මුද්දර අලවා ඒ මත අයදුම්කරුගේ අත්සන යෙදීමෙන් අවලංගු කල යුතුය. කවර හේතුවක් නිසාවත් මුද්දර ගාස්තුව ආපසු ගෙවනු නොලැබේ.

16. රජයේ සේවකයින් විසින් එවන අයදුම් පත් සිය දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ද, මණ්ඩල, සංයුක්ත මණ්ඩල, විශ්ව විද්‍යාල හා රජයේ ආධාර හෝ අනුග්‍රහ ලබන වෙනත් එවැනි ආයතනවල සේවකයින් විසින් එවන අයදුම් පත් ඒ ඒ ආයතන ප්‍රධානීන් මගින් ද එවිය යුතු යි. සේවයෙන් ඉල්ලා අස්වීමට සූදානම් වුවද මේ අවශ්‍යතාව සපුරාලිය යුතුය.

17. සියළුම අයදුම් පත් ලැබුණු බව දන්වනු ලැබේ. අයදුම් පත් භාරගනු ලබන අවසාන දින සිට දින 7ක් ඇතුළත අයදුම් පත් ලැබුණු බවට දන්වීමක් නොලදහොත්, ඒබව අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් වෙත වහාම දැනුම් දිය යුතුය. එසේ නොකිරීමේ හේතුවෙන් අයදුම් කරු ගැන සලකා බැලීමට ඇති අයිතිවාසිකම් ඔහුට අහිමි වන්නේය.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්.

1970 නොවැම්බර් මස 5 වැනිද,
කොළඹ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

11–401—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : 1/60/4/ග්‍රා.සේ.

## ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම

කෑගල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා පහත 4 වැනි ඡෙදයේ දක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඇබෑර්තු.—එක් එක් ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ තිබේ යයි ගණන් බලා ඇති ඇබෑර්තු ප්‍රමාණය මෙසේය :—

| ප්‍ර.ආ.නි. කොට්ඨාශය | ඇබෑර්තු ගණන |
|---|---|
| පරණකුරු කෝරලය ... ... | එකයි |
| බෙලිගල් කෝරලය ... ... | දෙකයි |
| කිණිගොඩ කෝරලය ... ... | එකයි |
| ගල්බඩ කෝරලය ... ... | එකයි |
| දෙහිගම්පල් කෝරලය සහ පාත බුලත්ගම ... | දෙකයි |

3. පත්වීම් ලැබීමට සමත්වන අපේක්ෂකයන් පහත 8(iii) (ඒ) ඡෙදයේ දක්වෙන පුහුණුවීම සම්පූර්ණ කළ පසු වර්ෂයකට රු. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රු. 90 වාර්ෂික වැටුප් වැඩිවීම් ලබා වර්ෂයකට රු. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත්කරණු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 3,810 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4. **සුදුසුකම්.**—(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්තවිය යුතුය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය.*

* රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ සියළුම කරුණු සඳහා " ලංකිකයා " යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනුවෙනි.

(iii) ග්‍රාම සේවකයකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා අපේක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුය.

(iv) අපේක්ෂකයන්ට—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන් ගෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය,

හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය, හෝ වාණිජ ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙන් සාමාර්ථයද සම්මාන සාමාර්ථ හතරක්ද සහිතව විෂයයන් හයකින්, දෙකකට නොවැඩි වාර ගණනක දී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය,

හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යායන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම් තිබිය යුතුය.

සටහන.—සිංහල කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාවද, දෙමළ කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාවද ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත්වී සිටිය යුතුය.

(v) 1970.12.14 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවියයුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(vi) (ඒ) ඉල්ලුම් පත්‍ර භාරගැණීමේ අවසාන දිනයට පූර්වයෙහිවූ හය අවුරුද්ද තුළ අපේකෂක්යින් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 3 ක කාලයක් නොකඩවා ස්ථිර ලෙස පදිංචිව සිටි/සිටින අය විය යුතුය. ග්‍රාම සේවකගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් මෙය ඔප්පු කළ යුතුය.

නැතහොත්

(බී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ උපන් අය විය යුතුය. මෙය ඔවුන්ගේ උප්පැන්න සහතිකයේ මාර්ගයෙන් ඔප්පු කළ යුතුය.

නැතහොත්

(සී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තුවන ප්‍රාදේශීය ආදයම් නිළධාරි කොට්ඨාශයේ නො කඩවා අවුරුදු පහකට නොඅඩු කාලයක් අධ්‍යාපනය ලැබූ අය විය යුතුය. මෙය ඔවුන් අධ්‍යාපනය ලැබූ පාඨශාලාවල ප්‍රධානාචාර්යවරුන්ගේ සහතික මගින් ඔප්පු කළ යුතුය. තම මව්පියන් රජයේ හෝ සංස්ථාවල මාරුවීම් සහිත සේවයකට අයත් අයදුම් කරුවන්ට තම ස්ථිර පදිංචිය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය තෝරා ගැනීමට ඉඩ දෙනු ලැබේ.

5. **තේරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ උසස් විභාග හෝ සඳහා අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි උඩ පහත 6 වැනි ඡෙදයේ දක්වෙන ප්‍රමාණ

කිරිමේ ක්‍රමය අනුව ලබන ලකුණු සහ පහත 7 වැනි ඡේදයේ දැක්වෙන සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණු සලකා පත්වීම් දීම සඳහා අපේක්ෂකයන් තෝරාගනු ලැබේ.

6. **ප්‍රමාණ කිරිමෙ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයේදී හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතික පත්‍රයේදී අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි සඳහා පහත සඳහන් පරිදි ලකුණු දෙනු ලැබේ :—

ඩී—විශිෂ්ඨ සාමාර්ථය—ලකුණු ... 75

සී—සම්මාන සාමාර්ථය—ලකුණු ... 50

එස්—සාමාන්‍ය සාමාර්ථය—ලකුණු 40

විෂයයන් 6 කට වැඩි ගණනකට පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම් කරුවකු විසින් විෂයයන් 6 කට පමණක් පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකුට වඩා වැඩි ලකුණු ලබා වැඩි වාසියක් අත්පත්කර ගැනීමෙ ඉඩකඩ වැළැක්වීම පිණිස මුළු ලකුණු ප්‍රමාණය ගණන් බැලීම සඳහා, සැළකිල්ලට භාජනය කරන්නේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කෙරෙන විෂයයන් 6 පමණි. (අ.පො.ස. උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරක් සමත්වී ඇති අපේක්ෂකයෙක් අමතර ලකුණු 30 ක් ලබාගැනීමට සුදුස්සකු වෙයි. කෙසේ වෙතත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරකට අඩුවෙන් සමත්වී ඇති අයට සහ එම විභාගයේදී සම්මාන සාමාර්ථය සහ විශිෂ්ඨ සාමාර්ථය ලබා ඇති අයට ඒ සඳහා අමතර ලකුණු ලැබෙන්නේ නැත. ශාස්ත්‍රවේදී හෝ ඊට උසස් උපාධියක් ඇති අයෙකුට අ.පො.ස. (උසස් පෙළ) සඳහා ලැබෙන ලකුණු 30 ද ඇතුළුව අමතර ලකුණු 70 ක් ලැබේ. උපාධියක් ඇති අපේක්ෂකයන්ට අ.පො.ස. (උසස් පෙළ) සඳහා වෙනම ලකුණු නොලැබේ. එකකට වැඩියෙන් ඇති උපාධි හෝ මෙහි සඳහන් කොට නොමැති වෙනත් අධ්‍යාපනික සුදුසුකම් සඳහා හෝ ලකුණු ලැබෙන්නේ නැත. අපේක්ෂකයන් සිය ඉල්ලුම් පත්‍රවල ඉහත සඳහන් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව තමන්ම නියමිත ලකුණු ප්‍රමාණය සඳහන් කළ යුතුය.

7. **සම්මුඛ පරීක්ෂණය.**—ඉහත සඳහන් ක්‍රමය අනුව ප්‍රමාණ කිරීමෙන් එක් එක් අපේක්ෂකයාට ලැබෙන මුළු ලකුණු ගණන දැනගත් පසු මෙම කාර්යාලයේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයන් සීමාසහිත ප්‍රමාණයක් කැඳවනු ඇත. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය ඊට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයන්ට පුද්ගලිකව දැනුම් දෙනු ලැබේ. මෙහි පහත සඳහන් 10 (iii) දරණ ඡේදයේ දැක්වෙන සහතිකවල මුල් සහතික මෙම සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ ග්‍රාම සේවක සේවයට අපේක්ෂකයා සුදුසු දැයි විමසා බැලීමයි. ගම හා එහි ශුභ සාධනය සම්බන්ධයෙන් ඔහුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙහිදී ප්‍රශ්න අසනු ලැබේ.

8. **සේවා කොන්දේසි.**—(i) රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදය ආරම්භයේදී දක්වා ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් කිරීමේදී බලපාන පොදු කොන්දේසිවලට අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ii) මෙම තනතුරු ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය භාෂා පනතේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු නම් :—

(ඒ) ඔහුගේ ආධුනික සේවා කාලය අවුරුදු තුනක් වේ.

(බී) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධි විධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත් මතුවට පැනවිය ලැබිය හැක්කාවූත් යම් යම් නීති රීතිවලට හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

(සී) ඔහුගේ ආධුනික සේවා කාලය තුලදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(ඩී) ආධුනික සේවා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත පිළිවෙලින් i වැනි ii වැනි සහ iii වැනි ශ්‍රේණිවල සිංහල ප්‍රවීනතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. (නොඑසේ නම්, අදාලවන අවස්ථාවල i වැනි හා ii වැනි ශ්‍රේණිවල පරීක්ෂණවලින් පිළිවෙලින් අවුරුද්දක් සහ අවුරුදු දෙකක්ඇතුලත සමත්වීම උඩ රඳා පවතී.) නියමිත කාලසීමා තුළදී නියමිත පරීක්ෂණවලින් සමත් නොවුවහොත් එය වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතු වේ. නියමිත කාලයෙන් පසු තවත් හය මාසයක් ගතවන්නට පෙර පරීක්ෂණවලින් සමත් නොවුවහොත් අත්හිටවූ වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කොට පරීක්ෂණය සමත් වන තෙක් හෝ මෙහි පහත (iii) (ඊ) හි ඇති විධිවිධාන අදාලවන කාලය තෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මක වනු ඇත.

(ඊ) ආධුනික සේවා කාලය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීනතාව ලබා නොගතහොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසිවල නියමයන් අදල වනු ඇත.

සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලබන්නන්ට ඉහත (සී), (ඩී) සහ (ඊ) යන කොන්දේසි අදල නොවේ.

(එෆ්) ග්‍රාම සේවකවරුන් ලෙස පත්කරණු ලබන අපේක්ෂයෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ කුමණ ග්‍රාම සේවක කොට්ඨාශයක හෝ සේවය ස්ථානයට බැඳී සිටිති.

(ජී) තම තනතුරට අයත් රාජකාරි කටයුතු පිළිබඳ පුහුණුවක් පත්වීම් ලබන සියළුම අපේක්ෂකයන් විසින් ලැබිය යුතුය.

ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරණු ලබන්නේ සතුටුදායක ලෙස පුහුණුවීමක් ලබා ඇති බවටත්, ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරනු ලැබීමට සෑමඅතින්ම සුදුසුකම් තිබෙන බවටත් පරිපාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සහතික කළොත් පමණි.

බඳවා ගැනීමේ ආරම්භයේදීම අපේක්ෂකයන් විසින් ලැබිය යුතු මෙම පුහුණුව මාස තුනක කාලයකට වැඩි නොවනු ඇත. එම කාළය තුලදී පුහුණුවන්නන්ට මසකට රු. 50 ක දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවීමේ කාළයතුලදී අපේක්ෂකයෝ නිවාඩු වරප්‍රසාද වලට හිමි නොවෙති.

(එච්) පුහුණුව අවසානයේදී ග්‍රාම සේවකයකු අවුරුදු තුනක කාළයක් සේවය කරන තුරු හා ඔහුගේ පත්වීම ස්ථිර කිරීම මැනවයි, ආණ්ඩුවේ ඒජන්ත සෑහීමකට පත්වනතුරු ඔහුගේ පත්වීම ස්ථිර කරනු නොලැබේ.

9. **ඉල්ලුම් පත්‍ර.**—(i) මෙම කච්චේරියෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කාර්යාල වලින් ඉල්ලුම් පත්‍ර පෝර්ම ලබාගත හැක. ඉහත 4 (iv) ඡේදයේ දැක්වෙන සුදුසුකම් ලැබීමේ විභාගය සමත් භාෂාව සහ සිංහල යන මාධ්‍ය දෙකෙන් කමන් කැමති මාධ්‍යයකින් ඉල්ලුම් පත්‍රය තමන්ගේ අත් අකුරින්ම අපේක්ෂකයන් විසින් පිරවිය යුතුය.

නියමිත ඉල්ලුම් පත්‍ර පෝර්මය කිසියම් අයුරකින් වෙනස් කිරීම තහනම්ය. නියමිත පෝර්මයේ නොඑවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂෙප කරනු ලැබේ.

(ii) 1970.12.14 දිනට පෙර කෑගල්ල කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙන සේ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍රද නියමිත දිනට පෙර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙනසේ කෙලින්ම එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයේ පිටපතක් තම දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ මාර්ගයෙන්ද එවිය යුතුය.

(iii) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්ත හෝ කච්චේරියේ වෙනත් නිළධාරියකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

10. **සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) ඉල්ලුම් පත්‍රය සමඟ කිසිම, ලියකියවිල්ලක් නොඑවිය යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ ඒ ඒ කොටුවල ඉල්ලා ඇති අවශ්‍ය විස්තර සඳහන් කළ යුතුය. මෙම සෑම අතින් සම්පූර්ණ නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩතිබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට තේරෙන අපේක්ෂකයන් විසින් තමන්ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතුවේ. එම ලියකියවිලි ඉදිරිපත් කරණ ලෙස එම අපේක්ෂකයන්ට දැනුම් දුන්නොත් එවිට ඒවා ඉදිරිපත් කිරීමට ඔවුහු සූදනමින් සිටිය යුත්තාහ.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වනු ඇත :—

(ඒ) චරිත සහතිකයක්.

**සටහන.**—කිසියම් අපේක්ෂකයකු දැනුදු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක ඉගෙනුම ලබන්නෙහි නම් හෝ පාඨශාලා වෙන් අස්වූයේ මෑතකදී නම් හෝ ඔහු තම චරිතය පිළිබඳ සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා ගෙනි. නොඑසේ නම්, එය සමාදාන විනිශ්චයකරුවකු, අධි නීතිඥවරයකු, නීතිඥවරයකු හෝ නොතාරිස්වරයකු ප්‍රාදේශීය ආදායම් නිළධාරියකු හෝ වර්ෂයකට ඒකාබද්ධ වැටුප රු. 4,800 හෝ ඊට වැඩි ස්ථිර රජයේ නිළධාරියකු යන අයගෙන් හෝ කිසියම් නම් දරණ එමෙන්ම අපේක්ෂකයා පිළිබඳව ලෙහෙසියෙන් විමසීම් කර බැලීමට හැකි තැනැත්තකු ගෙන් ලබාගෙන ඉදිරිපත් කළ හැක. නිකුත් කරණ තැනැත්තා ගේ නම, තනතුර සහ ලිපිනය චරිත සහතිකයේ පැහැදිලිව සඳහන්වී තිබියයුතු වේ.

දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් විසින්, තමන්ගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවටත් තමන් පත්කිරීම සඳහා තෝරාගනු ලැබුවොත් ඒ සඳහා මුදහැරීමට හැකි බවටත් තමන් සේවය කරණ දෙපාර්තමේන්තු ප්‍රධානියා ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ සහතිකයක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් වයස පිළිබඳව නිකුත් කරණු ලැබ ඇති විශේෂ සහතිකයන් (උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයන් වෙනුවෙනි). අනුමාන වයස පිළිබඳව සහතිකයක් පමණක් ඉදිරිපත් කළ හැකි කිසියම් අපේක්ෂකයකුගේ උපන් දිනය එම සහතිකයේ දක්වා ඇති උපන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙස සළකනු ලැබේ.

**සටහන.**—(i) පාසැල් හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කර ඇති විශේෂ උප්පැන්න සහතිකයක් හෝ උප්පැන්න ලියා පදිංචිකිරීමේ සටහනින් උපුටාගත් සහතික කළ උධෘතයක් භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශක වශයෙන් දිවුරුම් පෙත්සම් හෝ බෞතිස්ම සහතික භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශක වශයෙන් දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයේ දැක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන නමින්/නම්වලින් වෙනස් වේ නම්, අපේක්ෂකයාට අදාළ වන පරිදි 27 හෝ 28 වගන්තිය (110 පරිච්ඡේදය) යටතේ උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම පිණිස වහාම ක්‍රියා කළ යුතුය.

රජයේ ස්ථිර තනතුරු උසුලන, අංක 394 සහ 1957 අගෝස්තු 18 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව තම නම් වෙනස්කර ඇති අපේක්ෂකයන් උප්පැන්නය ලියා පදිංචි කිරීමේ සටහනේ ඇති තමන්ගේ නම් සංශෝධනය කිරීම පිණිස ක්‍රියා කිරීමට අවශ්‍ය නැත.

(ඍ) ලාංකික පුරවැසියකු වශයෙන් ලියා පදිංචි කළ සහතිකය හෝ පරම්පරාවෙන් පුරවැසියකු බව පිළිගත් බවට නිකුත් කර ඇති මුල් රාජකාරි ලිපිය (අදාල වූ විට).

(ඎ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ සහතිකය නිකුත් කර නොමැති විටකදී, වෙනත් අධ්‍යාපනික ලිය කියවිලි උදා: ලංකා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පෞද්ගලික අයදුම්කරුවන් වෙත නිකුත් කර ඇති ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂකයාගේ පාසැල් ප්‍රධානියා නිකුත් කළ මුල් ලිපිය.

(ඏ) ඉහත 4 (vi) යටතේ සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි වශයෙන් සහතික.

(iv) ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාව වන විට අවශ්‍ය සියළුම ලිය කියවිලි සූදානමින් තබාගන්නා ලෙස අපේක්ෂකයන් වෙත උපදෙස් දෙනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**11. අසත්‍ය විස්තර සැපයීමට දඬුවම්.**—මෙම නිවේදනයේ දැක්වෙන රෙගුලාසිවලට අනුව අපේක්ෂකයකු නුසුදුසු යයි ඔප්පුවුව හොත් ඔහු මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ තෝරාගත් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවලංගු කිරීමට භාජනය විය හැකිය.

අපේක්ෂකයන් විසින් සපයා ඇති කිසියම් තොරතුරක් ඔහු දන්නා පරිදි අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ කිසියම් වැදගත් කරුණක් හිතාමතාම යටපත් කළ හොත් හෝ සේවයේ යෙදී සිටින කාලය තුළ ඕනෑම අවස්ථාවක දී ඔහු ඉල්ලුම් කිරීමට නුසුදුස් සකුව සිටි බව ඔප්පුවුවහොත් වහාම සේවයෙන් පහකිරීමට හෝ සේවය නතර කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයෙහි දක්වා ඇති නියමයන් දැඩිලෙස නොපිළිපදින අපේක්ෂකයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

**12. වෛද්‍ය පරීක්ෂණය.**—පත්කරනු ලැබීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරිකව සුදුසු බවට සහතික කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අපේක්ෂකයන් පුහුණුව සඳහා තෝරාගනු නොලැබේ.

13. මෙම රෙගුලාසිවලට ඇතුළත් නොවන ඕනෑම කාරණයක් පිළිබඳව තීරණයක් ගැනීම ආණ්ඩුවේ ඒජන්තවරයාගේ අභිමතය පරිදි කෙරෙනු ඇත.

පී. ජී. පුංචිහේවා,
පුත්තලම දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

70. 10. 31 වැනි දින,
පුත්තලම කච්චේරියේ දීය.

11–293—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ සහ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ලේකම් තනතුර

ලංකා ජාතික පුස්තකාල සේවා අධ්‍යක්ෂ සහ ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ ලේකම් තනතුර සඳහා අයදුම් පත් මෙයින් කැඳවනු ලැබේ.

**2. සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙක්ම පහත සඳහන් සුදුසුකම් තමාට තිබෙන බව ඔප්පු කළ යුතුයි :—

(i) පෙලපාතින් හෝ ලියාපදිංචිවීමෙන් ලාංකිකයෙකු බව.
(ii) යහපත් චරිතයක් හා මනා ශරීර සෞඛ්‍යයෙන් යුක්ත බව.
(iii) 1970.11.30 වෙනි දිනට වයස අවුරුදු 35 ට නොඅඩු බව.
(iv) පහත සඳහන් අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම් තිබෙන බව :—

(අ) පුස්තකාල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හෝ පුස්තකාල විද්‍යාව පිළිබඳ ලන්ඩන් ඩිප්ලෝමා උපාධිය හෝ ඊට සමාන හෝ උසස් සුදුසුකම් : සහ

(ආ) පිළිගත් විශ්ව විද්‍යාලයක 1 වෙනි පන්තිය හෝ 2 වෙනි පන්තිය (උසස්) ශාස්ත්‍රවේදී උපාධිය ; හෝ,
පිළිගත් විශ්ව විද්‍යාලයක ශාස්ත්‍රවේදී උපාධිය සහිත ඉහත "අ" කොටසෙහි සඳහන් සුදුසුකම්වලට අමතරව තවත් පශ්චාත් උපාධි සුදුසුකමක් හෝ පිළිගත් පුස්තකාල සංගමයක අධි ශිෂ්‍යත්ව සාමාජිකත්වයක් දැරීම හෝ පුස්තකාල විද්‍යාව පිළිබඳ වැදගත් වෘත්තීය ප්‍රකාශන සැළකිය යුතු ප්‍රමාණයක් ප්‍රසිද්ධ කර තිබීම ; සහ

(ඉ) වෘත්තීය සුදුසුකම් ලබාගත් පසු, පිළිගත් ආයතනයක පුස්තකාල කටයුතු පිළිබඳව යටත් පිරිසෙයින්, අවුරුදු 7 ක පළපුරුද්දක් තිබීම.

**3. වැටුප්.**—මෙම තනතුරට හිමි ඒකාබද්ධ මාසික වැටුප් ක්‍රමය රු. 1,750—10 × 50—රු. 2,250 කි.

**4. සේවා කොන්දේසි.**—(i) මෙම තනතුර ස්ථිරය. තෝරාගත් අපේක්ෂකයා මණ්ඩලයේ රෙගුලාසි වලට අනුකූලව අර්ථ සාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුසුකම් ලබා ඇත.

(ii) මෙම පත්වීම ප්‍රථම අවස්ථාවේදී අවුරුදු 3 ප්‍රවාසන කාලයකට යටත් වේ.

(iii) තෝරාගත් අයදුම්කරු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ නියමයන් හා රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු වස් දැනට පවත්නා නීති හා අනාගතයේදී පනවනු ලබන රෙගුලාසි වලටද අනුකූලව ක්‍රියා කළ යුතුය. ප්‍රවාසන කාලය අවසන්වීමෙන් පසු පත්වීම ස්ථිර කිරීමට, වෙනත් කරුණු අතර, රාජ්‍ය භාෂා අවශ්‍යතාවයන් සපුරාලීම මත රඳා පවතී.

(iv) මණ්ඩලය මගින් සකස් කර ඇති හෝ මතුවට සකස් කරනු ලබන නීති රීති වලට තෝරාගත් අයදුම්කරු යටත් විය යුතුය.

(v) මණ්ඩලය මගින් තීරණය කරනු ලබන ගණනයන් හා ආකාරයන් අනුව ඇප මුදලක් සැපයීමට තෝරාගත් අයදුම්කරු බැඳී ඇත.

**5. රජයේ හා සංයුක්ත මණ්ඩලවල සේවයේ නියුතු නිළධාරින්ගේ ඉල්ලුම්පත්.**—රජයේ හෝ සංයුක්ත මණ්ඩලවල දැනට සේවයෙහි යෙදී සිටින නිළධාරීන්ගේ ඉල්ලුම් පත් අංක 666 හා 1963 අගෝස්තු 20 වෙනි දින දරණ භාණ්ඩාගාර චක්‍ර ලේඛයට අනුවම සලකා බලනු ඇත. එවැනි ඉල්ලුම්කරුවන්ගේ ඉල්ලුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තුවේ/සංයුක්ත මණ්ඩලයේ ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.

**6. වෛද්‍ය පරීක්ෂණය.**—තෝරාගත් අයදුම්කරු ඔහුගේ/ඇගේ ශාරීරික සෞඛ්‍ය තත්ත්වය පිළිබඳව පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකින් සමර්ථ විය යුතුය.

7. ඉල්ලුම් පත් ලැබුන බව ඉල්ලුම්කරුවන් වෙත දන්වනු නොලැබේ.

8. ඉල්ලුම් පතෙහි සඳහන් යම්කිසි ප්‍රකාශයක් අසත්‍ය බව තෝරා ගැනීමට පෙර හෙළිවුවහොත්, ඉල්ලුම්කරු නුසුදුස්සෙකු විය හැකි වන අතර, තෝරා ගැනීමෙන් පසු එවැනි අසත්‍ය ප්‍රකාශයක් හෙළිවුවහොත්, ඔහුගේ පත්වීම අවලංගු කිරීමට සිදුවනු ඇත.

9. යම් අපේක්ෂකයෙකු තෝරා ගැනීම සම්බන්ධයෙන් කවර අන්දමකින් හෝ අයථා අනුග්‍රහයක් ලබා ගැනීමට හෝ බලපෑවැත්වීමකට හෝ උත්සාහයක් දරනු ලැබුවහොත් ඒ හේතුවෙන්ම එම අපේක්ෂකයා නුසුදුසු බවට පත් වන්නේය.

10. ඉල්ලුම් පත් සඳහා නියමිත ආකෘතිපත් සපයනු නො ලැබේ. අධ්‍යාපන හා වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද, වයස, සිංහල ප්‍රවීණතාවය ආදී සම්පූර්ණ විස්තර අඩංගු ඉල්ලුම් පත්, මෑත දී ලබාගත් චරිත සහතික දෙකක පිටපත් ද, උප්පැන්න සහතිකය හා පළපුරුද්ද සම්බන්ධයෙන් සහතික පිටපත් ද සමග ලියා පදිංචි තැපෑලෙන් කොළඹ 3, වෙල්සි උද්‍යානය, අංක 10 දරණ ස්ථානයෙහි පිහිටි ලංකා පුස්තකාලීය සේවා මණ්ඩලයේ සභාපති වෙත, 1970 නොවැම්බර් මස 30 වෙනි දිනට හෝ ඊට පෙර ලැබෙන්නට සැලැස්විය යුතුය.

**11. විදේශීය ඉල්ලුම් පත්.—විදේශීය අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත් සඳහා අවසාන දිනය 1970 දෙසැම්බර් මස 7 වෙනි දින වේ.**

විදේශීය ඉල්ලුම්පත් ලියාපදිංචි සීඝ්‍රගාමී ගුවන් තැපෑලෙන් 1970 දෙසැම්බර් මස 7 වෙනි දින හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට ලැබෙන්නට සැලැස්විය යුතුය.

සභාපති,
ලංකා ජාතික පුස්තකාල සේවා මණ්ඩලය.

1970 නොවැම්බර් මස 5 දින,
10, වෙල්සි උද්‍යානය,
කොළඹ 3.

11–417—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## වවුනියා දිස්ත්‍රික්කයේ නඩුවෙඩිකිකුලම් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ වවුනියා දකුණු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

නඩුවෙඩිකිකුලම් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ සපිර පදිංචියක් ඇත්තාවූ, හෝ එහි කාලයක් පදිංචි වී සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගේ සැලකුම් ලබන, ඉල්ලුම් පත්‍ර භාර ගන්නා දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායඝාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිළධාරි කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වලද ඇතුළත් වේ.

3. සියලුම ඉල්ලුම් පත් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් මස විසිදෙවෙනි (22) දිනට හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඒ. පෙරුමයිනාර්,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් මස 27 වෙනි දින,
වවුනියා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

11–246—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## මඩකලපුව දිස්ත්‍රික්කයේ වෙඩ්ඩිපාලයම් කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ මන්මුණේ දකුණ හා එරුවිල් පෝරතිවූ පත්තු කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

වෙඩ්ඩිපාලයම් උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ සපිර පදිංචියක් ඇත්තා වූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැළකුම් ලබන, ඉල්ලුම් පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම් පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කායඝාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධ රි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන කායඝාල, ග්‍රාමීය උසාවි, තැපැල් කායඝාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කායඝාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම් පත් මෙම කායඝාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් මස 15 දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

වී. බාලසන්දිරන්,
අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 30 දින,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කායඝාලය, මඩකලපුව.

11–247—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## කොළඹ දිස්ත්‍රික්කයේ බියන්විල කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ බටහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය

බියන්විල උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ සපිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසි එකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාළ නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොලවල් සහ සමූපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් මස 11 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

රිචර්ඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1970 නොවැම්බර් මස 1 වැනි දින,
කොළඹ, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

11–330—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය: ඇම් 115 (කු. කෝ).

## කුකුළු කෝරළේ පල්ලේපත්තුවේ දුම්බර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවීම

රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුළු කෝරළයේ, පල්ලේපත්තුවේ, දුම්බර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරයක් සඳහා අයම්දුපත්, 1970 දෙසැම්බර් 16 වැනි දින ප. ව. 12.30 තෙක්, රත්නපුර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ.

**2. අයදුම්පත් භාරගනු ලබන්නේ, කුකුළු කෝරළේ, පල්ලේ පත්තුවේ, දුම්බර හා ගලතුර වසම් තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් පමණකි.**

3. තෝරාගත් අපේක්ෂකයා දුම්බර වසමේ, කැටේපොළ මධ්‍යස්ථානය කොට සේවය කළයුතු වේ.

4. රජයේ, පළාත් පාලන ආයතන හා සංස්ථා සේවකයින්ගෙන් හෝ පළාත් පාලන ආයතනවල නියෝජිතයින්ගෙන් හෝ ඉල්ලුම්පත් භාරගනු නො ලැබේ.

5. වයස අවුරුදු 30 ට අඩු හෝ 60 ට වැඩි අය මේ සඳහා ඉල්ලුම් කිරීමට සුදුස්සෝ නො වෙති.

6. සියළුම අයම්දුපත් පහත දැක්වෙන ආදශී අයදුම්පත අනුව, අයදුම්කරුගේ **අත් අකුරින්ම** පිළියෙල කොට, **ලියාපදිංචි කළ තැපැලෙන්** එවිය යුතුයි. මුද්‍රිත ඉල්ලුම්පත් පෝරම මෙම කායඝාලයේ නොමැති බව සැලකිය යුතුයි.

7. මෙම තනතුර සම්බන්ධයෙන් අයදුම්කරුවන්ට හෝ ඔවුන් වෙනුවෙන් වෙනත් කිසිවෙකුට මා හමු වී සාකච්ඡා කිරීමට ඉඩ දෙනු නො ලැබේ ප්‍රමාද වී ලැබෙන ඉල්ලුම්පත් භාරගනු නොලැබේ.

1970.10.31 වැනි දින,
රත්නපුර දිසාපති කායඝාලයේ දීය.

ඇස්. ජී. සමරසිංහ,
රත්නපුර දිසාපති.

### ආදශී අයදුම්පත

## රත්නපුර දිස්ත්‍රික්කයේ, කුකුළු කෝරළයේ, පල්ලේ පත්තුවේ දුම්බර කොට්ඨාශයේ හදිසි මරණ පරීක්ෂක ධුරය

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————.
2. ලිපිනය :————.
3. පදිංචි ග්‍රාම සේවක වසම :————.
4. පදිංචි ගම හා එය අයත් ගම් සභා කොට්ඨාශය :————.
5. උපන් දිනය :—
6. 70.12.16 දිනට වයස :————.
7. දැනට කරන රක්ෂාව :————.
8. විවාහක/අවිවාහක බව :————.
9. අධ්‍යාපන සුදුසුකම් :————.
10. වෙනත් විශේෂ සුදුසුකම් :————.
11. අයදුම්කරුවන්ට අයත් දේපළ පිළිබඳ විස්තර :————.

(තමාට අයිති දේපළ ආදිය උකසට යට වී ඇත්තේ නම්, ඒ පිළිබඳ විස්තර දැක්වෙන දිවුරුම් පෙත්සමක් ඉදිරිපත් කළ යුතුය.)

————,
අයදුම්කරුගේ අත්සන.

11–248—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## මාතර දිස්ත්‍රික්කයේ දන්කොළුව කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ බටහිර මොරවක් කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

දන්කොළුව උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයෙහි නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්‍යාල, ග්‍රාමසේවක කාර්‍යාල, පළාත් පාලන ආයතන කාර්‍යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්‍යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිඩ වෙළඳ පොලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිඩ ස්ථාන සහ කාර්‍යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුලත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්‍යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් මස 10 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

තිස්ස දේවේන්ද්‍ර,
දිස්ත්‍රික් ලේකම්.

1970 නොවැම්බර් මස 1 වැනි දින,
මාතර, දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දී ය.

11–249—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ රදවාන කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ නැගෙනහිර සියනෑ කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

රදවාන උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත් පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳ පොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් මස 4 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රිචර්ඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1970 ඔක්තෝබර් 30 වැනි දින,
කොළඹ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ දිය.

11–294—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ (මෝදර) කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධූරය

මෝදර ප්‍රදේශය තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිව සිටීම හේතුකොට ගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධූරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධූරය සඳහා ඉදිරිපත් වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාමසේවක කාර්යාල, පළාත්පාලන ආයතන කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජාමණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපොළවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගතහැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් මස 11 වැනි දින හෝ එදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

රිචර්ඩ් ගුණසේකර,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් වෙනුවට.

1970 නොවැම්බර් මස 1 වැනි දින,
කොළඹ, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.

11–390—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම—අම්පාර දිස්ත්‍රික්කය

අම්පාර දිස්ත්‍රික්කයේ ඇති, ග්‍රාම සේවක පුරප්පාඩු සඳහා, නොකඩවා අවුරුදු 3 ක් අම්පාර දිස්ත්‍රික්කය තුළ ස්ථිර පදිංචියක් ඇති, වයස අවුරුදු 21 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි පිරිමි අපේක්ෂකයින්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **සුදුසුකම්.**—අපේක්ෂකයින් ලාංකිකයන් හා යහපත් චරිතය ඇත් යුක්ත විය යුතු අතර, ග්‍රාම සේවකයෙකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා කායික වශයෙන් සුදුසු විය යුතුය.

3. **අධ්‍යාපනික සුදුසුකම්.**—

(අ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථය ද, සම්මාන සාමාර්ථ හතරක් ද සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය හෝ ;

(ආ) සම්මාන සාමාර්ථ හතරක් සහිතව විෂයයන් හයකින් දෙවරකට නොවැඩි වාර ගණනකදී ලබගත් අධ්‍යයන පොදු සහතික පත්‍රය (සාමාන්‍ය පෙළ) සහතිකය හෝ ;

(ඇ) අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්.

4. මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය. රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේදී දක්වා ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් කිරීමේදී බලපාන පොදු කොන්දේසිවලට අපේක්ෂකයින්ගේ අවධානය යොමු කරනු ලැබේ.

5. අම්පාර දිස්ත්‍රික්කයේ ඇති සියළුම ප්‍රා.ආ.නි. කාර්යාලවලින් සහ අම්පාර දිසාපති කාර්යාලයෙන්, 1970.11.15 වැනි දින සිට අයදුම් පත් ලබා ගත හැක. සුදුසු අයදුම්කරුවන් විසින්, සේවය පිළිබඳ තවදුරටත් විස්තර හා කොන්දේසි ඉහත සඳහන් කාර්යාලවලින් ලබාගත හැක. යථා පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත්, 1970.12.15 වැනි දිනට පෙර, අම්පාර කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තැන වෙත ලැබෙනසේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

ආර්. බී. වීරකෝන්,
අම්පාර දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970.11.3 වැනි දින,
අම්පාර දිසාපති කාර්යාලයේ දී ය.

11–333—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ශ්‍රී ලංකා විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය—කැලණිය

පහත සඳහන් තනතුරු සඳහා අයදුම් පත් 1970 නොවැම්බර් 27 දින දක්වා මවිසින් භාරගනු ලැබේ :—

(ඒ) සහකාර කථිකාචාර්ය/කථිකාචාර්ය—ගණිතය භෞතික විද්‍යාව, රසායන විද්‍යාව, උද්භිද විද්‍යාව, සත්ව විද්‍යාව, කර්මාන්ත පරිපාලනය.

(බී) සහකාර කථිකාචාර්ය/කථිකාචාර්ය—අර්ථශාස්ත්‍ර විද්‍යාව, හින්දි, දෙමළ, ඉංග්‍රීසි හා ඉතිහාසය.

(සී) ඉංග්‍රීසි උපදේශක.

අයදුම්කරුවන්ට සිංහලෙන් වැඩ කිරීමේ හැකියාව තිබිය යුතුය.

මතු (ඒ) කොටසේ සඳහන් තනතුරු සඳහා මේ වර්ෂයේ අවසාන විභාගයේ ප්‍රතිඵල බලාපොරොත්තුව සිටින අයටද ඉල්ලුම් කළ හැක. කර්මාන්ත පරිපාලන සහකාර කථිකාචාර්යවරුන් සම්බන්ධව විදුලි ඉංජිනේරු හෝ කාර්මික ඉංජිනේරු හෝ භෞතික විද්‍යා විශේෂ උපාධිධාරීන්ගෙන් අයදුම්පත් භාරගනු ලැබේ. ඉංජිනේරු සුදුසුකම් ඇති අයදුම්කරුවන්ට නියමිත වැටුපට අමතරව වැටුපෙන් 20%ක විශේෂ දීමනාවක් ද ගෙවනු ඇත.

අයදුම්පත් හා අදාළ විස්තර කාර්යාල වේලාවන් හිදී විශ්ව විද්‍යාල කාර්යාලයෙන් ලබාගත හැක. මේ සඳහා තැපැලෙන් කරන ඉල්ලීම් සමග නම සහ ලිපිනය ලියූ 9″×4″ ප්‍රමාණයේ මුද්දර සහිත කවරයක් එවිය යුතුය.

වැඩබලන ලේකම්.

1970 නොවැම්බර් 5 දින.

11-377—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා පහත 4 වැනි ඡේදයේ දක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **ඇබෑර්තු.**—එක් එක් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තිබේයයි ගණන් බලා ඇති ඇබෑර්තු ප්‍රමාණය මෙසේ ය :—

| ප්‍රා.ආ.නි. කොට්ඨාශය | | ඇබෑර්තු ගණන |
|---|---|---|
| සිංහල පත්තුව | ... | එකයි (1) |
| මැද හා එගොඩ පත්තුව | ... | දෙකයි (2) |

3. පත්වීම් ලැබීමට සමත්වන අපේක්ෂකයන් පහත 8 (iii) (ජී) ඡේදයේ දක්වෙන පුහුණුවීම සම්පූර්ණ කළ පසු වර්ෂයකට රු. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රු. 90 වාර්ෂික වැටුප් වැඩිවීම ලබා වර්ෂයකට රු. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත්කරනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 3,810 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4. **සුදුසුකම්.**—(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්ත විය යුතුය ;

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය * ;

* රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ සියළුම කරුණු සඳහා "ලාංකිකයා" යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනුවෙනි.

(iii) ග්‍රාම සේවකයකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා අපේක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුය.

(iv) අපේක්ෂකයන්ට—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක්ද සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ ගණිතය හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂය යන් දෙකෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිතව විෂයයන් හයකින්, දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය, හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්,

තිබිය යුතුය.

**සටහන.**—සිංහල කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂයන් සිංහල භාෂාව ද දෙමළ කථාකරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාව ද ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාග යේ දී හෝ සමත් වී සිටිය යුතුය.

(v) 1970.12.15 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බල පාන්නේ නැත.

(vi) (ඒ) ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පූර්වයෙහි වූ හය අවුරුද්ද තුළ අපේක්ෂකයින් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 3 ක කාලයක් නොකඩවා ස්ථිර ලෙස පදිංචිව සිටි/සිටින අය විය යුතුය. ග්‍රාම සේවකගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් මෙය ඔප්පු කළ යුතුය ; නැතහොත්

(බී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තුවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උපන් අය විය යුතුය. මෙය ඔවුන්ගේ උප්පැන්න සහතික මාගීයෙන් ඔප්පු කළ යුතුය ; නැතහොත්

(සී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නොකඩවා අවුරුදු පහකට නොඅඩු කාලයක් අධ්‍යාපනය ලැබූ අය විය යුතුය. මෙය ඔවුන් අධ්‍යාපනය ලැබූ පාඨශාලාවල ප්‍රධානාචාර්යවරුන්ගේ සහතික මගින් ඔප්පු කළ යුතුය.

තම මව්පියන් රජයේ හෝ සංස්ථාවල මාරුවීම් සහිත සේවයකට අයත් අයදුම් කරුවන්ට තම ස්ථිර පදිංචිය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය තෝරා ගැනීමට ඉඩ දෙනු ලැබේ.

5. **තේරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ උසස් විභාග හෝ සඳහා අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි උඩ පහත 6 වැනි ඡේදයේ දක්වෙන ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබන ලකුණු සහ පහත 7 වැනි ඡේදයේ දක්වෙන සම්මුඛ පරීක්ෂණයේ දී ලබන ලකුණු සලකා පත්වීම් දීම සඳහා අපේක්ෂකයන් තෝරාගනු ලැබේ.

6. **ප්‍රමාණ කිරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයේ දී හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතික පත්‍රයේ දී අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි සඳහා පහත සඳහන් පරිදි ලකුණු දෙනු ලැබේ :—

ඩී—විශිෂ්ඨ සාමාර්ථය—ලකුණු 75

සී—සම්මාන සාමාර්ථය—ලකුණු 50

එස්—සාමාන්‍ය සාමාර්ථය—ලකුණු 40

විෂයයන් 6 කට වැඩි ගණනකට පෙනී සිට ඒවායින් සමත් වූ අයදුම්කරුවකු විසින් විෂයයන් 6 කට පමණක් පෙනී සිට ඒවායින් සමත් වූ අයදුම්කරුවකුට වඩා වැඩි ලකුණු ලබා වැඩි වාසියක් අත්පත් කර ගැනීමේ ඉඩකඩ වැළැක්වීම පිණිස මුළු ලකුණු ප්‍රමාණය ගණන් බැලීම සඳහා සැළකිල්ලට භාජනය කරන්නේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කෙරෙන විෂයයන් 6 පමණි. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් හතරක් සමත් වී ඇති අපේක්ෂකයෙක් අමතර ලකුණු 30 ක් ලබාගැනීමට සුදුස්සකු වෙයි. කෙසේ වෙතත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ දී විෂයයන් හතරකට අඩුවෙන් සමත් වී ඇති අයට සහ එම විභාගයේ දී සම්මාන සාමාර්ථය සහ විශිෂ්ඨ සාමාර්ථය ලබා ඇති අයට ඒ සඳහා අමතර ලකුණු ලැබෙන්නේ නැත. ශාස්ත්‍රවේදී හෝ ඊට උසස් උපාධියක් ඇති අයෙකුට අ.පො.ස. (උසස් පෙළ) සඳහා ලැබෙන ලකුණු 30 ද ඇතුළුව අමතර ලකුණු 70 ක් ලැබේ. උපාධියක් ඇති අපේක්ෂකයන්ට අ.පො.ස. (උසස් පෙළ) සඳහා වෙනම ලකුණු නොලැබේ. එකකට වැඩියෙන් ඇති උපාධි හෝ මෙහි සඳහන් කොට නොමැති වෙනත් අධ්‍යාපනික සුදුසුකම් සඳහා හෝ ලකුණු ලැබෙන්නේ නැත. අපේක්ෂකයන් සිය ඉල්ලුම් පත්‍රවල ඉහත සඳහන් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව තමන්ම නියමිත ලකුණු ප්‍රමාණය සඳහන් කළ යුතුය.

7. **සම්මුඛ පරීක්ෂණය.**—ඉහත සඳහන් ක්‍රමය අනුව ප්‍රමාණ කිරීමෙන් එක් එක් අපේක්ෂකයාට ලැබෙන මුළු ලකුණු ගණන දැනගත් පසු මෙම කාර්යාලයේ දී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයන් සීමාසහිත ප්‍රමාණයක් කැඳවනු ඇත. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය ඊට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයනට පුද්ගලිකව දැනුම් දෙනු ලැබේ. මෙහි පහත සඳහන් 10 (iii) දරන ඡේදයේ දක්වෙන සහතිකවල මුල් සහතික මෙම සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ ග්‍රාම සේවක සේවයට අපේක්ෂකයා සුදුසු දැයි විමසා බැලීමයි. ගම හා එහි ශුභ සාධනය සම්බන්ධයෙන් ඔහුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙහිදී ප්‍රශ්ණ අසනු ලැබේ.

8. **සේවා කොන්දේසි.**—(i) රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ දී දක්වා ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් කිරීමේදී බලපාන පොදු කොන්දේසිවලට අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ii) මෙම තනතුරු ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය භාෂා පනතේ පරමාර්ථ යන් සඳහා රාජ්‍ය සේවයට නව **ප්‍රවේශකයකු නම්—**

(ඒ) ඔහුගේ ආධුනික සේවා කාලය අවුරුදු තුනක් වේ.

(බී) ඔහු 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත් මතුවට පනවනු ලැබිය හැක්කාවූත් යම් යම් නීතිරීතිවලට හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

(සී) ඔහුගේ ආධුනික සේවා කාලය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(ඩී) ආධුනික සේවා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත පිළිවෙලින් I වැනි, II වැනි සහ III වැනි ශ්‍රේණිවල සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. (නොඑසේ නම්, අදාළවන අවස්ථාවල I වැනි හා II වැනි ශ්‍රේණිවල පරීක්ෂණවලින් පිළිවෙලින් අවුරුද්දක් සහ අවුරුදු දෙකක් ඇතුළත සමත්වීම උඩ රඳා පවතී).

නියමිත කාල සීමා තුළදී නියමිත පරීක්ෂණවලින් සමත් නොවුවහොත් එය වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතු වේ. නියමිත කාලයෙන් පසු තවත් හය මාසයක් ගතවන්නට පෙර පරීක්ෂණවලින් සමත් නොවුවහොත් අත්හිටවූ වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කොට පරීක්ෂණය සමත් වන තෙක් හෝ මෙහි පහත (iii) (ඊ) හි ඇති විධි විධාන අදාළ වන කාලය තෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මක වනු ඇත.

(ඊ) ආධුනික සේවා කාලය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීනතාව ලබා නොගත හොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසිවල නියමයන් අදාළ වනු ඇත.

සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලබන්නන්ට ඉහත (සී), (ඩී) සහ (ඊ) යන කොන්දේසි අදාළ නොවේ.

(එෆ්) ග්‍රාමසේවකවරුන් ලෙස පත්කරනු ලබන අපේක්ෂකයෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ කුමන ග්‍රාම සේවක කොට්ඨාශ යක හෝ සේවය කිරීමට බැඳී සිටිති.

(ජී) තම තනතුරට අයත් රාජකාරි කටයුතු පිළිබඳ පුහුණුවක් පත් වීම් ලබන සියළුම අපේක්ෂකයන් විසින් ලැබිය යුතුය.

ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරනු ලබන්නේ සතුටුදායක ලෙස පුහුණුවීමක් ලබා ඇති බවටත් ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරනු ලැබීමට සෑම අතින්ම සුදුසුකම් තිබෙන බවටත් පරිපාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සහතික කළොත් පමණි.

බඳවා ගැනීමේ ආරම්භයේදීම අපේක්ෂකයන් විසින් ලැබිය යුතු මෙම පුහුණුව මාස තුනක කාලයකට වැඩි නො වනු ඇත. එම කාලය තුළදී පුහුණුවන්නන්ට මසකට රු. 50ක දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවීමේ කාලය තුළදී අපේක්ෂකයෝ නිවාඩු වරප්‍රසාද වලට හිමි නොවෙති.

(එච්) පුහුණුව අවසානයේදී ග්‍රාම සේවකයකු අවුරුදු තුනක කාලයක් සේවය කරන තුරු හා ඔහුගේ පත්වීම ස්ථිර කිරීම මැනවයි ආණ්ඩුවේ ඒජන්ත සෑහීමකට පත්වන තුරු ඔහුගේ පත් වීම ස්ථිර කරනු නොලැබේ.

9. **ඉල්ලුම් පත්‍ර.**—(i) මෙම කච්චේරියෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාලවලින් ඉල්ලුම් පත්‍ර පෝර්ම ලබාගත හැක. ඉහත 4 (iv) ඡේදයේ දැක්වෙන සුදුසුකම් ලැබීමේ විභාගය සමත් භාෂාව සහ සිංහල යන මාධ්‍ය දෙකෙන් තමන් කැමති මාධ්‍යයකින් ඉල්ලුම් පත්‍රය තමන්ගේ අත් අකුරින්ම අපේක්ෂකයන් විසින් පිරවිය යුතුය.

නියමිත ඉල්ලුම් පත්‍ර පෝර්මය කිසියම් අයුරකින් වෙනස් කිරීම තහනම්ය. නියමිත පෝර්මයේ නොඑවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) 1970 දෙසැම්බර් 15 දිනට පෙර පොළොන්නරුව කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙන සේ ඉල්ලුම් පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයන් ගේ ඉල්ලුම් පත්‍රද නියමිත දිනට පෙර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙන සේ කෙළින්ම එවිය යුතුය. ඉල්ලුම් පත්‍රයේ පිටපතක් තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන්ද එවිය යුතුය.

(iii) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්ත හෝ කච්චේරියේ වෙනත් නිලධාරියකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

10. **සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) ඉල්ලුම් පත්‍රය සමග කිසිම ලියකියවිල්ලක් නොඑවිය යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ ඒ ඒ කොටුවල ඉල්ලා ඇති අවශ්‍ය විස්තර සඳහන් කළ යුතුය. මෙම සෑම අතින් සම්පූර්ණ නොමැති ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කිරීමට ඉඩ තිබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට තෝරෙන අපේක්ෂකයන් විසින් තමන්ගේ සුදුසුකම් සනාථ කිරීම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතුවේ. එම ලියකියවිලි ඉදිරිපත් කරන ලෙස එම අපේක්ෂක යන්ට දැනුම් දුන්නොත් එවිට ඒවා ඉදිරිපත් කිරීමට ඔවුහු සූදානමින් සිටිය යුත්තාහ.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍ය වනු ඇත :—

(ඒ) චරිත සහතිකයක්.

**සටහන.**—කිසියම් අපේක්ෂකයකු දැනුදු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක ඉගෙනුම ලබන්නෙහි නම් හෝ පාඨශාලාවෙන් අස්වූයේ මෑතකදී නම් හෝ ඔහු තම චරිතය පිළිබඳ සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්යවරයා ගෙනි. නොඑසේ නම්, එය සමාදාන විනිශ්චයකරුවකු, අධිනීතිඥවරයකු, නීතිඥවරයකු හෝ නොතාරිස්වරයකු ප්‍රාදේශීය ආදායම් නිලධාරියකු හෝ වර්ෂ යකට ඒකාබද්ධ වැටුප රු. 4,800 හෝ ඊට වැඩි ස්ථිර රජයේ නිලධාරියකු යන අයගෙන් හෝ කිසියම් නම් දරන එමෙන්ම අපේක්ෂකයා පිළිබඳව ලෙහෙසියෙන් විමසීම් කර බැලීමට හැකි තැනැත්තෙකු ගෙන් ලබාගෙන ඉදිරිපත් කළ හැක. නිකුත් කරන තැනැත්තාගේ නම, තනතුර සහ ලිපිනය චරිත සහතිකයේ පැහැදිලිව සඳහන් වී තිබිය යුතු වේ.

දැනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අපේක්ෂක යන් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් විසින්, තමන්ගේ සේවය සහ හැසිරීම සතුටුදායක බවටත් තමන් පත්කිරීම සඳහා තෝරාගනු ලැබු ‍වොත් ඒ සඳහා මුදාහැරීමට හැකි බවටත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ සහතිකයක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් වයස පිළිබඳව නිකුත් කරනු ලැබ ඇති විශේෂ සහතිකයන් (උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයන් වෙනු වෙනි.) අනුමාන වයස පිළිබඳව සහතිකයක් පමණක් ඉදිරිපත් කළ හැකි කිසියම් අපේක්ෂකයකුගේ උපන් දිනය **එම සහතිකයේ දක්වා ඇති උපන් වර්ෂයේ ජූලි මස 1 වැනි** දින ලෙස සළකනු ලැබේ.

**සටහන.**—(i) පාසැල් හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කර ඇති විශේෂ උප්පැන්න සහතිකයක් හෝ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහනින් උපුටාගත් සහතික කළ උධෘතයක් භාරගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශකු වශයෙන් දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයේ දැක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයෙන් භාවිතා කරන නමින්/නම්වලින් වෙනස් වේ නම්, අපේක්ෂකයාට අදාළ වන පරිදි 27 හෝ 28 වගන්තිය (110 පරිච්ඡේදය) යටතේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම පිණිස වහාම ක්‍රියා කළ යුතුය.

රජයේ ස්ථිර තනතුරු උසුලන, අංක 394 සහ 1957 අගෝස්තු 18 වැනි දින දරන භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව තම නම් වෙනස්කර ඇති අපේක්ෂකයන් උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ ඇති තමන්ගේ නම් සංශෝධනය කිරීම පිණිස ක්‍රියා කිරීමට අවශ්‍ය නැත.

(සී) ලාංකික පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කළ සහතිකය හෝ පරම්පරාවෙන් පුරවැසියකු බව පිළිගත් බවට නිකුත් කර ඇති මුල් රාජකාරි ලිපිය (අදාළ වූ විට).

(ඩී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ සහතිකය නිකුත් කර නොමැති විටකදී, වෙනත් අධ්‍යාපනික ලියකියවිලි, උදා : ලංකා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පෞද්ගලික අයදුම්කරු වන් වෙත නිකුත් කර ඇති ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂක යාගේ පාසැල් ප්‍රධානියා නිකුත් කළ මුල් ලිපි ය.

(ඊ) ඉහත 4 (vi) යටතේ සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි වශයෙන් සහතික.

(iv) ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාව වන විට අවශ්‍ය සියළුම ලියකියවිලි සූදානමින් තබා ගන්නා ලෙස අපේක්ෂකයන් වෙත උපදෙස් දෙනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වුවහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

11. **අසත්‍ය විස්තර සැපයීමට දඬුවම්.**—මෙම නිවේදනයේ දක්වෙන රෙගුලාසිවලට අනුව අපේක්ෂකයකු නුසුදුසු යයි ඔප්පු වුවහොත් ඔහු මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ තෝරාගත් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවලංගු කිරීමට භාජනය විය හැකිය.

අපේක්ෂකයන් විසින් සපයා ඇති කිසියම් තොරතුරක් ඔහු දන්නා පරිදි අසත්‍ය බව ඔප්පු වුවහොත් හෝ කිසියම් වැදගත් කරුණක් හිතාමතාම යටපත් කලහොත් හෝ සේවයේ යෙදී සිටින කාලය තුළ ඕනෑම අවස්ථාවකදී ඔහු ඉල්ලුම් කිරීමට නුසුදුස්සකුව සිටි බව ඔප්පු වුවහොත් වහාම සේවයෙන් පහකිරීමට හෝ සේවය නතර කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයෙහි දක්වා ඇති නියමයන් දැඩි ලෙස නොපිළිපදින අපේක්ෂකයන්ගේ අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත.

12. **වෛද්‍ය පරීක්ෂණය.**—පත්කරනු ලැබීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා ශාරීරිකව සුදුසු බවට සහතික කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අපේක්ෂකයන් පුහුණුව සඳහා තෝරාගනු නොලැබේ.

13. මෙම රෙගුලාසිවලට ඇතුළත් නොවන ඕනෑම කාරණයක් පිළිබඳව තීරණයක් ගැනීම ආණ්ඩුවේ ඒජන්තවරයාගේ අභිමතය පරිදි කෙරෙනු ඇත.

කේ. බී. සූරියගොඩ,
පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 නොවැම්බර් 1 වැනි දින,
පොළොන්නරුව කච්චේරියේදී ය.

11-295—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ඇබෑර්තුවක්—කිරි මණ්ඩලය

කිරි මණ්ඩලීය සේවයේ පහත දැක්වෙන තනතුර සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. ඉල්ලුම් පත් පහත සඳහන් ආකාරයට සකස් කර, 1970. 11. 26 වැනි දින හෝ ඊට ප්‍රථම පහත සඳහන් අය වෙත ලැබෙන්නට සැලැස්විය යුතුය.

**ගණකාධිකාරී—III වැනි ශ්‍රේණිය**

වැටුප.—මසකට රු. 1,000—50×10—රු. 1,500 දක්වා (සියළු දීමනා සහිත)

**සුදුසුකම්.**—පහත සඳහන් කරුණු වෙනුවෙන් සෑම අයදුම්කරුවෙකු වම පිළිගත හැකි සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) 1970.11.26 වැනි දිනට අවුරුදු 45 කට නොවැඩි බව,

(ආ) හොඳ කල්ක්‍රියාවෙන් හා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත බව,

(ඇ) (i) වරලත් ලියාපදිංචි, ඒකාබද්ධ හෝ පිරිවැය හා වැඩ ගණකාධිකාරිවරයෙකු හෝ,

(ii) යටත් පිරිසෙයින් දස අවුරුදු පළපුරුද්දක් ඇති යටත් පිරිසෙයින් ඉන් පස් අවුරුද්දක් වත් වාණිජ ගිණුම් පිළිබඳ පළපුරුද්ද තිබෙන රජයේ ගණකාධිකාරිවරුන්ගේ සේවයේ III වැනි පන්තියේ හෝ ඊට ඉහළ ගණකාධිකාරිවරයෙකු වීම සහ ලංකා ඒකාබද්ධ ගණකාධිකාරිවරුන්ගේ සහ ගණන් පරීක්ෂකවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු වීම හෝ

(iii) ලංකා ඒකාබද්ධ ගණකාධිකාරිවරුන්ගේ සහ ගණන් පරීක්ෂකවරුන්ගේ සංගමයේ සාමාජිකයෙකු වීම හෝ වරලත් ගණකාධිකාරිවරුන්ගේ (ලංකා) මධ්‍යම පරීක්ෂණයෙන් සමත්වූ සහ පිළිගත් වෙළඳ ආයතනයක හෝ රජයේ සංස්ථාවක ගිණුම් විධායකයෙකු වශයෙන් යටත් පිරිසෙයින් පස් අවුරුද්දක පළපුරුද්දක් තිබීම.

2. **සේවා කොන්දේසි.**—

(අ) දැනට රාජ්‍ය සේවයේ සිටින නිලධාරියෙකු මේ සඳහා තෝරාගනු ලැබුවහොත්, පත්වීම භාරගැනීමට මත්තෙන්, රාජ්‍ය සේවයේ සිය තනතුර ඔහු විසින් අත්හල යුතුය. රජයේ අනුමැතිය උඩ රාජ්‍ය සේවයේ ඔහුගේ තනතුර අත්හල හොත් මණ්ඩලයට බැඳුනු අවස්ථාවේදී විශ්‍රාම වැටුප් සංග්‍රහයේ 48 (ඒ) ඡේදය යටතේ ඔහුට හිමිව තිබූ විශ්‍රාම වැටුප් ප්‍රතිලාභ රඳවා ගත හැකිය. රජයේ දෙපාර්තමේන්තුවල හෝ සංයුක්ත මණ්ඩලවල නියුක්ත නිලධාරීන්ගේ ඉල්ලුම් පත් සලකා බලනු ලබන්නේ 1965 අගෝස්තු මස 20 වැනි දින දරණ මහා භාණ්ඩාගාරයේ අංක 666 දරණ චක්‍රලේඛය අනුවයි. මෙකී චක්‍රලේඛය අනුව, සිය නිලධාරියා සේවයෙන් මුදවා හැරිය හැකිදැයි දෙපාර්තමේන්තු හෝ සංයුක්ත මණ්ඩල ප්‍රධානීන් විසින් නිශ්චිත වශයෙන්ම සඳහන් කළ යුතුය.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරු රාජ්‍ය සේවයේ ස්ථිර කරන ලද නිලධාරියෙකු නොවේ නම්, පත්වීම දෙනු ලබන දින සිට තුන් අවුරුද්දක් ගතවන තුරු මෙම තනතුර ස්ථිර නොවේ.

(ඇ) 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට මත් පනවා ඇති සියළුම නීතිරීති හා ව්‍යවස්ථාවලටත්, එකඟව කටයුතු කිරීමේ කොන්දේසියට අයදුම්කරු යටත් විය යුතුය.

(ඈ) 3 අවුරුදු කාලය අවසානයේදී සේවයේ ස්ථිර කිරීම රඳා පවත්නේ, වෙනත් කරුණු අතර, රජයේ භාෂා ප්‍රතිපත්තිය පිළිබඳ අවශ්‍යතාවයන් සපුරාලීම මතය.

3. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—මෙය ස්ථිර තනතුරක් වේ. තෝරාගනු ලබන අයදුම්කරු සේවක අර්ථසාධක අරමුදලේ ප්‍රතිලාභ ලැබීමට සුදුස්සෙකු වේ.

4. **ඇප.**—මුදලින් හෝ විශ්වාස ඇප ආරක්ෂණයකින් රු. 7,500 ක ඇපයක් තැබිය යුතුය.

5. **වෛද්‍ය පරීක්ෂණය.**—රාජකාරි භාරගැනීමට මත්තෙන් තෝරාගනු ලබන අයදුම්කරු රජයේ වෛද්‍ය ආයතනයකදී වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය.

6. අයදුම් පත් සමඟ පහත සඳහන් ලියකියවිලිවල පිටපත් (මුල් පිටපත් නොව) අමුණා එවිය යුතුය :—

(අ) උප්පැන්නය ලියා පදිංචි කළ සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලාවල කාර්යයන් සඳහා නිකුත් කරන වද සහතිකය හෝ භාර නොගන්නා බව සැලකිය යුතුය),

(ආ) ලබාගත් ඉහලම අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික,

(ඇ) චරිත සහතික දෙකක් : මින් එකක් පාසැල් ප්‍රධානියාගෙන්/විද්‍යාලයාධිපතිගෙන් හෝ පෞද්ගලික ආචාර්යවරයෙකුගෙන් හෝ මහාචාර්යවරයෙකුගෙන් විය යුතුය.

(ඈ) කලින් සේවය කළ ආයතනවලදී ඉටුකරන ලද වැඩ හඳුන්වන සහතික.

7. අයදුම් පත් හා ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම කිරි මණ්ඩලයේ සභාපති වෙත හැර, මණ්ඩලීය සේවයේ වෙන කිසිම නිලධාරියෙකුගේ පෞද්ගලික නමට නොඑවිය යුතුය.

8. සියළුම ඉල්ලුම් පත් ලැබුණ බව දන්වනු ලැබේ.

සභාපති,
කිරි මණ්ඩලය.

කිරි මණ්ඩලීය මූලස්ථානය,
33, එලිබෑන්ක් පාර,
කොළඹ 5.

**කිරි මණ්ඩලය**

**ඉල්ලුම් පත්‍රය**

1. තනතුර :————.
2. සම්පූර්ණ නම :————.
3. පෞද්ගලික ලිපිනය :————.
4. අයදුම්කරු උපන් දින හා උපන් ස්ථානය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය.)
5. අයදුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
6. ලබා ඇති උසස්ම අධ්‍යාපනික සුදුසුකම් :————.
   (සහතිකවල පිටපත් ඇමිණිය යුතුය.)
7. සිංහල සහ/හෝ දෙමළ පිළිබඳ ලබා ඇති දැනුම :————.
8. කලින් ලබා ඇති පළපුරුදුකම් පිළිබඳ විස්තර :————.
9. අයදුම්කරුගේ චරිතය ගැන සහතික කළහැකි දෙදෙනෙකුගේ නම් :————.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11-399—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුව

### මාර්ග හා කර්මාන්ත පිළිබඳ ප්‍රධාන ඉංජිනේරු උප-දෙපාර්තමේන්තුවට ආධුනික සැළසුම්කරුවන් (සිවිල්) බඳවා ගැනීම—1970

ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ ආධුනික සැළසුම්කරුවන්ගේ (සිවිල්) තනතුරු සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **වැටුප් පරිමාණයන්.**—(i) ආධුනිකයෙකුගේ ආරම්භක වැටුප වර්ෂයකට රු. 3,090 ක් වේ. පුහුණුවීමේ කාල සීමාව වර්ෂ දෙකක් හෝ අවශ්‍ය පරිදි ඊට වැඩි කාලසීමාවක් වනු ඇත.

(ii) ආධුනික කාලය සතුටුදායක ලෙස සම්පූර්ණ කිරීමෙන් හා නියමිත විභාගයන්ගෙන් සාමාර්ථය ලැබීමෙන් පසුව, ආධුනිකයින් II වැනි පන්තියේ සැළසුම්කරුවන් වශයෙන් පත් කරනු ලැබේ. සැළසුම්කරුවන්ගේ ශ්‍රෙණියේ ඇබෑර්තු නොතිබුණහොත්, II වැනි පන්තියේ සැළසුම්කරුවන්ට අදල වැටුප් පරිමාණයේ, අතිරික්ත සැළසුම්කරුවන් වශයෙන් ඔවුන් සේවයේ රඳවා ගනු ලැබේ.

(iii) සැළසුම්කරුවන්ගේ වැටුප් පරිමාණයන් පහත සඳහන් පරිදි වේ :—

II වැනි පන්තිය—වර්ෂයකට රු. 3,432—144—රු. [illegible],456 යි.
I වැනි පන්තිය—වර්ෂයකට රු. 6,600—180—රු. [illegible],040 යි.
විශේෂ පන්තිය—වර්ෂයකට රු. 8,280—240—රු. 9,240 යි.

එක් ශ්‍රෙණියකින් තවත් ශ්‍රෙණියකට උසස් කිරීම රඳා පවත්නේ, ඇබෑර්තු, ජ්‍යෙෂ්ඨත්වය, යෝග්‍යතාවය හා එවකට පවත්නා බඳවා ගැනීමේ පරිපාටිය අනුවය.

3. **වයස් සීමාව.**—ඉල්ලුම්කරුවන් මනා දේහයකින් යුක්ත අවිවාහක යන් විය යුතු අතර, ඉල්ලුම්පත්‍ර භාර ගනු ලබන අවසාන දිනට වයසින් අවුරුදු 16ට නො අඩුවූත්, අවුරුදු 24ට නොවැඩිවූත් අය විය යුතුය.

4. අධ්‍යාපන හා කාර්මික සුදුසුකම් :—ඉල්ලුම්කරුවන්—

(අ) ශුද්ධ ගණිතය හෝ ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් ; හෝ

(ආ) සිංහල/දෙමළ භාෂාව, ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික), භෞතික විද්‍යාව සහ තවත් විෂයයන් තුනකින් (එනම් විෂයයන් හයකින්) දෙවරකට වැඩි නොවන වාර ගණනකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙල) විභාගයෙන් ; හෝ

(ඇ) ගණිතය (ශුද්ධ හෝ ව්‍යවහාරික) සහ භෞතික විද්‍යාව විෂයයන් වශයෙන් ඇතිව ඉහත සඳහන් විභාගවලට වඩා උසස් විභාගයකින් සාමාර්ථය ලැබ—

ලංකා කාර්මික විද්‍යාලයේ කටුබැද්දේ කාර්මික විද්‍යායතනයේ සැළසුම්කරුවන් සඳහා නියමිත එක් අවුරුදු සම්පූර්ණ පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණකරප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලැබ සිටිය යුතුය.

5. **සේවා කොන්දේසි.**—(i) තෝරා ගනු ලබන ඉල්ලුම්කරුවන් ආධුනික කාලසීමාවකට භාජනය කරනු ලැබේ.

(ii) ආධුනික කාලසීමාව තුලදී ඔවුන් ලංකා කාර්මික විද්‍යාලයේ සවස් වරුවේ පවත්වනු ලබන පන්තිවලට සහභාගිවී (අනිකුත් නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණවලට අමතර වශයෙන්) නියමිත පරීක්ෂණයන්ගෙන් සාමාර්ථය ලැබිය යුතුය.

(iii) තෝරාගනු ලබන ඉල්ලුම්කරුවන්, ආධුනික කාලය සම්පූර්ණකර II වැනි පන්තියේ සැළසුම්කරුවන් වශයෙන් පත්වීම් ලැබීමෙන් පසුව, වර්ෂ 5 ක කාල සීමාවක් ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවය කරණ බවට ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ සාමාන්‍යාධිකාරී සමග ගිවිසුමකට හා බැඳුම්කරයකට අත්සන් තැබිය යුතුය.

(iv) ආධුනිකයකුගේ ගිවිසුම, අසතුටුදායක හැසිරීම නිසා හෝ, පුහුණුවෙන් සතුටුදායක ප්‍රගතියක් නොලබනවා නම් හෝ, දෙපාර්තමේන්තු පරීක්ෂණයන්ගෙන් හා කාර්මික විද්‍යාලයේ පරීක්ෂණයන්ගෙන් අසමත් වුවහොත් හෝ දිගටම පුහුණු කරගෙන යෑම මොනයම් හේතුවක් නිසා හෝ දෙපාර්තමේන්තුවට ඵලදායක නොවනවා නම් හෝ කලින් දැනුම්දීමක් නොදී අවලංගු කළ හැකි ය.

(v) පත්වීම් ලැබීමට ප්‍රථමයෙන්, ආධුනිකයින් දිවයිනේ ඕනෑම ස්ථානයක සේවය කිරීම සඳහා සුදුසු ද නැද්ද යන්න තීරණය කිරීම සඳහා පවත්වනු ලබන අක්ෂි දෘෂ්ඨි පරීක්ෂණයක් ද ඇතුළුව වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය.

6. මරදනේ, ලංකාණ්ඩුවේ දුම්රිය දෙපාර්තමේන්තුවේ, දුම්රිය සාමාන්‍යාධිකාරිගේ කාර්යාලයේදී තේරීම් මණ්ඩලයක් ඉදිරිපිට පෙනී සිටීමට හෝ අවශ්‍යයයි තීරණය කරනු ලබන සම්මුඛ පරීක්ෂණයකට තමන්ගේ වියදමින් පෙනී සිටීමට අපේක්ෂකයන් සූදනමින් සිටිය යුතුය.

7. ඉල්ලුම් පත්‍ර, ඉල්ලුම්කරුවන්ගේම, අත් අකුරින්, මෙහි අග දක්වෙන ආදර්ශ ඉල්ලුම් පත්‍රයට අනුකූලව, උප්පැන්න, අධ්‍යාපන, කාර්මික හා චරිත සහතිකවල පිටපත් ද සහිතව පහත සඳහන් ලිපිනයට 1970 නොවැම්බර් මස 26 වැනි දින, ප. ව. 4.30 ට ප්‍රථම ලැබෙන පරිදි එවිය යුතුය :—

දුම්රිය සාමාන්‍යාධිකාරී,
දුම්රිය සාමාන්‍යාධිකාරිගේ කාර්යාලය,
මරදන, කොළඹ 10.



ඉල්ලුම්කරුවකු විසින් සපයන කරුණුවලින් එකකදු හෝ අසත්‍ය බව පෙනී ගියහොත්, ඔහු පත්වීම් ලදහොත් එම පත්වීම අවලංගු කිරීමට අවකාශ තිබේ.

8. ඉල්ලුම් පත්‍රයක් තැපැලේදී නැතිවූ බවට හෝ ප්‍රමාදවූ බවට කෙරෙන පැමිණිලි ගැන සළකා බැලිය හැකි නොවේ. අවසාන දිනයත් දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභ හානි ඉල්ලුම්කරුවන් විසින්ම විඳ දරාගත යුතුයි.

9. දැනටමත් රජයේ සේවයේ නියුක්ත අයගේ ඉල්ලුම් පත්‍ර භාරගනු ලබන්නේ ඒවා, ඔවුන් සේවය කරන දෙපාර්තමේන්තුවේ ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළහොත් පමණි.

10. ඉල්ලුම්කරුවකු තෝරා පත් කිරීම සඳහා කෙරෙන කොයි අන්දමේ කැමති කරවා ගැනීමක් හෝ බලපෑමක්, ඉල්ලුම්කරුගේ අපේක්ෂකත්වය නිෂ්ප්‍රභා කිරීමට හේතුවනවා ඇත.

11. මෙම ගැසට් පත්‍රයෙහි I වැනි කොටසේ II වැනි ඡේදයෙහි පළකර ඇති රජයේ සේවයේ තනතුරු සඳහා පත්කිරීම්වලට අදල සාමාන්‍ය කොන්දේසි කෙරෙහි අවධානය යොමු කරවනු ලැබේ.

වි. ටී. නවරත්න,
වැඩබලන දුම්රිය සාමාන්‍යාධිකාරී.

දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය,
මරදන, කොළඹ 10.
1970 නොවැම්බර් මස 5 වැනි දින.

### ආදර්ශ ඉල්ලුම් පත්‍රය

#### ආධුනික සැළසුම්කරු තනතුර—(සිවිල්)—1970—ලං. දු. සේ.

1. සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) :————.
2. සම්පූර්ණ තැපැල් ලිපිනය (පැහැදිලි ලොකු අකුරෙන්) :————.
3. ජාතිය :————.
   (අ) පරම්පරාවෙන්ම ලංකා රටවැසියෙක් ද, නැතහොත්
   (ආ) ලියාපදිංචි කිරීමෙන් රටවැසි බව ලද්දෙක් ද යන බව :————.
   පරම්පරාවෙන් ලංකා රටවැසි බව ලද්දෙක් නම් පහත සඳහන් තොරතුරු සැපයිය යුතුය :—
   (අ) ඉල්ලුම්කරු උපන් ස්ථානය :————.
   (ආ) ඉල්ලුම්කරුගේ පියා උපන් ස්ථානය :————.
   (ඇ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මුත්තා උපන් ස්ථානය :————.
   (ඈ) ඉල්ලුම්කරුගේ පිය පාර්ශ්වයේ මීමුත්තා උපන් ස්ථානය : ————.

   ඉල්ලුම්කරු ලංකාවේ ඉපදී ඇත්නම් (අ) කොටසට අමතරව (ආ) කොටස හෝ (ඇ) සහ (ඈ) යන කොටස් දෙකම පුරවා තිබිය යුතුය. ඉල්ලුම්කරු ලංකාවේ ඉපදී ඇත්නම් (අ) කොටසට අමතරව (ආ) සහ (ඇ) යන කොටස් හෝ (ඇ) සහ (ඈ) යන කොටස් පුරවා තිබිය යුතුය.
4. උපන් දිනය :————.
   (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි).
   1970 නොවැම්බර් මස 26 වැනි දිනට වයස :
   අවුරුදු :————, මාස :————., දවස් :————.
5. විවාහක ද, අවිවාහක ද යන වග :————.
6. අධ්‍යාපන සුදුසුකම් :————.
   (විස්තර වශයෙන් සඳහන් කර සහතික පිටපත් ඇමිණිය යුතුයි.)
7. ඔබ කටුබැද්ද කාර්මික විද්‍යායතනයේ එක් අවුරුදු පාඨමාලාව සාර්ථක ලෙස සම්පූර්ණ කර ප්‍රවීණතාවය පිළිබඳ සහතිකයක් ලැබ තිබේ ද ? : ————.
8. දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෙක්ද, නැතහොත් දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෙකුගේ පුත්‍රයෙක් ද යන වග සඳහන් කරන්න : ————.

   දුම්රිය දෙපාර්තමේන්තුවේ සේවකයෙක් නම් පහත දක්වෙන විස්තර සපයන්න :—
   (i) දැනට තමා දරණ තනතුර හා දෙපාර්තමේන්තු අංකයක් ඇතොත් එය :————.
   (ii) දැනට සේවය කරන ස්ථානය :————.
   (iii) පළමුවෙන් පත්වීම් ලැබූ දිනය :————.
9. ලංකාවේ පිහිටි එක්සත් රාජධානියට අයත් ආයතනයන්හි, එනම්, අද්මිරාල්තියෙන් හෝ ගුවන් අමාත්‍යාංශයෙන් මුද හරිනු ලැබූ සේවා වසමට අයත් නොවූ සේවකයෙක් ද, යුද්ධ සිරකරුවෙක් ද, නැතහොත් සේවා මුක්ත භටයෙක් ද යන වග (විස්තර සහිතව ඔප්පු කළ යුතුය.) : ————.

මා දක්වූ තොරතුරු මා දන්නා පමණින් ද, මගේ විශ්වාසයේ හැටියට ද සත්‍ය බව ප්‍රකාශ කර සිටිමි. මෙම තනතුරුවලට බඳවා ගැනීමට අදළ නියමයන් අනුව, මා නුසුදුස්සෙකු බව තීරණය වුවහොත්, මගේ ඉල්ලුම් පත්‍රය අවලංගු වෙන බව ද දනිමි.

————.
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

11–419—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ග්‍රාම සේවක සේවයට බඳවා ගැනීම

බදුල්ල දිස්ත්‍රික්කයේ ග්‍රාම සේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා පහත 4 වැනි ඡේදයේ දැක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. **ඇබෑර්තු.**—ගණන් බලා ඇති ඇබෑර්තු ප්‍රමාණය 7 ක් පමණ වේ.

3. පත්වීම් ලැබීමට සමත්වන අපේක්ෂකයන් පහත 8(iii) (ඒ) ඡේදයේ දැක්වෙන පුහුණුවීම සම්පූර්ණ කළ පසු වර්ෂයකට රු. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රු. 90 වාර්ෂික වැටුප් වැඩිවීම ලබා වර්ෂයකට රු. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත්කරණු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 3,810 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4. **සුදුසුකම්.**—(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්ත විය යුතුය ;

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුය * ;

* රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ සියළුම කරුණු සඳහා "ලාංකිකයා" යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනුවෙනි.

(iii) ග්‍රාම සේවකයකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා අපේක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුය ;

(iv) අපේක්ෂකයන්ට—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ වාණිජ ගණිතය, හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිතව විෂයයන් හයකින්, දෙකකට නොවැඩි වාර ගණනක දී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය, හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්,

තිබිය යුතුය ;

**සටහන.**—සිංහල කථා කරන ග්‍රාම සේවක කොට්ඨාශවල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාව ද දෙමළ කථාකරන ග්‍රාම සේවක කොට්ඨාශ වල ග්‍රාම සේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් දෙමළ භාෂාව ද ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත්වී සිටිය යුතුය.

(v) 1970.12.15 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(vi) (ඒ) ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පූර්වයෙහිවූ හය අවුරුද්ද තුළ අපේක්ෂකයින් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ යටත් පිරිසයෙන් අවුරුදු 3 ක කාලයක් නොකඩවා ස්ථිර ලෙස පදිංචිව සිටි/සිටින අය විය යුතුය. ග්‍රාම සේවක ගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතික යකින් මෙය ඔප්පු කළ යුතුය ; නැතහොත්

(බී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තුවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උපන් අය විය යුතුය. මෙය ඔවුන්ගේ උප්පැන්න සහතික මාර්ගයෙන් ඔප්පු කළ යුතුය ; නැතහොත්

(සී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නොකඩවා අවුරුදු පහකට නොඅඩු කාලයක් අධ්‍යාපනය ලැබූ අය විය යුතුය. මෙය ඔවුන් අධ්‍යාපනය ලැබූ පාඨශාලාවල ප්‍රධානාචාර්යවරුන්ගේ සහතික මගින් ඔප්පු කළ යුතුය.

තම මව්පියන් රජයේ හෝ සංස්ථාවල මාරුවීම් සහිත සේවයකට අයත් අයදුම්කරුවන්ට තම ස්ථිර පදිංචිය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය තෝරාගැනීමට ඉඩ දෙනු ලැබේ.

5. **තේරීම් ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ උසස් විභාග හෝ සඳහා අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි උඩ පහත 6 වැනි ඡේදයේ දැක්වෙන ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබන ලකුණු සහ පහත 7 වැනි ඡේදයේ දැක්වෙන සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණු සලකා පත්වීම් දීම සඳහා අපේක්ෂකයන් තෝරාගනු ලැබේ.

6. **ප්‍රමාණ කිරීමේ ක්‍රමය.**—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයේදී හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතික පත්‍රයේදී අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි සඳහා පහත සඳහන් පරිදි ලකුණු දෙනු ලැබේ :—

ඩී.—විශිෂ්ඨ සාමාර්ථය—ලකුණු 75
සී.—සම්මාන සාමාර්ථය—ලණුකු 50
එස්.—සාමාන්‍ය සාමාර්ථය—ලකුණු 40

විෂයයන් 6 කට වැඩි ගණනකට පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකු විසින් විෂයයන් 6 කට පමණක් පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකුට වඩා වැඩි ලකුණු ලබා වැඩි වාසියක් අත්පත්කර ගැනීමේ ඉඩකඩ වැලැක්වීම පිණිස මුළු ලකුණු ප්‍රමාණය ගණන් බැලීම සඳහා සැලකිල්ලට භාජනය කරන්නේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කෙරෙන විෂයයන් 6 පමණි. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරක් සමත්වී ඇති අපේක්ෂකයෙක් අමතර ලකුණු 30 ක් ලබාගැනීමට සුදුස්සකු වෙයි. කෙසේ වෙතත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරකට අඩුවෙන් සමත්වී ඇති අයට සහ එම විභාගයේදී සම්මාන සාමාර්ථය සහ විශිෂ්ඨ සාමාර්ථය ලබා ඇති අයට ඒ සඳහා අමතර ලකුණු ලැබෙන්නේ නැත. ශාස්ත්‍රවේදී හෝ ඊට උසස් උපාධියක් ඇති අයෙකුට අ.පො.ස. (උසස් පෙළ) සඳහා ලැබෙන ලකුණු 30 ද ඇතුළුව අමතර ලකුණු 70 ක් ලැබේ. උපාධියක් ඇති අපේක්ෂකයන්ට අ.පො.ස. (උසස් පෙළ) සඳහා වෙනම ලකුණු නොලැබේ. එකකට වැඩියෙන් ඇති උපාධි හෝ මෙහි සඳහන් කොට නොමැති වෙනත් අධ්‍යාපනික සුදුසුකම් සඳහා හෝ ලකුණු ලැබෙන්නේ නැත. අපේක්ෂකයන් සිය ඉල්ලුම් පත්‍රවල ඉහත සඳහන් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව තමන්ම නියමිත ලකුණු ප්‍රමාණය සඳහන් කළ යුතුය.

7. **සම්මුඛ පරීක්ෂණය.**—ඉහත සඳහන් ක්‍රමය අනුව ප්‍රමාණ කිරීමෙන් එක් එක් අපේක්ෂකයාට ලැබෙන මුළු ලකුණු ගණන දැනගත් පසු මෙම කාර්යාලයේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයන් සීමාසහිත ප්‍රමාණයක් කැඳවනු ඇත. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය ඊට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයනට පුද්ගලිකව දැනුම් දෙනු ලැබේ. මෙහි පහත **සඳහන් 10 (iii) දරණ ඡේදය** දැක්වෙන සහතිකවල මුල් සහතික මෙම සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ ග්‍රාම සේවක සේවයට අපේක්ෂකයා සුදුසු දැයි විමසා බැලීමයි. ගම හා එහි ශුභ සාධනය සම්බන්ධයෙන් ඔහුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙහිදී ප්‍රශ්න අසනු ලැබේ.

8. **සේවා කොන්දේසි.**—(i) රජයේ ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ II වෙනි ඡේදය ආරම්භයේදී දක්වා ඇති, රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් කිරීමේදී බලපාන පොදු කොන්දේසිවලට අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ii) මෙම තනතුරු ස්ථිරය ; විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය භාෂා පනතේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු නම්—

(ඒ) ඔහුගේ ආධුනික සේවා කාලය අවුරුදු තුනක් වේ.

(බී) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන වලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත් මතුවට පනවනු ලැබිය හැක්කාවූත් යම් යම් නීති රීතිවලට හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

(සී) ඔහුගේ ආධුනික සේවා කාලය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(ඩී) ආධුනික සේවා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත පිළිවෙළින් I වැනි, II වැනි සහ III වැනි ශ්‍රේණිවල සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. (නොඑසේ නම්, අදාලවන අවස්ථාවල I වැනි හා II වැනි ශ්‍රේණිවල පරීක්ෂණවලින් පිළිවෙළින් අවුරුද්දක් සහ අවුරුදු දෙකක් ඇතුළත සමත්වීම උඩ රඳා පවතී).

නියමිත කාලසීමා තුළදී නියමිත පරීක්ෂණවලින් සමත් නොවුවහොත් එය වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතු වේ. නියමිත කාලයෙන් පසු තවත් හය මාසයක් ගතවන්නට පෙර පරීක්ෂණවලින් සමත් නොවුවහොත් අත්හිටවූ වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කොට පරීක්ෂණය සමත් වන තෙක් හෝ මෙහි පහත (iii) (ඊ) හි ඇති විධිවිධාන අදාල වන කාලය තෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මක වනු ඇත.

(ඊ) ආධුනික සේවා කාලය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීණතාව ලබා නොගත හොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසිවල නියමයන් අදාල වනු ඇත.

## රත්නපුර දිස්ත්‍රික්කයේ පිදිවිට කොට්ඨාශයේ උප්පැන්න හා මරණ සහ අටකලං කෝරළේ කොට්ඨාශයේ විවාහ (සාමාන්‍ය සහ උඩරට) රෙජිස්ට්‍රාර් ධුරය

පිදිවිට උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාශ තුළ ස්ථිර පදිංචියක් ඇත්තාවූ හෝ එහි කාලයක් පදිංචිවීම හේතු කොටගෙන ගම්වාසීන්ගෙන් සැලකුම් ලබන, ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු විසිඑකට නොඅඩු ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙන්ම ඉහත සඳහන් ධුරය සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා මෙම වයස් සීමාව අදාල නොවේ.

2. මෙම ධුරය සඳහා ඉදිරිපත්වන අයට තිබිය යුතු අධ්‍යාපනික හා අනිකුත් සුදුසුකම් ආදිය පිළිබඳ සියළු විස්තර මෙම කාර්යාලයේ සහ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කාර්යාල, ග්‍රාම සේවක කාර්යාල, පළාත් පාලන ආයතන සහ කාර්යාල, ග්‍රාමීය උසාවි, තැපැල් කාර්යාල, පොලිස් ස්ථාන, ප්‍රජා මණ්ඩල, ප්‍රසිද්ධ වෙළඳපලවල් සහ සමුපකාර සමිති ආදී කොට්ඨාශයේ ප්‍රසිද්ධ ස්ථාන සහ කාර්යාලවල ප්‍රදර්ශනය කර ඇති දන්වීම්වල ඇතුළත් වේ.

3. සියළුම ඉල්ලුම්පත් මෙම කාර්යාලයෙන් ලබාගත හැකි ආකෘති පත්‍රවල සකස් විය යුතු අතර, ඒවා 1970 දෙසැම්බර් 10 වැනි දින හෝ ඊදිනට ප්‍රථම මා වෙත ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.

ඇස්. ජී. සමරසිංහ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්.

1970 ඔක්තෝබර් 31 වෙනි දින,
රත්නපුරේ,
දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේදීය.

11-268—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවේ නියෝජ්‍ය පාලන ශ්‍රේණියේ වෛද්‍ය නිලධාරි තනතුරු සඳහා දෙපාර්තමේන්තු නිලධාරීන් අතුරින් අයදුම් පත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ විසින් කැඳවනු ලැබේ.

1970.12.3 වන දින අයදුම් පත් භාර ගැනීම අවසන් කෙරේ.

වැඩිදුර විස්තර අවශ්‍ය නම් පහත අත්සන් කරන අයගෙන් ලියා විමසන්න. කිසිම ලියවිල්ලක් පහත අත්සන් කරන අයගේ පුද්ගලික නමට එවිය යුතු නොවේ.

කේ. රාජසූරියර්,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ.

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය,
තැ. පෙ. 500, ගාලු මුවදොර,
කොළඹ.
1970 නොවැම්බර් මස 2 වන දා,

1-279—70.11.12 දින අංක 14,9 32 දරන ගැසට් පත්‍රය

---

## දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

### සමීක්ෂක තනතුරු—III වන ශ්‍රේණිය

ඉහත සඳහන් තනතුරු සම්බන්ධයෙන් 1970 ඔක්තෝබර් මස 23 වැනි දිනැති ආණ්ඩුවේ ගැසට් පත්‍රයේ පළවී ඇති නිවේදනය වෙත අවධානය යොමු කරවනු ලැබේ.

නිවේදනයේ ඉංග්‍රීසි අනුවාදයේ 4බී ඡේදයේ අවසානයට "OR" යනුවෙන් කියවෙන ලෙසද, ආදශී ඉල්ලුම් පත්‍රයේ ඉංග්‍රීසි අනුවාදයේ 10 (II) පළවැනි ඡේදය "(a) Date of appointment to General Clerical service or allied service Stenographers transferable service/Typists service :—" යනුවෙන් කියවෙන ලෙසද නිවරදි කර ඇත.

මේ අනුව, ඉල්ලුම් පත් භාර ගන්නා අවසාන දිනය 1970.11.26 වැනි දින දක්වා දීර්ඝ කර ඇත.

ස. සිට්ටම්පලම්,
දේශීය ආදායම් කොමසාරිස්.

දේශීය ආදායම් දෙපාර්තමේන්තුව,
තැ. පෙ 515,
සෙනෙට් චතුරශ්‍රය,
කොළඹ 1,
1970 නොවැම්බර් 3 වැනි දින.

11-332—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි තනතුරු (කෘෂිකර්ම)

අධ්‍යාපන අමාත්‍යාංශයේ මාණ්ඩලික අධ්‍යාපන නිලධාරි (කෘෂිකර්ම) තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේම අයදුම්කරුවන්ගෙන් ඉල්ලුම්පත්‍ර කැඳවනු ලැබේ. මෙම කාර්යාලය මගින් සපයනු ලබන මුද්‍රිත ආකෘති පත්‍රයන්හි ඉදිරිපත් කළ යුතු ඉල්ලුම් පත්‍ර කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් (සාමාන්‍ය පරිපාලන ශාඛාව) වෙත 1970 දෙසැම්බර් මස 6 වැනි දින හෝ ඊට මත්තෙන් ලැබෙන්නට එවිය යුතුය.

සංලක්ෂ්‍යය.—(i) මෙම තනතුරු ඉල්ලුම් කිරීමට කැමති අය, ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි කළ අංකය, ලබාගෙන ඇති උපාධිය හා විෂයයන්, පුහුණු ගුරු සහතිකයේ/ගුරු සහතිකයේ අංකය දිනය හා උපාධිධරයෙකු/පුහුණු ගුරු සහතිකය ලත්/ගුරු සහතිකය ලත් ගුරුවරයෙකු වශයෙන් ඉගැන්වීමේ පළපුරුද්ද යනාදිය සඳහන් කරමින් මුද්‍රිත ආකෘති පත්‍රයක් ලබාගැනීම සඳහා කොළඹ 2, මලයි වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ (සාමාන්‍ය පරිපාලන ශාඛාව) ස්ථිර ලේකම් වෙත ඉල්ලුම් කළ යුතුය. 1970 නොවැම්බර් මස 25 වැනි දින තෙක් එම ආකෘති පත්‍ර ලබාගත හැක. අංක සාප/25/8 යන්න ලියුම් කවරයේ වම් කෙළවරේ සඳහන් කළ යුතුය. තමාගේ ලිපිනය ලියන ලද මුද්දර රහිත දිග ලියුම් කවරයක්ද එවිය යුතුය. පෞද්ගලිකව පැමිණෙන්නන්ට මුද්‍රිත පත්‍ර දෙනු නො ලැබේ.

(ii) ඉල්ලුම් පත්‍රයක් හෝ ඒ හා සම්බන්ධිත ලියමනක් තැපැලේ දී නැති වූ බවට හෝ ප්‍රමාද වූ බවට කෙරෙන පැමිණිලි ගැන සලකා බැලිය නොහැක. අවසාන දිනය දක්වා ඉල්ලුම් පත්‍ර ප්‍රමාද කිරීමෙන් සිදුවිය හැකි අලාභහානි අයදුම්කරුවන් විසින් ම විඳ දරා ගත යුතුය.

2. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි.—(i) මෙම තනතුර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා යටතේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වෙත්. ස්ත්‍රියක් මෙම තනතුරකට පත් කරන ලද නම් ඇයට අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභයන් හිමිවන අතර ඇය විසින් ස්වකීය වැටුපෙන් සියයට පහක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට ගෙවිය යුතුය.

තෝරා ගනු ලබන අයදුම්කරුවෝ දැනට රජයේ ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත සේවයෙහි යෙදී නොසිටිත් නම් අවස්ථාවෝචිත පරිදි අවුරුදු තුනක් ආධුනික හෝ පරීක්ෂා කාලයකට යටත්ව පත් කරනු ලබනවා ඇත. අවුරුදු 10 ක් සේවය සම්පූර්ණ කිරීමට මත්තෙන් අර්ථසාධක අරමුදලට තවදුරටත් දායක වීමේ හෝ විශ්‍රාම වැටුප් ක්‍රමයට මාරුවීමේ හෝ තීරණය සිය මනාපය පරිදි ගැහැණු නිලධාරියෙකු විසින් කළ යුතුය. ගුරු විශ්‍රාම වැටුප් ලැබිය හැකි ගුරුවරියක ලෙස හා/හෝ අර්ථසාධක අරමුදල් හිමි තනතුරක ඇය දැනට අවුරුදු 10 ක් සේවය කර ඇත්නම් මෙම පත්වීම ලැබී මාස 6 ක් ඇතුළත ඇගේ මනාපය පරිදි තීරණය ගත යුතුය.

(ii) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් පත්වීම ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ඇතුළත දී රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා හා පාලන රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්ද මුදල් රෙගුලාසි පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්ද, අධ්‍යාපන නීතිය පිළිබඳ ප්‍රශ්න පත්‍රයක්ද යන ප්‍රශ්න පත්‍ර තුනකින් යුත් රජයේ ව්‍යවස්ථා හා රෙගුලාසි පිළිබඳ විභාගයකින් සාමාර්ථය ලැබිය යුතුයි. එසේ කිරීමට අසමත්වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතුවේ. මෙම විභාගයෙන් සාමාර්ථය ලැබීමට ඉඩදී ඇති කාල සීමාවට වැඩිපුර කාලයක් ගතවී එයින් සාමාර්ථය ලැබූ විට වැඩිපුර ගත වූ කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලැබේ.

(iii) තෝරාගනු ලැබූ අයදුම්කරුවන් දෙවෙනි කාර්යක්ෂමතා කඩඉමෙන් උසස්වීම සඳහා විධායක ලිපිකරු පන්තියේ දෙවැනි ශ්‍රේණියේ හා අනිකුත් නිලධාරීන්ට නියමිත ජාතික භාෂා පිළිබඳ විභාගයේ දී (දෙමළ නිලධාරීන් නම්) සිංහලෙන් ද (සිංහල නිලධාරීන් නම්) දෙමළෙන් ද සාමර්ථ්‍යය ලබාගත යුතුය. දෙවැනි කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා ගොස් සිටින අය තෙවැනි කාර්යක්ෂමතා කඩඉම ඉක්මවා යාමට පෙර එම විභාගයෙන් සාමර්ථ්‍යය ලබා ගැනීම අවශ්‍ය වනු ඇත. එසේ කිරීමට අසමත් වීම පඩි වැඩිවීම විලම්බනය කිරීමට හේතුවේ. ඉඩ දී ඇති කාලසීමාවට වඩා ගතවන වැඩිපුර කාල පරිච්ඡේදය පඩි වැඩිවීම විලම්බනය කළ කාල පරිච්ඡේදයක් ලෙස සලකනු ලබනවා ඇත.

(iv) නිලධාරියෙකු තවදුරටත් සේවයේ රඳවා ගැනීම නුසුදුසුයයි වැටහී ගියහොත් ආධුනික/පරීක්ෂණ කාලය ඇතුළත කවර අවස්ථාවක දී හෝ එය අවසානයේ දී හෝ ඔහුගේ/ඇයගේ සේවය නතර කරනු ලැබීමට ඉඩ තිබේ.

(v) තෝරාගන්නා ලද අයදුම්කරුවන් ඔවුන්ට නියම කරනු ලැබෙන ලංකාවේ කවර ප්‍රදේශයක වුවද සේවය කිරීමට අවශ්‍යව ඇත.

3. **වැටුප් හා දීමනා.**—මෙම තනතුරුවලට නියමිත ඒකාබද්ධ වැටුප් ක්‍රමය මෙසේය. රු. 6,024 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 144 වාර්ෂික පඩි වැඩිවීම් 4 කින් ද රු. 180 වාර්ෂික පඩි වැඩිවීම් 8 කින් ද, රු. 240 වාර්ෂික පඩි වැඩිවීම් 6 කින් ද වාර්ෂික වැටුප රු. 6,780, රු. 7,500 හා රු. 8,280 යන ස්ථානයන්ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂික වැටුප රු. 9,480 දක්වා නගිනු ලබන වැටුප උපාධිධරයන් සඳහා ද, රු. 5,016 ක වාර්ෂික වැටුපකින් පටන් ගෙන රු. 144 වාර්ෂික පඩි වැඩිවීම් 11 කින් ද, රු. 180 වාර්ෂික පඩි වැඩිවීම් 5 කින් ද, වාර්ෂික වැටුප රු. 5,880 හා රු. 6,780 යන ස්ථානයන්ට පෙරාතුව කාර්යක්ෂමතා කඩඉම් සහිතව වාර්ෂික වැටුප රු. 7,500 දක්වා නගිනු ලබන වැටුප උපාධිධාරීන් නොවන්නන් සඳහා ද වේ.

4. **අවශ්‍ය සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකු විසින්ම ඔහු/ඇ පිළිබඳ පහත සඳහන් කරුණු සනාථ කිරීමට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුයි :—

(ඒ) 1970.12.6 වැනි දිනට වයස අවුරුදු 25 ට නො අඩු බවට හා අවුරුදු 40 ට නොවැඩි බවට (මෙම වයස් සීමාව රජයේ සේවයේ නියුක්ත වූවන්ට හා අධ්‍යක්ෂ පාලිත පාඨශාලාවල ගුරුවරුන්ට අදාල නොවේ).

(බී) (i) උපාධිධාරීන් සම්බන්ධයෙන්.—පිළිගත් විශ්ව විද්‍යාලයක කෘෂිකර්මය පිළිබඳ උපාධියක් හෝ කෘෂිකර්ම උපාධියකට සමාන යයි සැලකිය හැකි කෘෂිකර්මය පිළිබඳ සුදුසුකම් තිබිය යුතුය.

**සටහන.**—ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති උපාධිධාරීන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

(ii) උපාධිධාරීන් නොවන්නන් සම්බන්ධයෙන්.—කුණ්ඩසාලේ හෝ පේරාදෙනියේ කෘෂිකර්ම පාඨශාලා මඟින් නිකුත් කරන ලද කෘෂිකර්මය පිළිබඳ සහතිකයේ (දෙවන පෙළ නම් වඩා මැනවි.) සමඟ යටත් පිරිසෙයින් 8 අවුරුද්දක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පළමු වැනි පෙළ (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) ගුරු සහතික පත්‍රය හිමි ගුරුවරයෙකු හෝ 8 අවුරුද්දක ඉගැන්වීමේ පළපුරුද්දක් ඇති පළමුවන පෙළ (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) පුහුණු ගුරු සහතික පත්‍රය හිමි ගුරුවරයෙකු හෝ විය යුතුය.

(සී) ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේ දී හෝ පොදු අධ්‍යාපන සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දී හෝ වෙනත් උසස් විභාගයකදී, සිංහල භාෂාවෙන් හෝ සිංහල සාහිත්‍යයෙන් හෝ දෙමළ භාෂාවෙන් හෝ දෙමළ සාහිත්‍යයෙන් හෝ සාමර්ථ්‍යය ලබා ඇති බවට,

(ඩී) විශිෂ්ඨ චරිතයෙන් හා හොඳ ශාරීරික සනීපයෙන් යුක්ත බවට.

5. ඉල්ලුම්කරුවන් ඔවුන්ගේ ඉල්ලුම් පත්‍රවලට පහත සඳහන් සහතික පත්‍රවල පිටපත් (මුල් පිටපත් නොවේ) ඇමිණිය යුතුයි :—

(i) උප්පැන්න සහතිකය (බෞතීස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහයේ කාර්‍යයන් සඳහා නිකුත් කරන ලද සහතිකය පිළිගනු නො ලැබේ.)

(ii) ශාස්ත්‍රීය හා වෘත්තීය සුදුසුකම් පිළිබඳ සහතික ඇත්නම් ඒවායේ පිටපත්.

(iii) මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (දැනටමත් රජයේ සේවයෙහි නියුක්ත නිලධාරීන්ගෙන් මෙම සහතික අනවශ්‍යයයි).

(iv) ධූරාපේක්ෂකයාගේ සිංහල/දෙමළ දැනීම පිළිබඳව සෑහෙන සහතිකයක් හෝ වෙනත් ලේඛනගත සාක්ෂි.

රජයේ සේවයෙහි නියුක්ත වූවන් චරිත සහතිකවල පිටපත් එවීමෙන් පමණක් නිදහස් කරනු ලබන බව සැලකිය යුතුයි.

6. ඉල්ලුම් පත්‍ර හෝ ඒ සම්බන්ධ අනෙක් ලියකියවිලි සියල්ලක්ම ස්ථිර ලේකම්ට හැර මෙම කාර්යාලයේ කිසියම් නිලධාරියෙකුගේ නමට පෞද්ගලිකව නො එවිය යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ පළමුවෙනි කොටසේ දෙවෙනි ඡේදයේ ආරම්භයේ සඳහන් රාජ්‍ය සේවා තනතුරුවලට කරනු ලබන පත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන පොදු කොන්දේසි ද බලනු මැනවි.

8. රාජ්‍ය සේවයේ නියුක්ත අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර ඔවුන්ගේ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුයි. රජයේ පාඨශාලාවල හා අධ්‍යක්ෂ පාලිත පාඨශාලාවල ගුරුවරයන්ගේ ඉල්ලුම්පත්‍ර ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ/ප්‍රධාන අධ්‍යාපන නිලධාරි මාර්ගයෙන් ස්ථිර ලේකම්, සාමාන්‍ය පරිපාලන ශාඛාව වෙත ඉදිරිපත් කළ යුතුය. නියමිත දිනට පසුව මෙම කාර්යාලයට ලැබෙන එවැනි අයදුම්කරුවන්ගේ ඉල්ලුම් පත්‍ර එම දෙපාර්තමේන්තු/කාර්යාල ප්‍රධානීන් විසින් නියමිත දින හෝ ඊට පෙර ලද බව හා ප්‍රමාදවීම ගැන පිළිගත හැකි කරුණු ඉදිරිපත් කරමින් ඒවා පිළිගත යුතු බව නිර්දේශ නො කරතොත් ඒවා සලකා බලනු නො ලැබේ.

9. ඉල්ලුම්පත්‍ර ලැබුණ බව දන්වනු ඇත. දින 14 ක් ඇතුළත තම අයදුම් පත්‍රය ලැබුණු බව දන්වන ලිපියක් නොලත් අයදුම්කරුවෙක් වේ නම් වහාම ඒ බව ස්ථිර ලේකම් වෙත දැන්විය යුතුයි. කිසියම් අයදුම්කරුවෙක් මේ අවශ්‍යතාවය පැහැර හැරියොත් තම අයදුම් පත්‍රය සලකා බලනු වස් ඉල්ලා සිටීමේ අයිතිය ඔහුට/ඇයට අහිමි වනු ඇත.

ස්ථිර ලේකම් සහ අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

අංකය : පාප/25/8.
1970 නොවැම්බර් මස 3 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ
අධ්‍යාපන අමාත්‍යාංශයේ දී ය.

11-296—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අධ්‍යාපන අමාත්‍යාංශය

### රජයේ විද්‍යාලයන්හි චිත්‍රකර්ම උපගුරු තනතුරු

රජයේ විද්‍යාලයන්හි චිත්‍රකර්ම උපගුරු තනතුරු සඳහා ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයේ ම අයදුම්කරුවන් ගෙන් අයදුම් පත් කැඳවනු ලැබේ. මෙහි පහත දක්වෙන ආදර්ශ අයදුම් පත අනුව පිළියෙල වූ අයදුම් පත් "කොළඹ 2, මැලේ වීදියේ අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් (පාඨශාලා පරිපාලන ශාඛාව)" යන ලිපිනයට 1970.12.12 වැනි දින හෝ ඊට ප්‍රථම ලැබෙන සේ ලේඛනගත තැපැලෙන් එවිය යුතුය. අයදුම් පත බහා එවන කවරයේ වම්පස, ඉහළ කෙළවරේ " චිත්‍රකර්ම උපගුරු තනතුරු " යන්න පැහැදිලිව සඳහන් කළ යුතු ය.

2. **වැටුප් ක්‍රමය.**—(i) කල්පිත වැටුප—රු. 768—2 × 30, 5 × 36, 12 × 42—රු. 1,512 වාර්ෂික.

(ඒකාබද්ධ වැටුප—රු. 2,640—19 × 60—රු. 3,780)

(ii) **කල්පිත** වැටුප—රු. 1,560—14 × 72—රු. 2,568. කාර්යක්ෂමතා කඩඉම රු. 2,640—5 × 120—රු. 3,240 වාර්ෂික.

(ඒකාබද්ධ වැටුප—රු. 3,720—16 × 90—5 × 144—5, 880).

**කාර්යක්ෂමතා කඩඉම.**—රජයේ ලලිත කලායතනයේ ඇඳීම හා පින්තාරු කිරීමේ දවුරුදු උසස් සහතිකය ලබා ගැනීම හෝ මෙම කාර්යක්ෂමතා කඩඉම සඳහා රජයේ ලලිත කලායතනය විසින් ඉහත සඳහන් උසස් සහතික විභාගයට සමාන තත්ත්වයෙන් පවත්වනු ලබන විශේෂ විභාගයෙන් සමර්ථ වීම.

3. **සුදුසුකම්.**—සෑම අයදුම්කරුවෙකුම පහත සඳහන් සුදුසුකම් ඇති බවට සතුටුදායක සාක්ෂි ඉදිරිපත් කළ යුතුය :—

(අ) අයදුම් පත් භාර ගැනීමේ අවසාන දිනට වයස අවුරුදු 20 ට නො අඩු හා 45 ට නො වැඩි බව (මෙම උපරිම වයස් සීමාව දැනටමත් රජයේ පාසල්වල සේවයේ සිටින ස්ථිර ගුරු භවතුන්ට හා රජයේ අනිකුත් ස්ථිර සේවකයන් සඳහා අදළ නොවේ);

(ආ) විශිෂ්ඨ චරිත ශුද්ධියකින් යුක්ත බව ;

(ඉ) දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට කැමති බව හා ඊට සුදුසු ශාරීරික සනීපයෙන් යුක්ත බව ;

(ඊ) (i) 1949 අගෝස්තු මසට පූර්වයෙන් වූ සිංහල/දෙමළ චිත්‍ර කර්ම ගුරු සහතිකය දරන්නෙකු බව (මෙම සහතිකය සඳහා අදළ (කල්පිත) වැටුප් ක්‍රමය වර්ෂයකට රු. 768—2 × 30, 5 × 36, 12 × 42—රු. 1,512 වේ) ; හෝ

(ii) 1949 අගෝස්තු මස හෝ ඊට පසුව හෝ වූ සිංහල/දෙමළ චිත්‍රකර්ම ගුරු සහතිකය දරන්නෙකු බව ; හෝ

(iii) ඉංග්‍රීසි චිත්‍රකර්ම ගුරු සහතිකය දරන්නෙකු බව ; හෝ

(iv) රජයේ ලලිත කලායතනයේ ඇඳීම හා පිංතාරු කිරීමේ තුන් අවුරුදු සාමාන්‍ය සහතිකය දරන්නෙකු බව ; හෝ

(v) රජයේ ලලිත කලායතනයේ ඇඳීම හා පිංතාරු කිරීමේ සෙනසුරාද දවුරුදු උසස් සහතිකය දරන්නෙකු බව ; හෝ

(vi) රජයේ ලලිත කලායතනයේ චිත්‍රකර්ම පිළිබඳ ගුරුවරුන් සඳහා වූ සාමාන්‍ය සහතිකය දරන්නෙකු බව ; හෝ

(vii) ශාන්ති නිකේතනයේ විශ්ව භාරතී කලා භවනේ ලලිත කලා හා හස්ත කර්මාන්ත හතර අවුරුදු පාඨමාලාව හැදෑරීමෙන් පසු පිරිනැමෙන ඩිප්ලෝමා සහතිකය දරන්නෙකු බව.

(අංක (ii) සිට (vii) දක්වා වූ සහතික සඳහා අදාළ වැටුප් ක්‍රමය : වර්ෂයකට රු. 1,560—14 × 72—2,568 කාර්යක්ෂමතා කඩඉම, රු. 2,640—5 × 120—රු. 3,240 වේ).

4. **සේවයට බඳවා ගැනීමේ කොන්දේසි.**—(i) මෙම තනතුරු ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.

(ii) පත්කරනු ලබන පිරිමි අය විසින් වැන්දඹු හා අනත් දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

5. **සේවා කොන්දේසි.**—(අ) රාජ්‍ය භාෂා පනතේ අවශ්‍යතාවයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු වන්නේ නම්—

(i) ආධුනික කාල සීමාව අවුරුදු 3 ක් වනු ඇත ;

(ii) ඔහු/ඇය රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, විශේෂයෙන්ම 1956 අංක 33 දරන රාජ්‍ය භාෂා පනතේ විධානයන් ක්‍රියාවට නැගීම පිණිස ද, සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කෙරෙන යම් යම් ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය ;

(iii) ආධුනික කාල සීමාව තුළ ඔහු විසින් සිංහල භාෂා විෂයෙහි ප්‍රවීණත්වයක් ලබා ගත යුතු ය ;

(iv) ආධුනික කාල සීමාව අවසානයේදී තනතුරෙහි ස්ථිර කිරීම, වෙනත් කරුණු අතර, නියමිත කාල සීමාවක් ඇතුළත දී නියමිත සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම ද මත රඳා පවතිනු ඇත.

නියමිත කාල සීමාව තුළදී මෙම ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත් වීමට අපොහොසත් වීම, වැටුප් වැඩිවීම් අත්හිටුවනු ලැබීමට හේතුවනු ඇති අතර, නියමිත කාල සීමාව ඉක්මවා තවත් සමයක් ඇතුලත දී පරීක්ෂණයකින් සමත් නොවුවහොත් එම 'අත්හිටුවීම', 'නතර කිරීමකට', පරිවර්තනය කර, පරීක්ෂණය සමත්වන තෙක් එම නතර කිරීම ක්‍රියාත්මක කර තබනු ඇත.

(v) ආධුනික කාල සීමාව අවසාන වීමට පෙර සිංහල භාෂා විෂයයෙන් නියමිත තත්ත්වයේ ප්‍රවීණතාවයක් ලබාගෙන නො තිබුණහොත් අංක 120 හා 121 දරන පාලන රෙගුලාසිවල විධිවිධාන බලපවත් වනු ඇත.

(ඉහත දක්වෙන අංක (iii), (iv) හා (v) දරන කොන්දේසි දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් බඳවා ගනු ලබන්නන්ට අදාළ වේයි).

(vi) තනතුරෙහි ස්ථිර කරනු ලැබූ දින සිට දෙවර්ෂයක් ඇතුළත දී ඔහු/ඇය සිංහල භාෂා විෂයයෙන් ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර තත්ත්වයේ නියමිත කාර්යක්ෂමතා කඩඉම පරීක්ෂණයකින් සමත් විය යුතුය. මෙම විභාගයෙන් සමත්වීමට අපොහොසත් වීම වැටුප් වැඩිවීම් විලම්බනය කිරීමට හේතුවනු ඇත.

(ආ) ආධුනික කාලය අවසාන වීමට පෙර—

(i) සිංහල මාධ්‍යයෙන් බඳවා ගන්නා ලද අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් සිංහල භාෂාව විෂයයෙන් සාමාර්ථ්‍යය ලබා ගත යුතුයි ;

(ii) දෙමළ මාධ්‍යයෙන් බඳවා ගන්නා ලද අයදුම්කරුවන් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය) විභාගයෙන් දෙමළ භාෂාව විෂයයෙන් සාමාර්ථ්‍යය ලබා ගත යුතුයි.

(ඇ) මෙම පත්වීම රාජ්‍ය සේවා කොමිෂන් සභා ව්‍යවස්ථා මුදල්, රෙගුලාසි, කාර්ය සංවිධාන සංග්‍රහය රෙගුලාසි, දෙපාර්තමේන්තු විධාන හෝ රෙගුලාසි යන මේවාට සහ ආණ්ඩුවෙන් කලින් කල නිකුත් කෙරෙන සෙසු විධාන වලටහෝ රෙගුලාසිවලට හෝ යටත් වන්නේය.

6. අයදුම්කරුවන් ඔවුන්ගේ පහත සඳහන් සහතික පිටපත් (මුල් පිටපත් නොව) ඉල්ලුම් පත්‍රය සමඟ අමුණා එවිය යුතුයි :—

(අ) උප්පැන්න සහතිකය.

(සැ.යු.—බෞතිස්ම සහතිකය හෝ උපකෘත පාඨශාලා ව්‍යවස්ථා සංග්‍රහය පරිදි නිකුත් කරන ලද සහතිකය හෝ පිළිගනු නො ලැබේ.)

(ආ) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ සහතික.

(ඇ) තමන්ගේ චරිතය සහ පත්වීමක් සඳහා යෝග්‍යතාවය තහවුරු කෙරෙන, ළඟදී ලබාගත් සහතික දෙකක්. මින් එකක් තම ප්‍රදේශයේ ග්‍රාමසේවක නිලධාරියාගෙන් ලබාගෙන ප්‍රාදේශීය ආදායම් පාලක නිලධාරියා ලවා සහතික කරවාගත යුතුයි.

7. මෙම ගැසට් පත්‍රයේ I වෙනි කොටසේ (II) වැනි ඡේදයේ ආරම්භයේ එන රාජ්‍ය සේවා තනතුරුවලට අදාල පොදු කොන්දේසිවලට අවධානය යොමු කළ යුතුය.

8. අයදුම් පත් භාරගැනීමේ අවසාන දිනට පසුව ලැබෙන අයදුම් පත් පිළිගනු නොලැබේ.

9. තැපැලේදී සිදුවිය හැකි ප්‍රමාදයන් මග හැරවීම සඳහා සිය අයදුම් පත් කල්වේලා ඇතිව ලේඛනගත තැපෑලෙන් එවන ලෙස අයදුම්කරුවන් හට දැනුම් දෙනු ලැබේ.

පී. උඩගම,
අධ්‍යාපන අමාත්‍යාංශයේ ස්ථිර ලේකම් හා
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 නොවැම්බර් මස 2 වැනි දින,
කොළඹ 2, මලයි වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

## ආදර්ශ අයදුම් පත්‍රය

### රජයේ පාසල්වල සේවය සඳහා චිත්‍රකර්ම ගුරු භටතුන් බඳවා ගැනීම

1. සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්) මයා./මිය./මෙනවිය :————.

2. ලිපිනය :————.

3. ස්ත්‍රී පුරුෂ භාවය :————.

4. විවාහකද අවිවාහකද යන වග :————.
   ස්වාමිපුරුෂයා/භාර්යාව රජයේ සේවකයකු නම් ඒ සම්බන්ධ තොරතුරු සඳහන් කරන්න.

5. ගුරුවරයෙකු වශයෙන් ලියාපදිංචි කළ අංකයක් ඇත්නම් එය :————
   (කලින් ගුරුවරයෙකු වශයෙන් සේවය කර තිබේ නම්)

6. අයදුම්කරු උපන් දිනය හා ස්ථානය (උප්පැන්න සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුයි) :————.

7. 1970.12.12 දිනට වයස :————.

8. (අ) අයදුම්කරුගේ පියාගේ උපන් ස්ථානය :————.
   (ආ) අයදුම්කරුගේ මවගේ උපන් ස්ථානය :————.

9. (අ) ජාතිය :————.
   (ආ) ලාංකිකයෙකු නම් ලියාපදිංචි වීමෙන්ද, පරම්පරාවෙන්ද යන වග :————.

10. (i) දැනට කරන රක්ෂාව (සේවය පිළිබඳ විස්තරයකුත් සමඟ) :————
    (ii) අයදුම්කරු මීට පෙර රජයේ හෝ පළාත් පාලන සේවයේ නිරතව සිටියේ නම් සේවය හැර යාමට හේතුව :————.

11. සුදුසුකම් :—
    (i) ලබා ඇති අධ්‍යාපනික හා චිත්‍රකර්ම පිළිබඳ සුදුසුකම් :————.
    (ii) ගැසට් නිවේදනයේ (3) වැනි ඡේදයේ කුමන කොටසක් යටතේ ඔබ සුදුසුකම් ලබා තිබේද? :————.
    (සහතිකයේ පිටපත් අමුණන්න)

ඉහත සඳහන් විස්තර සම්පූර්ණයෙන්ම නිවැරදි බවත්, හා රජයේ සේවය පැහැර හැරියෙකු සේ සලකනු ලැබූ කෙනෙකු නොවන බවත්, රජයේ සේවයෙන් පහ කිරීමක් හෝ සේවය නතර කිරීමක් හෝ සිදුවී නැති බවත්, උත්පත්තියෙන්/ලියාපදිංචි කිරීමෙන් මා ලාංකිකයෙකු බවත් සහතික කරමි. තවද මවිසින් සපයන ලද ඉහත කී විස්තරවල යම්කිසි අසත්‍යතාවයක් මා තෝරාගනු ලැබීමට ප්‍රථම එළිදරවූ වුවහොත් මා නුසුදුස්සකු කරනු ලබන බවත් තෝරා ගැනීමෙන් පසු එවැනි අසත්‍යතාවයක් එළිදරවූ වුවහොත් මා සේවයෙන් පහ කරනු ලබන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11-297—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ග්‍රාමසේවක සේවයට බඳවා ගැනීම

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ග්‍රාමසේවක සේවයේ තිබෙන ඇබෑර්තු පිරවීම සඳහා පහත 4 වැනි ඡේදයේ දක්වෙන සුදුසුකම් ඇති පිරිමි අපේක්ෂකයන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ.

2. ඇබෑර්තු.—එක් එක් ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ තිබෙයයි ගණන් බලා ඇති ඇබෑර්තු ප්‍රමාණය මෙසේය :—

| ප්‍රා. ආ. නි. කොට්ඨාශය | ඇබෑර්තු ගණන |
|---|---|
| උතුරු ගිරුවා පත්තුව ... ... | (4) හතරයි |
| දකුණු ගිරුවා පත්තුව ... ... | (2) දෙකයි |
| මාගම් පත්තුව ... ... | (1) එකයි |

3. පත්වීම් ලැබීමට සමත්වන අපේක්ෂකයන් පහත 8(iii) (ජී) ඡේදයේ දක්වෙන පුහුණුවීම සම්පූර්ණ කළ පසු වර්ෂයකට රු. 3,000 ඒකාබද්ධ වැටුපෙන් පටන්ගෙන රු. 90 වාර්ෂික වැටුප් වැඩිවීම් ලබා වර්ෂයකට රු. 5,160 දක්වා නැගෙන වැටුප් ක්‍රමයක් මත පත්කරනු ලැබේ. මෙම වැටුප් ක්‍රමයේ රු. 3,810 ට පෙර කාර්යක්ෂමතා කඩඉමක් ක්‍රියාත්මක වේ.

4. සුදුසුකම්.—(i) අපේක්ෂකයන් ඉතා හොඳ චරිතයකින් යුක්තවිය යුතුය.

(ii) අපේක්ෂකයන් ලාංකිකයන් විය යුතුයි.*

*රාජ්‍ය සේවයේ පත්වීම් පිළිබඳ සියළුම කරුණු සඳහා " ලාංකිකයා " යන වචනය විග්‍රහ කොට ඇත්තේ පරම්පරාවෙන් හෝ ලියාපදිංචි කිරීමෙන් ලංකාවේ පුරවැසියකු යනුවෙනි.

(iii) ග්‍රාමසේවකයකුගේ රාජකාරි නිසියාකාර ඉටුකිරීම සඳහා අපේක්ෂකයන් කායික වශයෙන් සුදුසු විය යුතුයි.

(iv) අපේක්ෂකයන්ට—

(ඒ) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය හෝ ගණිතය යන විෂයයන්ගෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිත ලංකා ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතිකය, හෝ

(බී) සිංහල හෝ දෙමළ භාෂාව සහ අංක ගණිතය, හෝ වාණිජ ගණිතය, හෝ මූලික ගණිතය හෝ ශුද්ධ ගණිතය යන විෂයයන් දෙකෙන් සාමාර්ථය ද සම්මාන සාමාර්ථ හතරක් ද සහිතව විෂයයන් හයකින් දෙකකට නොවැඩි වාර ගණනකදී ලබාගත් අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) සහතිකය ; හෝ

(සී) විෂයයන් හතරක් සහිත අධ්‍යයන පොදු සහතික පත්‍රය (උසස් පෙළ) හෝ උපාධියක් වැනි උසස් සුදුසුකම්

තිබිය යුතුයි.

සටහන.—සිංහල කථාකරන මෙම ග්‍රාමසේවක කොට්ඨාශවල ග්‍රාමසේවක තනතුරු සඳහා ඉදිරිපත් වන අපේක්ෂකයන් සිංහල භාෂාව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයේදී හෝ අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී හෝ සමත්වී සිටිය යුතුය.

(v) 1970.12.12 දිනට අපේක්ෂකයන් වයස අවුරුදු 21 ට අඩු නොවිය යුතු අතර, වයස අවුරුදු 35 ට වැඩි නොවිය යුතුය. රාජ්‍ය සේවයේ ස්ථිර තනතුරු දරණ අයට උපරිම වයස් සීමාව බලපාන්නේ නැත.

(vi) (ඒ) ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දිනයට පූර්වයෙහිවූ හය අවුරුද්ද තුළ අපේක්ෂකයින් තමන් පත්වීම් බලාපොරොත්තුවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශය තුළ යටත් පිරිසෙයින් අවුරුදු 3 ක කාලයක් නොකඩවා ස්ථිර ලෙස පදිංචිව සිටි/සිටින අය විය යුතුය. ග්‍රාමසේවකගෙන් ලබාගත් පදිංචිය පිළිබඳ සහතිකයකින් මෙය ඔප්පු කළ යුතුය, නැතහොත්

(බී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තු වන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ උපන් අය විය යුතුය. මෙය ඔවුන්ගේ උප්පැන්න සහතික මාර්ගයෙන් ඔප්පු කළ යුතුය, නැතහොත්

(සී) අපේක්ෂකයන් තමන් පත්වීම් බලාපොරොත්තුවන ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ නොකඩවා අවුරුදු පහකට නොඅඩු කාලයක් අධ්‍යාපනය ලැබූ අය විය යුතුය. මෙය ඔවුන් අධ්‍යාපනය ලැබූ පාඨශාලාවල ප්‍රධානාචාර්යවරුන්ගේ සහතික මගින් ඔප්පු කළ යුතුය.

තම මව්පියන් රජයේ හෝ සංස්ථාවල මාරුවීම් සහිත සේවයකට අයත් අයදුම්කරුවන්ට තම ස්ථිර පදිංචිය ලෙස මවගේ හෝ පියාගේ උපන් ස්ථානය තෝරා ගැනීමට ඉඩ දෙනු ලැබේ.

5. තේරීමේ ක්‍රමය.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගය හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය හෝ උසස් විභාග හෝ සඳහා අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි උඩ පහත 6 වැනි ඡේදයේ දක්වෙන ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව ලබන ලකුණු සහ පහත 7 වැනි ඡේදයේ දක්වෙන සම්මුඛ පරීක්ෂණයේදී ලබන ලකුණු සළකා පත්වීම් දීම සඳහා අපේක්ෂකයන් තෝරාගනු ලැබේ.

6. ප්‍රමාණ කිරීමේ ක්‍රමය.—ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍රයේදී හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) සහතික පත්‍රයේදී අපේක්ෂකයන් ලබා ඇති ශ්‍රේණි සඳහා පහත සඳහන් පරිදි ලකුණු දෙනු ලැබේ :—

ඩී = විශිෂ්ඨ සාමාර්ථය — ලකුණු 75
සී = සම්මාන සාමාර්ථය — ලකුණු 50
එස් = සාමාන්‍ය සාමාර්ථය — ලකුණු 40

විෂයයන් 6කට වැඩි ගණනකට පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකු විසින් විෂයයන් 6කට පමණක් පෙනී සිට ඒවායින් සමත්වූ අයදුම්කරුවකුට වඩා වැඩි ලකුණු ලබා වැඩි වාසියක් අත්පත්කර ගැනීමේ ඉඩකඩ වැලැක්වීම පිණිස මුළු ලකුණු ප්‍රමාණය ගණන් බැලීම සඳහා සැළකිල්ලට භාජනය කරන්නේ ඉල්ලුම් පත්‍රයේ සඳහන් කෙරෙන විෂයයන් 6 පමණි. අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරක් සමත්වී ඇති අපේක්ෂකයෙක් අමතර ලකුණු 30 ක් ලබාගැනීමට සුදුස්සකු වෙයි. කෙසේ වෙතත් අ.පො.ස. (උසස් පෙළ) විභාගයේදී විෂයයන් හතරකට අඩුවෙන් සමත්වී ඇති අයට සහ එම විභාගයේදී සම්මාන සාමාර්ථය සහ විශිෂ්ඨ සාමාර්ථය ලබා ඇති අයට ඒ සඳහා අමතර ලකුණු ලැබෙන්නේ නැත. ශාස්ත්‍රවේදී හෝ ඊට උසස් උපාධියක් ඇති අයෙකුට අ.පො.ස. (උසස් පෙළ) සඳහා ලැබෙන ලකුණු 30 ද ඇතුළුව අමතර ලකුණු 70 ක් ලැබේ. උපාධියක් ඇති අපේක්ෂකයන්ට අ.පො.ස. (උසස් පෙළ) සඳහා වෙනම ලකුණු නොලැබේ. එකකට වැඩියෙන් ඇති උපාධි හෝ මෙහි සඳහන් කොට නොමැති වෙනත් අධ්‍යාපනික සුදුසුකම් සඳහා හෝ ලකුණු ලැබෙන්නේ නැත. අපේක්ෂකයන් සිය ඉල්ලුම්පත්‍රවල ඉහත සඳහන් ලකුණු ප්‍රමාණ කිරීමේ ක්‍රමය අනුව තමන්ම නියමිත ලකුණු ප්‍රමාණය සඳහන් කළ යුතුය.

7. සම්මුඛ පරීක්ෂණය.—ඉහත සඳහන් ක්‍රමය අනුව ප්‍රමාණ කිරීමෙන් එක් එක් අපේක්ෂකයාට ලැබෙන මුළු ලකුණු ගණන දැනගත් පසු මෙම කාර්යාලයේදී පැවැත්වෙන සම්මුඛ පරීක්ෂණයක් සඳහා අපේක්ෂකයන් සීමාසහිත ප්‍රමාණයක් කැඳවනු ඇත. එම පරීක්ෂණය පැවැත්වෙන දිනය ඊට කැඳවීමට සුදුසුකම් ලබන අපේක්ෂකයනට පුද්ගලිකව දැනුම් දෙනු ලැබේ. මෙහි පහත සඳහන් 10(iii) දරණ ඡේදයේ දක්වෙන සහතිකවල මුල් සහතික මෙම සම්මුඛ පරීක්ෂණයේදී අපේක්ෂකයන් විසින් ඉදිරිපත් කළ යුතුවේ. මෙම සම්මුඛ පරීක්ෂණයේ පරමාර්ථය වනුයේ ග්‍රාමසේවක සේවයට අපේක්ෂකයා සුදුසුදැයි විමසා බැලීමයි. ගම හා එහි ගෘහසාධනය සම්බන්ධයෙන් ඔහුගේ දැනුම පරීක්ෂා කිරීම සඳහා මෙහිදී ප්‍රශ්ණ අසනු ලැබේ.

8. සේවා කොන්දේසි.—(i) රජයේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ II වැනි ඡේදය ආරම්භයේදී දක්වා ඇති රාජ්‍ය සේවයේ තනතුරුවලට පත්වීම් කිරීමේදී බලපාන පොදු කොන්දේසිවලට අපේක්ෂකයන්ගේ අවධානය යොමු කරනු ලැබේ.

(ii) මෙම තනතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයා රාජ්‍ය භාෂා පණතේ පරමාර්ථයන් සඳහා රාජ්‍ය සේවයට නව ප්‍රවේශකයකු නම්,

(ඒ) ඔහුගේ ආධුනික සේවා කාලය අවුරුදු තුනක් වේ.

(බී) ඔහු 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පනතේ විධිවිධානවලටත් රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවතින්නාවූත් මතුවට පනවනු ලැබිය හැක්කාවූත් යම් යම් නීතිරීතිවලට හා ව්‍යවස්ථාවලටත් එකඟව කටයුතු කිරීමේ කොන්දේසි පිළිගත යුතුය.

(සී) ඔහුගේ ආධුනික සේවා කාලය තුළදී රාජ්‍ය භාෂාව වන සිංහලෙන් වැඩ කිරීමට සෑහෙන දැනුමක් ලබාගත යුතුය.

(ඩී) ආධුනික සේවා කාලය අවසානයේදී පත්වීම ස්ථිර කිරීම, අනිකුත් කරුණු අතර, පත්වීමේ දිනයේ සිට අවුරුද්දක්, අවුරුදු දෙකක් සහ අවුරුදු තුනක් ඇතුළත පිළිවෙලින් I වැනි, II වැනි සහ III වැනි ශ්‍රේණිවල සිංහල ප්‍රවීණතා පරීක්ෂණවලින් සමත්වීම උඩ රඳා පවතී. (නොඑසේ නම්, අදාලවන අවස්ථාවල I වැනි හා II වැනි ශ්‍රේණිවල පරීක්ෂණවලින් පිළිවෙලින් අවුරුද්දක් සහ අවුරුදු දෙකක් ඇතුළත සමත්වීම උඩ රඳා පවතී.) නියමිත කාලසීමා තුළදී නියමිත පරීක්ෂණවලින් සමත් නොවුවහොත් එය වැටුප් වැඩිවීම අත්හිටුවීමට හේතුවේ. නියමිත කාලයෙන් පසු තවත් හය මාසයක් ගතවන්නට පෙර පරීක්ෂණවලින් සමත් නොවුවහොත් අත්හිටවූ වැටුප් වැඩිවීම නතර කිරීමකට පරිවර්තනය කොට පරීක්ෂණය සමත්වන තෙක් හෝ මෙහි පහත (iii) (ඊ) හි ඇති විධිවිධාන අදළ වන කාලය තෙක් හෝ එම නතර කිරීම ක්‍රියාත්මක වනු ඇත.

(ඊ) ආධුනික සේවා කාලය අවසාන වන විට නියමිත සිංහල ප්‍රවීණතාව ලබා නොගත හොත් අංක 120 සහ 121 දරණ පාලන රෙගුලාසි වල නියමයක් අදල වනු ඇත.

සිංහල මාධ්‍යයෙන් සේවයට බඳවා ගනු ලබන්නන්ට ඉහත (සී), (ඩී) සහ (ඊ) යන කොන්දේසි අදල නොවේ.

(එෆ්) ග්‍රාමසේවකවරුන් ලෙස පත්කරනු ලබන අපේක්ෂකයෝ පරිපාලන දිස්ත්‍රික්කය තුළ කුමන ග්‍රාමසේවක කොට්ඨාශයක හෝ සේවය කිරීමට බැඳී සිටිති.

(ජී) තම තනතුරට අයත් රාජකාරි කටයුතු පිළිබඳ පුහුණුවක් පත්වීම් ලබන සියළුම අපේක්ෂකයන් විසින් ලැබිය යුතුය.

ආධුනික ග්‍රාමසේවකයන් වශයෙන් පත් කරණු ලබන්නේ සතුටුදයක ලෙස පුහුණුවීමක් ලබා ඇති බවටත් ආධුනික ග්‍රාම සේවකයන් වශයෙන් පත්කරනු ලැබීමට සෑම අතින්ම සුදුසුකම් තිබෙන බවටත් පරිපාලන දිස්ත්‍රික්කය භාර ආණ්ඩුවේ ඒජන්ත විසින් සහතික කළොත් පමණි.

බඳවා ගැනීමේ ආරම්භයේදීම අපේක්ෂකයන් විසින් ලැබිය යුතු මෙම පුහුණුව මාස තුනක කාලයකට වැඩි නොවනු ඇත. එම කාලය තුළදී පුහුණුවන්නන්ට මසකට රු. 50ක දීමනාවක් ගෙවනු ලැබේ. පුහුණුවීමේ කාලය තුළදී අපේක්ෂකයෝ නිවාඩු වරප්‍රසාද වලට හිමි නොවෙති.

(එච්) පුහුණුව අවසානයේදී ග්‍රාමසේවකයකු අවුරුදු තුනක කාලයක් සේවය කරනතුරු හා ඔහුගේ පත්වීම ස්ථිර කිරිම මැනවැයි ආණ්ඩුවේ ඒජන්ත සෑහිමකට පත්වනතුරු ඔහුගේ පත්වීම ස්ථිර කරනු නොලැබේ.

9. **ඉල්ලුම් පත්‍ර.**—(i) මෙම කච්චේරියෙන් හෝ ප්‍රාදේශීය ආදායම් නිලධාරී කාර්යාලවලින් ඉල්ලුම්පත්‍ර පෝර්ම ලබාගත හැක. ඉහත 4 (iv) ඡෙදයේ දැක්වෙන සුදුසුකම් ලැබීමේ විභාගය සමත් භාෂාව සහ සිංහල යන මාධ්‍ය දෙකෙන් තමන් කැමති මාධ්‍යයකින් ඉල්ලුම් පත්‍රය තමන්ගේ අත් අකුරින්ම අපේක්ෂකයන් විසින් පිරවිය යුතුය.

නියමිත ඉල්ලුම් පත්‍ර පෝර්මය කිසියම් අයුරකින් වෙනස් කිරීම තහනම්ය. නියමිත පෝර්මයේ නොඑවන ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) 1970.12.12 දිනට පෙර හම්බන්තොට කච්චේරියේ ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙන සේ ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. රාජ්‍ය සේවයේ නියුක්ත අපේක්ෂකයන්ගේ ඉල්ලුම් පත්‍රද නියමිත දිනට පෙර ආණ්ඩුවේ ඒජන්ත තැනට ලැබෙනසේ කෙළින්ම එවීම යුතුය. ඉල්ලුම් පත්‍රයේ පිටපතක් තම දෙපාර්තමේන්තු ප්‍රධානයාගේ මාර්ගයෙන්ද එවිය යුතුයි.

(iii) නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කරණු ලැබේ. ඉල්ලුම්පත්‍ර ආණ්ඩුවේ ඒජන්ත හෝ කච්චේරියේ වෙනත් නිලධාරියකුගේ පුද්ගලික නමට නොඑවිය යුතුය.

10. **සුදුසුකම් පිළිබඳ ලියකියවිලි.**—(i) ඉල්ලුම් පත්‍රය සමග කිසිම ලියකියවිල්ලක් නොඑවිය යුතුය. එහෙත් ඉල්ලුම් පත්‍රයේ ඒ ඒ කොටුවල ඉල්ලා ඇති අවශ්‍ය විස්තර සඳහන් කළයුතුය. මෙම සෑම අතින් සම්පූර්ණ නොමැති ඉල්ලුම්පත්‍ර ප්‍රතික්ෂෙප කිරීමට ඉඩ තිබේ.

(ii) සම්මුඛ පරීක්ෂණයට කැඳවීමට තේරෙන අපේක්ෂකයන් විසින් තමන්ගේ සුදුසුකම් සනාථ කිරිම සඳහා ලියකියවිලි ඉදිරිපත් කළ යුතුවේ. එම ලියකියවිලි ඉදිරිපත් කරණ ලෙස එම අපේක්ෂකයන්ට දනුම් දුන්නොත් එවිට ඒවා ඉදිරිපත් කිරීමට ඔව්හු සූදනමින් සිටිය යුත්තාහ.

(iii) පහත සඳහන් ලියකියවිලි අවශ්‍යවනු ඇත :—

(ඒ) චරිත සහතිකයක් :—

**සටහන.**—කිසියම් අපේක්ෂකයකු දැනුදු රජයේ හෝ ආධාර ලබන පාඨශාලාවක ඉගෙනුම ලබන්නෙහි නම් හෝ පාඨශාලාවෙන් අස්වූයේ මෑතකදී නම් හෝ ඔහු තම චරිතය පිළිබඳ සහතිකය ලබාගත යුත්තේ එම පාඨශාලාවේ ප්‍රධානාචාර්ය වරයාගෙනි. නොඑසේ නම්, එය සමාදාන විනිශ්චයකරුවකු, අධිනීතිඥවරයකු, නීතිඥවරයකු හෝ නොතාරිස්වරයකු, ප්‍රාදේශීය ආදායම් නිලධාරියකු හෝ වර්ෂයකට ඒකාබද්ධවැටුප රු. 4,800 හෝ ඊට වැඩි ස්ථිර රජයේ නිලධාරියකු යන අයගෙන් හෝ කිසියම් නම් දරණ එමෙන්ම අපේක්ෂකයා පිළිබඳව ලෙහෙසියෙන් විමසීම් කර බැලීමට හැකි තැනැත්තකු ගෙන් ලබාගෙන ඉදිරිපත් කළ හැක. නිකුත් කරණ තැනැත්තාගේ නම, තනතුර සහ ලිපිනය චරිත සහතිකයේ පැහැදිලිව සඳහන්වී තිබිය යුතු වේ.

දනටමත් රජයේ සේවයේ නියුක්තව සිටින අපේක්ෂකයන් චරිතය පිළිබඳ සහතිකයක් ඉදිරිපත් කිරීම අනවශ්‍යය. එහෙත් ඔවුන් විසින්, තමන්ගේ සේවය සහ හැසිරීම සතුටුදයක බවටත්, තමන් පත් කිරීම සඳහා තෝරා ගනු ලැබුවොත් ඒ සඳහා මුදා හැරීමට හැකි බවටත් තමන් සේවය කරන දෙපාර්තමේන්තු ප්‍රධානියාගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය.

(බී) අපේක්ෂකයාගේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ සහතිකයක් හෝ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් වයස පිළිබඳව නිකුත් කරණු ලැබ ඇති විශේෂ සහතිකයක් (උප්පැන්නය ලියාපදිංචි කර නොමැති අපේක්ෂකයන් වෙනුවෙනි) අනුමාන වයස පිළිබඳව සහතිකයක් පමණක් ඉදිරිපත් කළ හැකි කිසියම් අපේක්ෂකයකුගේ උපන් දිනය එම සහතිකයේ දක්වා ඇති උපන් වර්ෂයේ ජූලි මස 1 වැනි දින ලෙස සළකනු ලැබේ.

සටහන.—පාසැල් හෝ අධ්‍යාපනික කටයුතු සඳහා නිකුත් කර ඇති විශේෂ උප්පැන්න සහතිකයක් හෝ උප්පැන්න ලියාපදිංචි කිරිමේ සටහනින් උපුටාගත් සහතික කළ උධෘතයක් භාර ගනු නොලැබේ.

(ii) උප්පැන්න සහතික වෙනුවට ආදේශක වශයෙන් දිවුරුම් පෙත්සම් හෝ බෞතීස්ම සහතික භාරගනු නොලැබේ.

(iii) උප්පැන්න සහතිකයේ දැක්වෙන නම/නම් අපේක්ෂකයා සාමාන්‍යයේ භාවිතා කරන නමින්/නම්වලින් වෙනස්වේ නම්, අපේක්ෂකයාට අදළවන පරිදි 27 හෝ 28 වගන්තිය (110 පරිච්ඡෙදය) යටතේ උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහන සංශෝධනය කරවා ගැනීම පිණිස වහාම ක්‍රියා කළ යුතුය.

රජයේ ස්ථිර තනතුරු උසුලන, අංක 394 සහ 1957 අගෝස්තු 18 වැනි දින දරණ භාණ්ඩාගාර චක්‍රලේඛය අනුව තම නම් වෙනස්කර ඇති අපේක්ෂකයන් උප්පැන්නය ලියාපදිංචි කිරීමේ සටහනේ ඇති තමන්ගේ නම් සංශෝධනය කිරීම පිණිස ක්‍රියා කිරීමට අවශ්‍ය නැත.

(සී) ලාංකික පුරවැසියකු වශයෙන් ලියාපදිංචි කළ සහතිකය හෝ පරම්පරාවෙන් පුරවැසියකු බව පිළිගත් බවට නිකුත් කර ඇති මුල් රාජකාරි ලිපිය (අදළවූ විට).

(ඩී) අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ මුල් සහතිකය හෝ සහතිකය නිකුත් කර නොමැති විටකදී, වෙනත් අධ්‍යාපනික ලියකියවිලි උදා. : ලංකා අ.පො.ස. (සාමාන්‍ය පෙළ) පෞද්ගලික අයදුම්කරුවන් වෙත නිකුත් කර ඇති ප්‍රතිඵල සටහන හෝ අපේක්ෂකයාගේ පාසැලේ ප්‍රධානියා නිකුත් කළ මුල් ලිපිය.

(ඊ) ඉහත 4 (vi) යටතේ සුදුසුකම් ලබා ඇති බවට සාක්ෂි වශයෙන් සහතික.

(iv) ඉල්ලුම් පත්‍ර එවන අවස්ථාව වන විට අවශ්‍ය සියළුම ලියකියවිලි සූදනමින් තබාගන්නා ලෙස අපේක්ෂකයන් වෙත උපදෙස් දෙනු ලැබේ. කිසියම් අපේක්ෂකයෙකු සම්මුඛ පරීක්ෂණයේදී අවශ්‍ය ලියකියවිලි ඉදිරිපත් කිරීමට අපොහොසත් වූවහොත් ඔහුගේ ඉල්ලුම් පත්‍රය ප්‍රතික්ෂෙප කෙරෙනු ඇත.

11. **අසත්‍ය විස්තර සැපයීමට දඬුවම්.**—මෙම නිවේදනයේ දැක්වෙන රෙගුලාසිවලට අනුව අපේක්ෂකයකු නුසුදුසු යයි ඔප්පු වූවහොත් ඔහු මෙම තනතුරට තෝරා ගැනීමට පෙර හෝ තෝරාගත් පසුව හෝ ඕනෑම අවස්ථාවක ඔහුගේ ඉල්ලීම අවලංගු කිරීමට භාජනය විය හැකිය. අපේක්ෂකයන් විසින් සපයා ඇති කිසියම් තොරතුරක් ඔහු දන්නා පරිදි අසත්‍ය බව ඔප්පු වූවහොත් හෝ කිසියම් වැදගත් කරුණක් හිතාමතාම යටපත් කළහොත් හෝ සේවයේ යෙදී සිටින කාළය තුළ ඕනෑම අවස්ථාවකදී ඔහු ඉල්ලුම් කිරීමට නුසුදුස්සකුව සිටි බව ඔප්පු වූවහොත් වහාම සේවයෙන් පහකිරීමට හෝ සේවය නතර කිරීමට ඉඩ ඇත.

මෙම නිවේදනයෙහි දක්වා ඇති නියමයන් දැඩිලෙස නොපිළිපදින අපේක්ෂකයන්ගේ අයදුම්පත්‍ර ප්‍රතික්ෂෙප කෙරෙනු ඇත.

12. **වෛද්‍ය පරීක්ෂණය.**—පත්කරනු ලැබීම සඳහා තෝරාගනු ලබන අපේක්ෂකයන් තමන් ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරිම සඳහා ශාරීරිකව සුදුසු බවට සහතික කෙරෙන වෛද්‍ය පරීක්ෂණයකින් සමත්විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වන අපේක්ෂකයන් පුහුණුව සඳහා තෝරාගනු නොලැබේ.

13. මෙම රෙගුලාසිවලට ඇතුළත් නොවන ඕනෑම කාරණයක් පිළිබඳව තීරණයක් ගැනීම ආණ්ඩුවේ ඒජන්තවරයාගේ අභිමතය පරිදි කෙරෙනු ඇත.

සෙ. වි. ගුණවර්ධන,
හම්බන්තොට දිස්ත්‍රික්කයේ ආණ්ඩුවේ ඒජන්ත.

1970 නොවැම්බර් මස 3 වැනි දින,
හම්බන්තොට, කච්චේරියේ දීය.

11–396—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ගමනාගමන මණ්ඩලයේ ඉංජිනේරු කොට්ඨාශයේ පුරප්පාඩු

### II වෙනි පංතියේ තනතුරු

ලංකා ගමනාගමන මණ්ඩලීය ඉංජිනේරු කොට්ඨාශයේ පහත සඳහන් ඇබෑර්තු සඳහා ලාංකික පුරවැසියන්ගෙන් ඉල්ලුම් පත්‍ර කැඳවනු ලැබේ :—

**(1) II වෙනි පංතියේ විදුලි කාර්මිකයින්.**

**සුදුසුකම් :**

**වයස.**—1970.11.26 වෙනි දිනට අවුරුදු 23 ටත් 35 ටත් අතර වීම.

**අධ්‍යාපනය.**—අඩුම වශයෙන් 5 වෙනි ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබීම.

**වෘත්තීය පුහුණුව හා පළපුරුද්ද.**—පිළිගත් ඉංජිනේරු ආයතනයක අවුරුදු 2 කට නොඅඩු කාලයක වෘත්තීය පුහුණුව හා පුහුණුවීමෙන් පසු අවුරුදු 5 කට නොඅඩු කාලයක පහත සඳහන් සේවා පිළිබඳ පළපුරුද්ද :—

එක සහ තෙකලා විදුලි මෝටර්, මෝටර් ක්‍රියාත්මක සහ එයට අදල අනිකුත් උපකරණ සවිකිරීම සහ නඩත්තු කිරීම, සැරිකඩනයන්, වායු සම්පිණ්ඩනයන් සහ විදුලි බලයෙන් ක්‍රියා කරන අවි ආයුධ සවිකිරීම සහ නඩත්තු කිරිම, එංගලන්තයේ විදුලි ඉංජිනේරු ආයතනයේ නීති මාලාව සහ වෙනරු සහ මිහිරොද පිරික්සුම පිළිබඳ දැනීමක් ද තිබිය යුතුයි.

(2) II වෙනි පංතියේ මෝටර් ආමෙචර් ඔතන්නෝ

**සුදුසුකම්.—**

**වයස.**—1970.11.26 වෙනි දිනට අවුරුදු 23 ටත් 35 ටත් අතර වීම.

**අධ්‍යාපනය.**—අවම වශයෙන් 5 වෙනි ශ්‍රේණියේ සාමාර්ථයක් ලබා තිබීම.

**වෘත්තීය පුහුණුව හා පළපුරුද්ද.**—අවුරුදු 2 කට නොඅඩු කාලයක් තුළ පහත සඳහන් සේවා පිළිබඳ පිළිගත් විදුලි කර්මාන්ත ශාලාවක වෘත්තීය පුහුණුව හා පුහුණුවීමෙන් පසු අවුරුදු 5 කට නොඅඩු කාලයක් තුළ පළපුරුද්ද ;

සියලුම වර්ගයේ ඒ.සී. මෝටර්, ආමෙචර්, විදුලි ජනක සහ තරාපැට් පිළිබඳ කම්බි එතීම සහ විදුලි බලයෙන් ක්‍රියා කරන අවි ආයුධ, මෝටර් ක්‍රියාත්මක සහ එය පාලක උපකරණ අලුත්වැඩියා කිරීම.

**පඩි ක්‍රමය.**—සියලු දීමනාවන් ඇතුලුව මසකට—රු. 220—5×4, 10×9—රු. 330.

සුදුසුකම් ලත් අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට සහ වෘත්තීය පරීක්ෂණයකට භාජනය කිරීමෙන් පසු තෝරාගනු ලැබේ.

නියමිත සුදුසුකම් ඇති අයදුම්කරුවන් මෙහි පහත දැක්වෙන ආකෘති පෝරමය අනුව ඉල්ලුම්පත්‍ර පිළියෙල කර කොළඹ 5, කිරුළ පාරේ, 200 වෙනි ස්ථානයේ, ලංකා ගමනාගමන මණ්ඩලයේ සේවක මණ්ඩල කළමනාකාර තැන වෙත එවිය යුතුයි. ඉල්ලුම් පත්‍ර බහාලන ලියුම් කවරයේ වම්පස කෙළවරේ "පීඩී/ඇජ්" ශාඛාව යනුවෙන් සඳහන් කළ යුතුයි.

ඉල්ලුම් පත්‍ර 1970.11.26 වෙනි දින තෙක් භාරගනු ලැබේ.

ලංකා ගමනාගමන මණ්ඩලයේ
වැඩබලන සේවක මණ්ඩල කළමනාකාර තැන.

1970 ඔක්තෝබර් මස 30 වෙනි දින,
කොළඹ 5, කිරුළ පාරේ,
200 වෙනි ස්ථානයේ දිය.

අයදුම්පත්‍ර ආකෘතිය

ලං.ග.ම. ඉංජිනේරු කොට්ඨාශයේ II වෙනි පංතියේ තනතුරක්

1. ඉල්ලුම් කරන තනතුර :————.
2. ඉල්ලුම්කරුගේ සම්පූර්ණ නම :————.
3. ලිපිනය :————.
4. උපන් දිනය :————.
   1970.11.26 වෙනි දිනට වයස : අවුරුදු :————. මාස :————.
   (උප්පැන්න සහතිකයේ මුල් පිටපත නොව අනු පිටපතක් ඇමිණියයුතුයි)
5. අධ්‍යාපන සුදුසුකම් :————.
   (සමත්වූ ඉහළම ශ්‍රේණියත්, භාෂා මාධ්‍යයත්, එනම් : සිංහලද, දෙමළද, ඉංග්‍රීසිද යන වග සඳහන් කරන්න.)
6. වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද :————.
   (වෘත්තීය පුහුණුව සහ පළපුරුද්ද ලැබූ පිළිගත් ආයතනයේ නම සහ කාලසීමාව සඳහන් කළ යුතු අතර, එම සහතිකවල පිටපතක්ද ඇමිණිය යුතුයි.)
7. ආදායම් දිස්ත්‍රික්කය :————.
8. ඡන්ද කොට්ඨාශය :————.

මෙම අයදුම් පතෙහි මවිසින් සපයා ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත්, ලේඛනගත සාක්කිවලින් ඒවා සනාථ කලහැකි බවත්, මෙයින් සහතික කරමි. මෙහි යම්කිසි අසත්‍යයක් හෝ සාවද්‍ය තොරතුරක් සඳහන් කොට තිබෙන බව මා තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම එම තනතුරට මා නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුනිනම් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහකරනු ලබන බවත් මම දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

11-361—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ වින්නඹු සේවිකා තනතුර

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ වින්නඹු සේවිකා තනතුරක් සඳහා පහත දැක්වෙන සුදුසුකම් ලබා ඇති ගැහැණු අපේක්ෂිකාවන් ගෙන් පමණක් අයදුම්පත් භාරගනු ලැබේ:—

**අවශ්‍ය සුදුසුකම්.—**

(1) ලාංකිකයෙකු විය යුතුයි.

(2) මනා ශරීර සෞඛ්‍යයෙන් හා යහපත් කල්ක්‍රියාවෙන් යුක්ත අයෙකු විය යුතුය.

(3) කණිෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් සමත්වී සිටිය යුතුය.

(4) සෞඛ්‍ය සේවා අධිකාරීගේ සහතිකයක් ලබාගත් ලියාපදිංචි වූ සෞඛ්‍ය වින්නඹු සේවිකාවක් විය යුතුයි.

**වයස.**—අයදුම්පත් භාරගන්නා අවසාන දින වන විට වයස අවුරුදු 35 ට නොවැඩි අයෙකු විය යුතුයි.

**වැටුප.**—රු. 750—13×42—7×72—රු. 1,800 මූලික වැටුපට සමාන ඒකාබද්ධ වැටුපක් ගෙවනු ලැබේ.

තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් රහිතය. එහෙත් සේවක අර්ථ සාධක අරමුදලට තෝරාගනු ලබන අයදුම්කාරිය දායිකාවක් විය යුතුය.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩල සීමාව තුළ පදිංචි, ඉහත දක්වෙන සුදුසුකම් ලබා ඇති අපේක්ෂිකාවන් කෙරෙහි වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

තම ලිපිනය ලියූ මුද්දරයක් සහිත දිග ලියුම් කවරයක් එවීමෙන් මෙම කාර්යාලයෙන් ලබා ගත හැකි ආකෘති පත්‍රවල පුරවන ලද අයදුම්පත්‍ර 1970.11.30 දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ "අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ සාමාන්‍යාධිකාරී" නමට ලිඛිත තැපැලෙන් එවිය යුතුය.

අනුරාධපුර සංරක්ෂණ මණ්ඩලයේ
සාමාන්‍යාධිකාරී

1970 නොවැම්බර් මස 1 වන දින.

11-322—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

මගේ අංකය : ටීආර්/6/168

## පරිපාලන අධ්‍යයන ආයතනය

### කළමනාකාරිත්ව සංවර්ධන වැඩ සටහන

හැඳින්වීම

1 : 1 පරිපාලන අධ්‍යයන ආයතනය විසින් කළමනාකාරිත්ව සංවර්ධන වැඩ සටහනෙහි, 1971 වැනි වර්ෂය සඳහා වූ ස්වකීය අධ්‍යයන පාඨමාලා ප්‍රකාශයට පත් කර ඇත. මෙම කළමනාකාරිත්ව වැඩ සටහනට සති 10 ක්වූ කාලයක කළමනාකාරිත්ව සංවර්ධන පාඨමාලාවක් අඩංගු වෙයි. විශේෂ වෛකල්පික පාඨමාලා පෙළකින් පරිපූරණය කළ හැකි මෙම පාඨමාලා වලින්, එක් එක් පාඨමාලාවට පැය 100 සිට පැය 125 දක්වා පන්ති වැඩ ඇතුළත් වේ.

1 : 2 එක් එක් විෂයයන් මාලාවක් වශයෙන් නොව, එකට සම්බන්ධවූ වැඩ සටහනක් වශයෙන් පිරිනැමෙන මෙම කළමනාකාරිත්ව සංවර්ධන පාඨමාලාවට පහත සඳහන් අධ්‍යයන ක්ෂෙත්‍රයන් ඇතුළත් වේ :—

(1) අර්ථ ශාස්ත්‍රය හා සමාජ ප්‍රතිපත්තිය
(2) කළමනාකාර අර්ථ ශාස්ත්‍රය
(3) කළමනාකාරිත්වය සහ සංවිධානය
(4) සංවර්ධන පරිපාලනය පිළිබඳ සැළැස්ම හා ක්‍රියා මාර්ග.

1 : 3 පරිපූරක වෛකල්පික පාඨමාලා වශයෙන් පිරිනැමෙනුයේ පහත සඳහන් විෂයයන්ය :—

(1) රාජ්‍ය පෞද්ගලික කළමනාකාරිත්වය
(2) කාර්මික සම්බන්ධතා
(3) ක්‍රියාකාරි පර්යේෂණ
(4) යෝජනා ක්‍රම සකස් කිරීම, මිළ නියම කිරීම සහ කළමනාකාරිත්වය
(5) සමාජ සහ ප්‍රජා සංවර්ධන කළමනාකාරිත්වය
(6) නිෂ්පාදනය හා සැපයුම් කළමනාකාරිත්වය
(7) පොදු මුදල්
(8) කෘෂිකාර්මික අර්ථ ශාස්ත්‍රය
(9) ප්‍රවාහණ අර්ථ ශාස්ත්‍රය
(10) බෙදාහැරීමේ සහ අලෙවි කිරීමේ අර්ථ ශාස්ත්‍රය
(11) ජාත්‍යන්තර අර්ථ ශාස්ත්‍රය
(12) සංවර්ධන අර්ථ ශාස්ත්‍රය (ලංකාව ගැන විශේෂ සැළකිල්ලෙන් යුතුවය)
(13) අධ්‍යාපන පරිපාලනය
(14) සෞඛ්‍ය පරිපාලනය

(15) පොලිස් පරිපාලනය
(16) පළාත් පාලනය
(17) ජාත්‍යන්තර සබඳතා.

කළමනාකාරිත්ව සංවර්ධන පාඨමාලාව අවසානයෙහි දී ඉල්ලුම්කරුවන් විසින් විශේෂ වෛකල්පික පාඨමාලා තෝරාගනු ලබනු ඇතැයි බලාපොරොත්තු වනු ලැබේ.

**2. සුදුසුකම හා ඉල්ලුම් කිරීමේ ක්‍රමය—**

2 : 1 ඉල්ලුම්කරුවන්, රාජ්‍ය සේවයෙහි හෝ රාජ්‍ය අංශයේ සංස්ථාවක හෝ කළමනාකාර තනතුරක පස් අවුරුදු සේවයක් සම්පූර්ණ කර තිබිය යුතුය. ඉල්ලුම්කරුවන්, 1971 දෙසැම්බර් 31 වැනි දිනට වයස අවුරුදු 45 ට අඩු විය යුතුය.

2 : 2 ආදර්ශ ඉල්ලුම් පත්‍ර ආකෘතියක් පහත සඳහන් කර ඇත. ඉල්ලුම් පත්‍ර, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ සංස්ථා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කර සිටිය යුතු අතර, අභ්‍යාස පාඨමාලාවලට පැමිණීමට හැකිවනු පිණිස පූර්ණ කාලීව ඉල්ලුම්කරුවන් මුදා හරිනු ලබන බැව් ඔහු විසින් සහතික කරනු ලැබිය යුතුය. මෙම ඉල්ලුම්පත්‍ර 1970 දෙසැම්බර් මස 4 දිනට පෙර පරිපාලන අභ්‍යාස ආයතනයේ අධ්‍යක්ෂ වෙත එවිය යුතුයි.

**3. තෝරා ගැනීම.**—ඉල්ලුම්කරුවන් තෝරා ගනු ලබන්නේ පරි පාලන අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ ගේ අභිමතය අනුවය. කිසියම් විශේෂකාල සීමාවක් තුළදී විශේෂ පාඨමාලාවක් සඳහා අපේක්ෂකයෙකු තෝරා ගනු ලැබෙයයි සහතික කිරීමට නොපිළිවන. කිසියම් පාඨමාලාවක් සඳහා ඉල්ලුම්කරුවන් තෝරා ගනු ලැබීමේදී, විවිධ සේවාවන් පිළිබඳ තුලිත මිශ්‍රණයක් ඇති කිරීමේ අවශ්‍යතාවය, හික්මීම හා පළපුරුද්ද ගැන විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

**4. රාජ්‍ය කළමනාකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමා උපාධිය.**

4 : 1 පරිපාලන අධ්‍යයන ආයතනය විසින්, රාජ්‍ය කළමනාකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමා උපාධියක් පිරිනැමීම සඳහා 1971 කේ දෙසැම්බරයේ සිට වාර්ෂික විභාගයක් පවත්වනු ලැබේ. මේ විභාගය, පහත දැක්වෙන පරිදි, කොටස් දෙකකින් යුක්ත වනු ඇත. :—

(i) **කොටස.**—පහත දැක්වෙන විෂයයන් ගෙන් එක් එක් ප්‍රශ්ණ පත්‍රයකි :

(1) අර්ථ ශාස්ත්‍රය හා සමාජ ප්‍රති විෂය
(2) කළමනාකාර අර්ථ ශාස්ත්‍රය
(3) කළමනාකාරිත්වය හා සංවිධානය
(4) සංවර්ධන පරිපාලනය පිළිබඳ සැලැස්ම සහ ක්‍රියා මාර්ග

(ii) **කොටස.**—පහත දැක්වෙන කවර විෂයයකින් හෝ ප්‍රශ්න පත්‍ර දෙකකි :

(1) රාජ්‍ය පෞද්ගලික කළමනාකාරිත්වය
(2) කාර්මික සම්බන්ධතා
(3) ක්‍රියාකාරී පර්යේෂණ
(4) යෝජනා ක්‍රම සකස් කිරීම, මිළ නියම කිරීම හා කළමනාකාරිත්වය
(5) සමාජ සහ ප්‍රජා සංවර්ධන කළමනාකාරිත්වය
(6) නිෂ්පාදනය සහ සැපයුම් කළමනාකාරිත්වය
(7) පොදු මුදල්
(8) කාර්මික අර්ථ ශාස්ත්‍රය
(9) ප්‍රවාහන අර්ථ ශාස්ත්‍රය
(10) බෙදා හැරීමේ හා අලෙවි කිරීමේ අර්ථ ශාස්ත්‍රය
(11) ජාත්‍යන්තර අර්ථ ශාස්ත්‍රය
(12) සංවර්ධන අර්ථ ශාස්ත්‍රය (ලංකාව ගැන විශේෂ සැළකිල්ලක් යුතුවයි)
(13) අධ්‍යාපන පරිපාලනය
(14) සෞඛ්‍ය පරිපාලනය
(15) පොලිස් පරිපාලනය
(16) පළාත් පාලනය
(17) ජාත්‍යන්තර සබඳතා.

4 : 2 රාජ්‍ය කළමනාකාරිත්වය පිළිබඳ ඩිප්ලෝමා උපාධිය පිරිනැමීම සඳහා ප්‍රශ්න පත්‍ර හයෙන් එක් එක් ප්‍රශ්න පත්‍රයෙන් සියයට 45 ක සමර්ථතා තත්ත්වයකට පැමිණීම අපේක්ෂකයෙකුගෙන් බලාපොරොත්තු වනු ලැබේ. අපේක්ෂකයා ඩිප්ලෝමා උපාධියේ ii වැනි කොටසට යෑමට ප්‍රථම පළමු කොට, i වෙනි කොටසින් සුදුසුකම් ලැබිය යුතුය. i වෙනි හා ii වෙනි කොටස් වලින් සමත්ව ඩිප්ලෝමා උපාධිය ලත් අපේක්ෂකයෙකුට කැමති නම් නැවත වරක් ii වැනි කොටසට පෙනී සිටීමට හැකි වන අතර, ඒ සඳහා ඔහුට සහතිකයක්ද ප්‍රදානය කරනු ලැබේ. මොනම හේතුවක් නිසාවත්, මෙම විභාගයෙන් කවර කොටසකින්වුව, නිදහස් කිරීමක් කරනු නොලැබේ.

4 : 3 මේ ඩිප්ලෝමා උපාධිය පශ්චාත් උපාධි තත්ත්වයක් ගනී. මේ එක් එක් විෂයයන් පිළිබඳවූ සවිස්තර නිර්දේශ පත්‍ර, පරිපාලන අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂගෙන්, ඉල්ලුම් කිරීමෙන් ලබාගත හැකිය. ඩිප්ලෝමා උපාධිය පිළිබඳ විභාගය සඳහා අපේක්ෂකයෙකු ඉදිරිපත්වීමට ප්‍රථම ඔහු පරිපාලන අධ්‍යයන ආයතනය විසින් පවත්වාගෙන යනු ලබන පාඨමාලාවලට සහභාගිවීමට අමතරව, පාථුල වශයෙන් ස්වාධ්‍යයන කටයුතුවල යෙදීම අවශ්‍යය.

4 : 4 විභාගය සකස් කරනු ලබනුයේ, කළමනාකාරිත්වය පිළිබඳ නවීන උපකරණ හා ශිල්පීය ක්‍රම ගැන අපේක්ෂකයන් තුළ කොපමණ හැඟීමක් හා වැටහීමක් තිබේද ස්ථිර වශයෙන්ම ගැටළුවලට මුහුණ පෑමට සිදුවන අවස්ථාවලදී ඒවා පිළිබඳ තීරණයනට එළඹීම සඳහා එම උපකරණ හා ශිල්පීය ක්‍රම භාවිතා කිරීමට ඔහු තුළ කොපමණ දුරට හැකියාවක් ඇත්ද යන්න ගැන පමණක් නොව, ඔහු විසින් තෝරා ගනු ලැබ ඇති රාජ්‍ය කළමනාකාරිත්වයේ විශේෂිත ක්ෂෙත්‍රයෙහි කොපමණ පෘථුල දැනුමක් ඔහු තුළ තිබේද යන්න ගැනත් පරීක්ෂා කර බැලීම සඳහාය.

4 : 5 මේ ඩිප්ලෝමා උපාධි විභාගය සඳහා ඉල්ලුම් පත්‍ර කැඳවනු ලබනුයේ එක් එක් අවුරුද්දේ අගෝස්තු මාසයේ දී ය.

**5. පාඨමාලාවල දිනයන්.**—1971 සඳහා වූ කළමනාකාරිත්ව සංවර්ධන පාඨමාලා පවත්වනු ලබනුයේ පහත දැක්වෙන සේය :—

| | | |
|---|---|---|
| (i) | 71. 1. 5 | 71. 3.17 |
| (ii) | 71. 4.18 | 71. 6.29 |
| (iii) | 71. 7.16 | 71. 9.25 |
| (iv) | 71.10. 4 | 71.12.15 |

එක් එක් විශේෂිත වෛකල්පික පාඨමාලා පවත්වනු ලබන දිනයන් එක් එක් අපේක්ෂකයා වෙත වෙන වෙනම දැනුම් දෙනු ලැබේ.

එච්. එස්. වනසිංහ,
පරිපාලන අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ.

කොළඹ, ලෝංඩන් පෙදෙසේ,
අංක 28/10, දරන ස්ථානයේ,
පරිපාලන අධ්‍යයන ආයතනයේ දී ය.

## පරිපාලන අධ්‍යයන ආයතනය

**1971, කළමනාකාරිත්ව සංවර්ධන වැඩ සටහන**

### I වෙනි කොටස

1 . සම්පූර්ණ නම :————.
(පෙළපත් නාමය යටින් ඉරිගසන්න—කලු අකුරෙන්)

2. සේවය සහ ශ්‍රේණිය :————.

3. වයස :————, උපන් දිනය :————.

4. දෙපාර්තමේන්තුව :————.

5. තනතුර නාමය :————.

6. අධ්‍යාපනික සටහන් :————.
(උපාධිය, ඩිප්ලෝමා උපාධිය සහ සහතිකය සහ උපාධිය හෝ ඩිප්ලෝමා උපාධිය සඳහා අධ්‍යයනය කළ විෂයයන්)

7. අභ්‍යාස පාඨමාලා, සම්මන්ත්‍රණ, කර්මාන්ත ශාලා සහ වෙනත් යම් යම් අන්දමේ පුහුණුවීම් පිළිබඳ විස්තර :————.

8. ඔබ, අභ්‍යාස මාලාව අනුගමනය කිරීමට බලාපොරොත්තු වන කාල සීමාව සඳහන් කරන්න :—

| | |
|---|---|
| 71. 1. 5—71. 3.17 | 71. 7.16—71. 9.25 |
| 71. 4.18—71. 6.29 | 71.10. 4—71.12.15 |

9. ලිපිනය හා ටැලිපෝන් අංකය :————.

මා විසින් මෙහි කරන ලද ප්‍රකාශයන් මා හොඳින්ම විශ්වාස කරන හැටියට, සත්‍ය බවත්, නිවැරදි බවත්, (සම්පූර්ණ නම) ———— වන මම මෙයින් සහතික කර සිටිමි.

පුහුණුව සඳහා පිළිගනු ලැබෙතොත්, පරිපාලන අධ්‍යයන ආයතනයේ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලැබිය හැකි යම් යම් කොන්දේසි වලින් බැඳීමට ද උපදෙස් පිළිපැදීමටද මම මෙයින් පොරොන්දු වෙමි.

————,
අත්සන.

### II වෙනි කොටස

———— මහතා තෝරා ගනු ලැබුවහොත් අභ්‍යාස පාඨ මාලාවට සහභාගි වීමට ඔහුට හැකිවනු පිණිස ඔහු සම්පූර්ණ වැටුප් පිට මුදාහරිනු ලබනවාත් හැර, එම කාල සීමාව ඇතුළතදී, ඔහුට මොනම රාජකාරි කටයුත්තක් හෝ පැවරීමක් හෝ භාර නොදෙනවාද ඇත.

————,
නාම යෝජනා බලධාරියාගේ අත්සන සහ තනතුරු නාමය.

11–298—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

(ආ) වැඩවල ස්වභාවය අනුව ඔවුන් විසින් සාමාන්‍ය කාර්යාල කාලවේලා තුළ වැඩ කිරීම අවශ්‍ය වන්නේය. පාසැල්වල පවතින අන්දමට පෙර පෝය දින නියම වශයෙන් වැඩ කරන දිනයක් ලෙස සලකනු නොලැබේ.

(ඉ) " පාසැල් නිවාඩු කාලයක " සම්පූර්ණ කාල පරිච්ඡෙදය තුළ හෝ ඉන් කොටසක් තුළ වැඩ කරන සේ ඔවුන්ට නියම කිරීමට ඉඩ ඇත. එසේවූ විට, " පාසැල් නිවාඩුව " තුළ වැඩ කළ දින ගණනට සමාන දින ගණනක් වැඩට නොපැමිණ සිටීමට ඔවුන්ට අවසර දෙනු ලැබේ. විෂය මාලා සංවර්ධන අංශයෙහි කාර්ය පැවරී කාල පරිච්ඡෙදය තුළම ක්‍රියාත්මක වන සේ සහභාගි වන්නන් විසින් මෙම අනුග්‍රහය ඉල්විය යුතුය. නිවාඩු පිළිබඳ කොන්දේසි ඔවුන්ගේ ස්ථිර තනතුරුවලට අදාල වන පරිදි වේ.

5. සාමාන්‍ය.—(අ) සහභාගි වන්නන් ගනු ලබන්නේ පළමු කොට හය මාසයේ සිට එක් අවුරුද්ද දක්වාවූ කාල පරිච්ඡෙදයක් තුළ කාර්ය පැවරීම් සඳහාය. එසේ තෝරාගැනීම පූර්ණ කාලීනව හෝ අර්ධ කාලීනව වැඩ කිරීම සඳහා විය හැක. මෙම අංශයේ පැවරෙන වැඩ කටයුතු සාමූහිකව කිරීම අවශ්‍ය වන්නේය. කාර්ය පැවරුම අවසානයේදී විෂය මාලා සංවර් ධන අංශයෙහි කාර්ය පැවරීමට කලින් සහභාගිකයන් දැරූ තනතුරුවලටම ඔවුන් ආපසු යැවීමට සෑම ප්‍රයත්නයක්ම දරනු ඇත.

(ආ) පූර්ණ කාල වැඩ පැවරෙන අයට කාර්ය පැවරුමේ කාල පරිච්ඡෙදය තුළ කොළඹ හෝ වෙනත් ස්ථානයක නැවතී සිටීමට සිදුවිය හැකිය. එසේ වූ විට, ස්ථාන මාරු නියෝගයක් නිකුත් කරනු ලැබේ.

(ඉ) මෙම කාර්ය පැවරුම පාසල්වල අධ්‍යාපනය වර්ධනය කිරීමෙහි ලා අතිශය වැදගත්කමකින් යුක්ත වන හෙයින් එක් එක් සහභාගිවන්නා විසින් ක්‍රියා කර ඇති ප්‍රවීණතා මට්ටම සුපරීක්ෂාකාරීව නිරීක්ෂණය කොට කාර්ය පැවරුම නිම වීමේදී, ප්‍රවීණතා මට්ටම දක්වෙන සහතිකයක් අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්ගේ අත්සන යටතේ නිකුත් කරනු ලැබේ.

6. මුද්‍රිත ඉල්ලුම්පත්‍ර නොමැතිය. ඉල්ලුම්පත්‍ර මීට යාකර තිබෙන ආදර්ශ ආකෘතිය අනුව සකස් කර ගනු ලබන ආකෘතිවල පිළියෙල කර, තමන් සේවයේ නියුක්ත පාසැලේ ප්‍රධානයා හා ස්වකීය ප්‍රදේශයේ අධ්‍යක්ෂ වරයා මගින් එවිය යුතු වේ. අදහස් කරනු ලබන කාර්යය සඳහා ගුරු භවතාගේ සුදුසුකම හා ඔහුට ඇති රුචිය සම්බන්ධයෙන් ඒ දෙපොළම විසින් අදහස් දක්විය හැකිය.

7. නියමිත දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. එබැවින් පාසැලේ ප්‍රධානයා ළඟදී හෝ ප්‍රාදේශීය කාර්යාලයේදී හෝ ප්‍රමාදවීමට ඉඩ ඇති හෙයින් ඉල්ලුම්කරුවන් විසින් තමන්ගේ ඉල්ලුම්පත්‍ර හැකි තරම් කල් ඇතිව එවිය යුතු වේ.

පී. උඩගම,
අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල්.

1970 නොවැම්බර් සම 2 වැනි දින,
කොළඹ 2,
අධ්‍යාපන අමාත්‍යාංශයේ දීය.

## ආදර්ශ ආකෘති පත්‍රය

කොළ 2, මැලේ වීදියේ,
අධ්‍යාපන අමාත්‍යාංශයේ,
(මූලික අධ්‍යාපනය පිළිබඳ)
නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් වෙතය.

### විෂයමාලා සංවර්ධන කාර්යයෙහි සහභාගිවීමේ අයදුම්පත

1. සම්පූර්ණ නම :————.
2. (i) පාසැල් ලිපිනය :————.
   (සියළුම ලියකියවිලි මෙම ලිපිනයට එවනු ලැබේ)
   (ii) පාසැල් නිවාඩු කාලයේදී ලිපිනය වෙනස් නම් එය :————.
3. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
4. විවාහකද ? අවිවාහකද ? යන වග :————.
5. උපන් දිනය :————.
6. ජාතිය :————.
7. දැනට දරණ තනතුර :————.
   ගුරුවරයෙකු වශයෙන් ලියා පදිංචි කළ අංකය :————,
   ශ්‍රේණි තනතුරක් ඇත්තේ නම්, එම ශ්‍රේණිය හා එම ශ්‍රේණියට පත් කළ දිනය :————.
8. සේවා සටහන :—

| පාසැල | සිට | දක්වා |
|---|---|---|

9. ශාස්ත්‍රීය සුදුසුකම් :—
   (අ) (i) උපාධිය :————.
   (ii) *උපාධි විෂයයෝ :————.
   (iii) පන්තිය/කොටස :————.
   (iv) වර්ෂය :————.
   (v) විශ්ව විද්‍යාලය :————.
   *ගෞරව/සාමාන්‍ය
   (ආ) ප්‍රථම පරීක්ෂණයට/අන්තර් මධ්‍යම පරීක්ෂණයට කලා/විද්‍යා පෙනී සිටි විෂයයෝ :————.
   (ඉ) පශ්චාත් උපාධි විභාගවලින් සමත්වීනම් පශ්චාත් උපාධියේ විෂයයන් පිළිබඳ විස්තර හා විශ්ව විද්‍යාලය :————.
10. වෘත්තීය සුදුසුකම් :—
   (i) විභාගයේ නම හෝ සහතික පත්‍රය :————.
   (ii) අධ්‍යයන කාල පරිච්ඡෙදය :————.
   (iii) ආයතනය :————.
   (iv) සමත් වූ විෂයයෝ :————.
   (v) සමර්ථ වූ ශ්‍රේණිය :————.
11. වෙනත් පශ්චාත් උපාධි සුදුසුකම් තිබේ නම්, ඒ පිළිබඳ විස්තර :————.
12. ඉල්ලුම්කරු සහභාගිවීමට කැමති විෂය ප්‍රසරය :————.
13. එක් එක් කරුණ යටතේ සවිස්තරව මෙම විෂය ප්‍රසරයෙන් ලබා ඇති විශේෂ සුදුසුකම් සඳහන් කරන්න.
   (අ) :————.
   (ආ) :————.
   (ඉ) :————.
   (ඊ) :————.
   (උ) :————.
   (ඌ) :————.
   (එ) :————.
   (ඒ) :————.
   (ඔ) :————.
14. ඉගැන්වීමේ කාර්යයන් පිළිබඳ විස්තර :—

| වර්ෂය | විෂය/විෂයයෝ, මට්ටම හෝ පන්තිය | සතියකට පැය ගණන |
|---|---|---|
| 1970 | | |
| 1969 | | |

15. ඉල්ලුම්කරු විසින් හදරණ ලද හෝ දැනට උගන්වනු ලබන විෂයයන් සම්බන්ධ කිසියම් ප්‍රකාශනයක් වේ නම් ඒ පිළිබඳ විස්තර :————.
16. තෝරා ගැනීම සඳහා යෝග්‍යතාව පිළිබඳ ඔබට ඉදිරිපත් කළ හැකි විශේෂ හේතු :————.

මෙම අයදුම්පතෙහි ම විසින් සපයා ඇති තොරතුරු නිවැරදි බවට සහතික කරමි.

————,
ඉල්ලුම්කරුගේ අත්සන.

දිනය :————.

* නොයෙදෙන වචන කපා හරින්න.

විද්‍යාලයාධිපතිගේ නිර්දේශය†

————,
විද්‍යාලයාධිපති.
————,
විද්‍යාලය.

දිනය :————.

ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂගේ නිර්දේශය†

————,
ප්‍රාදේශීය අධ්‍යාපන අධ්‍යක්ෂ,
ප්‍රදේශය.

දිනය :————.

සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලබන සහභාගි වන්නන් විසින් 14 ශීර්ෂය යටතේ සපයනු ලබන විස්තර ඇතුලුව ඔවුන් ඉදිරිපත් කරන සියලුම විස්තර සනාථ කිරීම සඳහා සහතිකපත්‍ර, ලියකියවිලි හෝ වෙනත් සාක්ෂි ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.

අධ්‍යාපන අමාත්‍යාංශයේදී ඉල්ලුම්පත්‍ර භාර ගන්නා අවසාන දිනය 1970 නොවැම්බර් 27 දින වේ.

†නිවේදනයේ 6 වැනි ඡෙදය බලනු මැනවි.

11-338—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

අංකය : 1/23/2/20 (ජී)

## සාමාන්‍ය ලිපිකාර සේවයේ විධායක ලිපිකාර පන්තියේ II වැනි ශ්‍රේණියට උසස් කිරීමේ විභාගය—1970 නොවැම්බර්

1970 අගෝස්තු මස 28 වැනි දින අංක 14,921 දරණ ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රයේ I වැනි කොටසේ (II) වැනි ඡේදයේ පළකර ඇති 1970 අගෝස්තු මස 17 වැනි දින දරණ නිවේදනය අනුව, 1970 නොවැම්බර් මස 27 වැනි දින පැවැත්වීමට නියමිතව තිබූ ඉහත සඳහන් විභාගය 1970 දෙසැම්බර් මස 4 වැනි දිනට කල් දැමූ බව විභාගාපේක්ෂකයන්ගේ දැනගැනීම සඳහා නිවේදනය කරනු ලැබේ.

2. මෙම විභාගය පිළිබඳ අනිකුත් කොන්දේසි නොවෙනස්ව පවතිනවා ඇත.

එච්. එස්. වනසිංහ,
රාජ්‍ය පරිපාලන අධ්‍යක්ෂ ජනරාල්.

1970 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 7, ටොරිංටන් චතුරශ්‍රයේ,
රාජ්‍ය පරිපාලන දෙපාර්තමේන්තුවේ දී ය.

11-349—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

## රාජකීය ලංකා ගුවන් හමුදාව—සුන්බුන් විකිණීමේ ටෙන්ඩරය

කොළඹ 2, ශ්‍රීමත් විත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කටුනායක සැපයීම් සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ ඇති සුන්බුන් විකිණීම සඳහා 1970 දෙසැම්බර් මස 7 වෙනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. ටෙන්ඩර් පත් ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් විත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත නැවත ලබා ගතහැකි රු. 100 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබාගත යුතුයි. 1970 දෙසැම්බර් මස 6 වෙනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2 පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

පී. එච්. මෙන්ඩිස්,
එයාර් කොමදෝරු,
වැඩබලන ගුවන් හමුදාපති.

11–387/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## රාජකීය ලංකා ගුවන් හමුදාව

### ක්‍රියා විරහිත මෝටර් රථ විකිණීම

කොළඹ 2, ශ්‍රීමත් විත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් කටුනායක සැපයීම් සහ නඩත්තු කිරීමේ ප්‍රධාන කඳවුරේ ඇති පහත සඳහන් ක්‍රියා විරහිත මෝටර් රථ විකිණීම සඳහා 1970 දෙසැම්බර් මස 7 වෙනි දින පෙරවරු 10 තෙක් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ :—

(1) ෆෝඩසන් වෑන් හොණ්ඩර 10—වාහන අංක ඒ.එෆ්. 2030
(2) ෆෝඩසන් වෑන් හොණ්ඩර 10—වාහන අංක ඒ.එෆ්. 2031
(3) ෆෝඩ් පිලි 800 වෑන්—වාහන අංක ඒ.එෆ්. 2035
(4) ලෑන්ඩ් රෝවර්—වාහන අංක ඒ.එෆ්. 2285
(5) ෆෝඩසන් ට්‍රේඩර් ගිලන් රථය—වාහන අංක ඒ.එෆ්. 2042
(6) ස්ටෑන්ඩඩ් වෑන් ගාඩ් ෆේස් iii—වාහන අංක ඒ.එෆ්. 2282
(7) පයිරින් මාක් vi ගිනි නිවන රථය—වාහන අංක ඒ.එෆ්. 2631
(8) ෆෝසන් තේම්ස් ටොන් 3—වාහන අංක ඒ.එෆ්. 2025

2. ටෙන්ඩර් පත් ලබා ගැනීම පිණිස කොළඹ 2, ශ්‍රීමත් විත්තම්පලම් ගාඩිනර් මාවතේ පිහිටි ගුවන් හමුදා මූලස්ථානයේ, සිවිල් පාලක හා ගණකාධිකාරි වෙත නැවත ලබා ගත හැකි රු. 150 ක ටෙන්ඩර් තැන්පත් මුදලක් ඉදිරිපත් කර රිසිට් පතක් ලබා ගත යුතුයි. 1970 දෙසැම්බර් මස 6 වෙනි දින දහවල් 12 තෙක් ටෙන්ඩර් පත් නිකුත් කරනු ලැබේ.

3. වැඩි විස්තර කොළඹ 2 පිහිටි රාජකීය ලංකා ගුවන් හමුදා මූලස්ථානයෙන් දැනගත හැක.

පී. එච්. මැන්ඩිස්,
එයාර් කොමඩෝර්,
වැඩ බලන ගුවන් හමුදාධිපති.

11–387/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

1971. 1. 1 සිට 1971. 12. 31 දක්වා අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ මුළුතැන්ගෙයි හා බේකරියේ එකතුවන සත්ව ආහාර සඳහා සුදුසු ද්‍රව්‍ය මිළදී ඉවත් කරගෙන යාම සඳහා මිල ගණන් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970 දෙසැම්බර් මස 4 වන දින අ. භා. 2.30 දක්වා භාරගනු ලැබේ.

මිල ගණන් පෝරම 1970 දෙසැම්බර් මස 4 වන දින දවල් 12 දක්වා කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලේ පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක. මිල ගණන් ලියා අනුපිටපතක් සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබාගත හැක.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 11. 4 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ,
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

11–407—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවට අයත් කොළඹ ආයතනයන්ට 1971. 1. 1 සිට 1971. 6. 30 දින දක්වා දර සහ පොල්කටු සැපයීම සඳහා ටෙන්ඩර් ඉල්ලුම්පත් කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් 1970. 12. 4 දින අ. භා. 2.30 වන තෙක් භාරගනු ලැබේ. කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. එස්. එස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයට හෝ කොළඹින් බැහැර ඕනෑම කච්චේරියකට රු. 200 ක් බැඳ ලබාගත් නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ විට, 1970. 12. 4 දින දවල් 12 දක්වා ටෙන්ඩර් පෝරම ලබාගත හැක. ටෙන්ඩර් ලියා අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් දැන ගැනීමට පුළුවන.

ඇම්. ඇස්. විජේරත්න,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 11. 4 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ,
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

11–408—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුව

### ත්‍රිපොලි වෙළඳ හලේ එළු මස්/කුකුල් මස්/ගව මස් හා ඌරු මස් කඩ පිල් බදු දීම

ත්‍රිපොලි වෙළඳ හලේ පිහිටි එළු මස්/කුකුල් මස්/ගව මස් හා ඌරු මස් කඩපිල් 1971. 1. 1 සිට 1971. 12. 31 දක්වා එළු මස්, ගව මස්, කුකුල් මස් හා ඌරු මස් විකිණීම පිණිස බදු දීම සඳහා, කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ, බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි අලෙවි කිරීමේ කොමසාරිස් විසින් 1970 දෙසැම්බර් මස 4 දින අ. භා. 2.30 දක්වා ඉල්ලුම් පත් භාරගනු ලැබේ. කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි පිහිටි අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයේ හෝ ඕනෑම කච්චේරියක රු. 50 ක් බැඳ ලබාගත් නා කුවිතාන්සිය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළවිට 1970 දෙසැම්බර් මස 4 දින දවල් 12 දක්වා ඉල්ලුම් පත් ලබාගත හැක. ඉල්ලුම් පත් අනුපිටපතක් ද සහිතව එවිය යුතුය.

වැඩි විස්තර අලෙවි කිරීමේ කොමසාරිස් කාර්යාලයෙන් හෝ ත්‍රිපොලියේ සහකාර කොමසාරිස් කාර්යාලයෙන් හෝ දැනගත හැක.

ඈන්. වාමදේව,
අලෙවි කිරීමේ කොමසාරිස් වෙනුවට.

1970. 11. 5 දින,
කොළඹ 1, බ්‍රිස්ටල් වීදියේ,
බී. ඇස්. ඇස්. අයි. ගොඩනැගිල්ලෙහි,
අලෙවි කිරීමේ දෙපාර්තමේන්තුවේදීය.

11–409—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ජාතික නිවාස දෙපාර්තමේන්තුව

මාලිගාවත්ත නිවාස ක්‍රමයේ ජල සම්පාදන ක්‍රමය වැඩි දියුණු කිරීම සඳහා 1970 දෙසැම්බර් මස 10 දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් කැඳවනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා 1970 නොවැම්බර් 30 දින දවල් 12 දක්වා නිකුත් කරනු ලැබේ.

වැඩි විස්තර මෙම දෙපාර්තමේන්තුවේ අධිකාරී ඉංජිනේරු තැන ගෙන් ලබාගත හැක.

අයි. ඒ. සී. ප්‍රනාන්දු,
වැඩ බලන ජාතික නිවාස කොමසාරිස්.

ජාතික නිවාස දෙපාර්තමේන්තුව,
කොළඹ, 2.

11-376—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## සුරාබදු දෙපාර්තමේන්තුව

**මහනුවර සුරාබදු ගුදමෙහි ඇති පාවිච්චියට නොගන්නා හිස් අරක්කු බෝතල් ගැලුම් 20,000 ක් පමණ විකිණීම සඳහා ටැන්ඩර් කැඳවීම**

ඉහත සඳහන් බෝතල් තොගය විකිණීම සඳහා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ සුරාබදු කොමසාරිස් විසින් 1970 දෙසැම්බර් මස 7 වැනි දින පෙරවරු 10 දක්වා ටැන්ඩර් අත් කැඳවනු ලැබේ.

ටැන්ඩර් පත් පිටපත් 2 කින් එවිය යුතුය. කච්චේරියකින් හෝ කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් හෝ රු. 25 තැන්පත් මුදලක් සඳහා නිකුත්කරන ලද කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970 දෙසැම්බර් මස 6 වැනි දින පස්වරු 3 දක්වා කොළඹ 1, හේමාස් ගොඩනැගිල්ලේ පිහිටි සුරාබදු කොමසාරිස් කාර්යාලයෙන් නියමිත ටැන්ඩර් පත්‍ර ලබාගත හැකිය.

ඩී. බී. දිසානායක,
සුරාබදු කොමසාරිස්.

1970. 11. 5 වැනි දින.

11-411—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## රත්නපුර දිස්ත්‍රික්කය

**1970-71 මුදල් වර්ෂයේ රජයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම**

රත්නපුර දිස්ත්‍රික්කයේ රජයේ දිසාපති භාරයේ පවත්නා රජයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා 1970-71 මුදල් වර්ෂයට කොන්ත්‍රාත්කරුවෙකු තෝරාගැනීම පිණිස මවිසින් මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍රිකා 1970 නොවැම්බර් 29 වැනි දින පස්වරු 1.30 දක්වා භාරගනු ලැබේ. 1970 නොවැම්බර් 29 වැනි දින පස්වරු 2.30 ට සියලුම ටෙන්ඩර් පත් විවෘත කරනු ලැබේ. ටෙන්ඩර් ඉල්ලුම්කරුවන්ට එදින නියමිත වේලාවට රත්නපුර දිසාපති කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලය ඉදිරියේ පෙනිසිටිය හැක.

2. ටෙන්ඩර් පත් රත්නපුර දිසාපති වෙත ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. නැතහොත් රත්නපුර දිසාපති කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියේ බහාලිය යුතුය. ටෙන්ඩර් පත්‍රයේ ඇති සියළුම වෙනස්කිරීම් ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන තබා සහතික කළ යුතුය.

3. ටෙන්ඩර් පත් රත්නපුර දිසාපති කාර්යාලයෙන් 1970 නොවැම්බර් මස 29 වැනි දින පෙරවරු 10 දක්වා ලබාගත හැක. මෙසේ ලබාගන්නා ටෙන්ඩර් ආකෘති හැර වෙනත් ආකෘති පත්‍රවලින් එවනලද ටෙන්ඩර් භාරගනු නොලැබේ.

4. රත්නපුර දිසාපති භාරයේ ඇති රජයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම සඳහා රු. 25ක් තැන්පත් කොට ලබාගන්නා කුවිතාන්සි ඉදිරිපත් කිරීමෙන් ටෙන්ඩර් පත් ලබාගත හැක. ටෙන්ඩර් පත් බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "රජයේ ගොඩනැගිලි අළුත්වැඩියා කිරීම" යනුවෙන් සඳහන් කළ යුතුය.

5. තෝරාගත් ටෙන්ඩර්කරු විසින් පිළිගත් ටෙන්ඩරයේ මුළු මුදලින් 5%ක මුදලක් ඇප වශයෙන් තැන්පත් කළ යුතුය. එසේම ටෙන්ඩර්කරු විසින් තම ටෙන්ඩරය පිළිගත් බව දන්වා සතියක් තුළදී වැඩ ගිවිසුමක් අත්සන් කිරීමට පැමිණිය යුතුය. එය ප්‍රතික්ෂේප කළහොත් ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක කරනු ලැබේ.

6. කිසිම හේතුවක් නොදක්වා ටෙන්ඩර් සියල්ලම හෝ ඕනෑම ටෙන්ඩරයක් ප්‍රතික්ෂේප කිරීමට රත්නපුර දිසාපතිට හැකිය. ටෙන්ඩරයක කොටසක් පිළිගැනීමටද එසේම දිසාපතිට හැක.

7. රත්නපුර දිසාපතිගෙන් අවසරයක් නොලබා ගිවිසුම් පත්‍රය වෙන අයෙකුට පැවරීමට හෝ භාරදීමට පුළුවන්කමක් නැත. එසේම පත්කරන ලද ටෙන්ඩර්කරු වැඩය කරවන ප්‍රදේශයේ අවශ්‍යතාවයන් අනුව පුහුණු නුපුහුණු ලාංකික කම්කරුවන් යෙදවිය යුතුය.

8. ටෙන්ඩර් පත්‍ර ලබාගත හැක්කේ රු. 25,000ට වඩා වැඩි කොන්ත්‍රාත් සඳහා ලියාපදිංචි වූ කොන්ත්‍රාත්කරුවන්ට ඔවුන්ගේ ලියාපදිංචි සහතික ඉදිරිපත් කිරීමෙනි.

9. ලියාපදිංචි සමුපකාර සමිති හා ග්‍රාම සංවර්ධන සමිතිවලට ටෙන්ඩර් පත්‍ර ලබා ගැනීමට මුදල් තැන්පත් කිරීමට හෝ ඇප මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය නැත. සමිති ලියාපදිංචි කළ බවට හා වැඩය භාරගෙන කිරීමට හැකියාවක් ඇති බවට ඒ ඒ දෙපාර්තමේන්තුවල ප්‍රාදේශීය නිලධාරීන්ගෙන් ලබාගත් සහතිකයක් ඉදිරිපත් කළ යුතුය. තවද වැඩය භාරගෙන කිරීමට කැමති බවට සනාථ කරන ලද සමිතියේ සම්මත කරගත් වාර්තාවක පිටපත් ඉදිරිපත් කළ යුතුය.

10. වැඩි විස්තර අවශ්‍ය නම් රත්නපුර දිසාපති කාර්යාලයෙන් ලබාගත හැක.

ඇස්. ජී. සමරසිංහ,
රත්නපුර දිසාපති.

1970 නොවැම්බර් 3 වැනි දින,
රත්නපුර දිසාපති කාර්යාලයේදී ය.

11-394—70.11.18 දින අංක 14,924 දරන ගැසට් පත්‍රය

---

## කෘෂිකර්ම දෙපාර්තමේන්තුව

මාතර, ගොවිපළ පාලන හා නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින්, පහත සඳහන් රජයේ ගොවිපළවල ඇති කළු තල විකිණීම සඳහා 70.11.29 වෙනි දින, පස්වරු 2.30 දක්වා ටෙන්ඩර් භාරගනු ලැබේ. ටෙන්ඩර්කරුවන් විසින් එක් එක් ගොවිපළ වෙනුවෙන් වෙන වෙනම ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය :—

(1) මිද්දෙණිය ගොවිපළ—කළු තල රාත්තල් 3,444

(2) බටඅත ගොවිපළ—කළු තල රාත්තල් 289 (අවුරුදු දෙකක් පරණ).

2. ටෙන්ඩර් පෝරම මාතර ගොවිපළ පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපතිගෙන් ලබාගෙන ඒවායේ ටෙන්ඩර් පත්‍ර අනු පිටපතක්ද සහිතව ලියුම් කවරයක බහා, සීල් තබා, එහි මුදුන් වම් කොනේ "තල මිළයට ගැණීම" යන්න ලියා, මාතර. ගොවිපළ පාලනය සහ නිෂ්පාදන කාර්යාලයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙත එවිය යුතුයි.

3. ටෙන්ඩර් පත් විවෘත කිරීමට නියමිත දිනට පෙර දින දවල් 12 වනතෙක් ටෙන්ඩර් පෝරම නිකුත් කරනු ලැබේ. පෝරම නිකුත් කරනු ලබන්නේ එක් ටෙන්ඩර් පත්‍රයක් වෙනුවෙන් රුපියල් 10 ක් තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කළ පසුවය. මෙම මුදල් තැන්පත් කිරීම, ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීදියේ පිහිටා ඇති ලංකා බැංකු ශාඛාවේ අංක 37 දරණ කෘෂිකර්ම අධ්‍යක්ෂගේ ගිණුමට හෝ පේරාදෙණියේ කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේදී හෝ කළ යුතුය. පොරොන්දු පත්‍රය අත්සන් කළ පසු ටෙන්ඩර් තැන්පත් මුදල ආපසු දෙනු ලැබේ. පත්කර ගනු ලැබූ ටෙන්ඩර්කරුවාට ඔහුගේ ටෙන්ඩර් පත්‍රය පිළිගත් බව දන්වා දින 10 ක් ඇතුළත අවශ්‍ය ඇපය තැබීමට හෝ පොරොන්දු පත්‍රය අත්සන් කිරීමට හෝ නොහැකි වුවහොත් ඔහුගේ ටෙන්ඩර් තැන්පත් මුදල රාජසන්තක වනවාත් හැර, ඔහුගේ නම ආණ්ඩුවේ වැඩ පැහැර හැරිය කොන්ත්‍රාත්කරුවන්ගේ ලැයිස්තුවට ඇතුළත් වෙන්නට ඉඩ තිබේ.

4. ටෙන්ඩර් පත් රෙජිස්ටර් තැපැලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් පත් රෙජිස්ටර් තැපැලෙන් නොඑවන්නේ නම් ටෙන්ඩර්කරුවන්

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මැලේරියා මර්ධන ව්‍යාපාරය

### පාවිච්චියට අයෝග්‍ය මෝටර් රථවාහන ටෙන්ඩර් මගින් විකිණීම

කොළඹ 5, නාරාහේන්පිට පිහිටි මැලේරියා මර්ධන ව්‍යාපාරයේ ඇති පහත සඳහන් පාවිච්චියට අයෝග්‍ය වාහන සඳහා මුද්‍රා තබන ලද ටෙන්ඩර් පත්‍ර වර්ෂ 1970 නොවැම්බර් 26 වෙනි බ්‍රහස්පතින්ද පෙ. ව. 11 වන තෙක් මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

| ලියා පදිංචි අංකය | වර්ගය | සඳහන් කළයුතු අඩුම මුදල රු. |
|---|---|---|
| ශී. වී. 2354 ... | ... ශී. පි. සී. විලිස් ජීප් ... | 7,200 |
| ඊ. ඇන්. 2321 | ... සී. ජේ. 5 විලිස් ජීප් ... | 4,000 |
| ඊ. ඇන්. 2324 | ... එම ... | 4,000 |
| ඊ. ඇන්. 2325 | ... එම ... | 4,000 |
| ඊ. ඇන්. 2326 | ... එම ... | 4,000 |
| ඊ. ඇන්. 2329 | ... එම ... | 4,000 |
| 2 ශ්‍රී 2996 ... | ... සී. ජේ. 6 විලිස් ජීප් ... | 9,500 |
| 2 ශ්‍රී 3001 ... | ... එම ... | 11,000 |
| 2 ශ්‍රී 3005 ... | ... එම ... | 9,000 |
| 2 ශ්‍රී 3007 ... | ... එම ... | 10,000 |
| 2 ශ්‍රී 3009 ... | ... එම ... | 9,500 |
| 2 ශ්‍රී 3011 ... | ... එම ... | 9,500 |
| 2 ශ්‍රී 3013 ... | ... එම ... | 9,500 |
| 2 ශ්‍රී 3014 ... | ... එම ... | 9,500 |
| 2 ශ්‍රී 3019 ... | ... එම ... | 9,500 |
| 2 ශ්‍රී 3078 ... | ... එම ... | 9,500 |
| 2 ශ්‍රී 3079 ... | ... එම ... | 10,000 |
| 2 ශ්‍රී 3081 ... | ... එම ... | 9,500 |
| 2 ශ්‍රී 3082 ... | ... එම ... | 9,500 |
| 3 ශ්‍රී 8328 ... | ... එම ... | 13,750 |

කොළඹ 5, මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අතිරේක කාර්යාල සහකාර තැනගේ මාර්ගයෙන් කාර්යාලය විවෘතව තබා ඇති කාලය ඇතුළත මෙම රථවාහන මෙම ව්‍යාපාරයේ භූමිය තුළදී පරීක්ෂා කිරීමට පුළුවන.

කොළඹ කච්චේරියේ හැර වෙනත් ඕනෑම කච්චේරියක හෝ කොළඹ යෝක් වීථියේ පිහිටි ලංකා බැංකුවේ හෝ මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරී නමින් (ගිණුම් අංක 141) ටෙන්ඩර් සඳහා රු. 100 තැන්පත් කළ බවට කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් 1970 නොවැම්බර් මස 22 වෙනි ඉරුදින දවල් 12 දක්වා මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරී කාර්යාලයෙන් නිකුත් කරනු ලබන ටෙන්ඩර් පත්‍ර පිටපතකුත් සමඟ ඉදිරිපත් කළ යුතුයි. එක් එක් වාහනය සඳහා වෙන් වශයෙන් ඉල්ලුම් කළ යුතුයි.

3. සියළුම ටෙන්ඩර් පත්‍ර බහාලන කවරයේ වමේ උඩ පැත්තේ '' පාවිච්චියට අයෝග්‍ය මෝටර් රථ වාහන ගැනීම සඳහා ටෙන්ඩර් '' යන්න ලියා කොළඹ 5, තැ. පෙ. 1472, මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරී තැන කියා කවරයේ ලිපි යොමුව ලිවිය යුතුයි. සියළුම ටෙන්ඩර් පත්‍ර ලියා පදිංචි කළ තැපැලෙන් එවිය යුතුයි. නැතහොත් ඒ සඳහා මෙම කාර්යාලයෙහි ඇති ටෙන්ඩර් පෙට්ටියේ තැන්පත් කළ යුතුයි. කවරයේ වම් පැත්තේ යට කොටසෙහි ටෙන්ඩර් කරුගේ නම සහ ලිපි යොමුව ලිවිය යුතුයි.

4. ටෙන්ඩර් කරන ලද ගණන ඉලක්කම් වලින් හා අකුරෙන් පෝර්ම යෙහි සඳහන් කළ යුතුයි. ඉලක්කම්වලින් සහ/හෝ අකුරුවලින් සඳහන් ගණන් එකිනෙක විරුද්ධ නම් ටෙන්ඩරය ප්‍රතික්ෂේප කිරීමට හැක. ටෙන්ඩරයේ සියළුම වෙනස් කිරීම් මකා හැරීම් සඳහා ටෙන්ඩර්කරු විසින් කෙටි අත්සන යෙදිය යුතුයි.

5. පළමුවන ඡේදයේ සඳහන් දිනය හා වේලාව ඉකුත් වූ විගස සියළුම ටෙන්ඩර් විවෘත කරනු ලැබේ. සියළුම ටෙන්ඩර් කරුවන්ට ඒ වේලාවේ පැමිණ සිටිය හැකිය. ටෙන්ඩර් ඉල්ලුම් කරුවන්ගේ නම් සහ ඔවුන් ඉදිරිපත් කර ඇති ගණන් හිලව් එහිදී කියවනු ලැබේ.

6. ටෙන්ඩර් පිළිගත් බව දන්වා දින 3 ක් ඇතුළත ටෙන්ඩර් පතෙහි සඳහන් මුළු මුදල, මුදලින් ගෙවා නියමිත රථවාහන ඉවත්කර නොගතහොත් ටෙන්ඩර් පත්‍ර තැන්පත් මුදල් කිසිම අයිතිවාසිකමක් නැතිවනසේ රාජ සන්තක කරනු ලැබේ. ටෙන්ඩරය පිළිගත් බව දන්වා ලිපියකින් ටෙන්ඩර් කරුට දැනුම් දීමෙන් පසු දින 7ක් ඇතුළත ටෙන්ඩර් කරන ලද මුළු මුදල ගෙවීම ප්‍රතික්ෂේප කර හෝ ගෙවීමට යම් ටෙන්ඩර් කරුවෙක් අපොහොසත් උවහොත් ඊළඟට වැඩි ටෙන්ඩර් ඉදිරිපත් කල ටෙන්ඩර් කරුට වාහනය මිළදී ගැනීමට අවසර දී ඔහුගේ නම රජයේ ටෙන්ඩර් අයදුම් කල නොහැකි ටෙන්ඩර්කරුවන්ගේ නාම ලේඛණයට ඇතුළත් කිරීමට ඉඩ තිබේ.

7. ඕනෑම ටෙන්ඩර් පත්‍රයක් හෝ සියළුම ටෙන්ඩර් පත්‍ර පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ බලය මැලේරියා මර්ධන ව්‍යාපාරයේ අධිකාරී සතුය.

එෆ්. ඒ. වික්‍රමසිංහ,
අධිකාරී, මැ. ම. ව්‍යාපාරය.

1970.11.1,
කොළඹ 5, නාරාහේන්පිට,
මැලේරියා මර්ධන ව්‍යාපාරයේ,
අධිකාරී කාර්යාලයේ දී ය.

11–277—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—මහනුවර සෞඛ්‍ය අධිකාරි කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1971 ජනවාරි මස 1 වැනි දින සිට 1971 දෙසැම්බර් මස 31 වෙනි දක්වා (දින දෙකම ඇතුළුව) කාලය තුළ මේ සමග ඇති උපලේඛනයෙහි පළමුවන තීරයෙහි සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපියීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර්පත්‍ර මහනුවර පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරී කාර්යාලයේදී සෞඛ්‍ය සේවා අධිකාරී තැන විසින් භාරගනු ලැබේ.

2. **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—(i) මෙහි උපලේඛනයෙහි දෙවන තීරයෙහි සඳහන් නියම කරන ලද මුදල් මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුය. අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති හෝ ඇතුළත් සංගම් හා විවිධ සංගම්වලට අයිති සංගම්වලට ද තැන්පත් මුදල් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්යාලයෙන් හෝ අනුරාධපුර, මඩකලපුව, ගාල්ල, කොළඹ, යාපනය, කළුතර, බදුල්ල, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්යාලවලින් ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුනා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකි වන පරිදි පෝර්ම සඳහා තැපැලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම්පත් කල්වේලා ඇතිව එවිය යුතුය.

3. **වත්කමේ විස්තර.**—සියළුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර්පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැළකිය යුතු කාලයකට ප්‍රථම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබා ගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරින්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා උවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡෙදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල් අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දන ගැනීමට මේ සමඟ ඇති උපලේඛනයෙහි 5 වෙනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර්පත්‍ර පිටපත් දෙකකින් යුතුව කවරයක බහා '' සෞඛ්‍ය සේවා අධිකාරි, මහනුවර '' කියා එවිය යුතුය. සීල් කරන ලද ටෙන්ඩර් පත්‍ර බහා එවන කවරයෙහි වම් පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහා දැයි පැහැදිළිව සඳහන් කළ යුතුවාක් මෙන්ම වම්පස පහත කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිළිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහාලන ලද ටෙන්ඩර්පත්‍ර මෙම කාර්යාලයෙහි තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපැලෙන් හෝ ලැබීමට සැළැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාරදෙන්නේ නම් ටෙන්ඩර් පත්‍රිකා ලැබුන බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර්පත්‍ර භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 4 වෙනි තීරයෙහි සඳහන් දිනයන්හි පෙ.ව. 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා මෙම කාර්යාලයේදී විවෘත කරනු ලැබේ.

**7. ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත්‍ර තෝරා ගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තුවන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුළු මුදල් අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " බී " උපලේඛනයට යන වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුය. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් හෝ එවකට වෙළඳ පොලේ පවතින මිළ ගණන් හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතිනම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

**8. ටෙන්ඩර් පත්‍ර විවෘත කිරීම.**—ටෙන්ඩර්පත්‍ර විවෘත කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයෙහි සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියේ දී කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවකු ඉදිරිපත් කරනු ලැබූ ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇතිවුවහොත් ඒ සැකය දුරුකර ගැනීම මා සමහ කලින් පිළියෙල කරගත් දිනයක මවිසින් හෝ බලය පවරනු ලැබූ මාගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

**9. ටෙන්ඩරයේ සඳහන් කරන මිළ ගණන් වලංගු කාල සීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවෙනි ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වන තුරු වලංගුවේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන් තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන්ම සඳහන් කර නැතිනම් ටෙන්ඩර් පත්‍රයෙහි සඳහන් මිල ගණන් මොන හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

**10. තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් ඇප මුදල් තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

**11. බඩුබාහිරාදිය තබා ගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුගේ බඩුබාහිරාදිය ගබඩා කර තබා ගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

**12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවන් වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය.

(i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 4½ ක් ඇතුලත් වනසේ බත්වේල් සැපයීමට ටෙන්ඩර් කරුවන් මිල ගණන් දක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස්කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිලට සපයන අතර, ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සලාක නොවන සහල් රාත්තලක මිල ශත 50 කි. පරිත්‍යාග කරණ ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පියීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුව හොත් ඒ සඳහා සලාක නොවන සහල් මිලට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩුකරණු ලැබේ. කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිලට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර, සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩුකරනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයින්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩුකරණු ලැබේ.

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩුකරණු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිලට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩු කරණු ලැබේ.

ඇ. උඩවත්ත,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරී.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
මහනුවර සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍ය්‍යාලය.

## උපලේඛනය

| (1) ආයතනයන් | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය | (5) ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් — සේවකයින්ට — මාළු | මස් | කරවල | එළවළු | රෝගීන්ට — මාළු | මස් | කරවල | එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ආගරපතන දි. රෝ. | 100 | 800 | | 400 | 400 | 400 | 1,500 | 800 | 800 | 800 | 3,000 |
| අකුරන, ග්‍රා. රෝ. | 100 | 400 | | 100 | 100 | 100 | 400 | 1,000 | 1,000 | 1,000 | 4,500 |
| අඹගහ පැලැස්ස, මා. නි. | 100 | 200 | | 150 | 250 | 200 | 800 | 75 | 100 | 100 | 350 |
| බඹරදෙනිය, මා. නි. | 100 | 400 | | 150 | 150 | 150 | 600 | 100 | 100 | 100 | 400 |
| බටුමුල්ල, ග්‍රා. රෝ. | 100 | 300 | | 50 | 250 | 400 | 900 | 200 | 500 | 1,000 | 2,000 |
| බොක්කාවල, මා. නි. | 100 | 200 | | 50 | 50 | 50 | 100 | 100 | 100 | 100 | 500 |
| දුන්හින්න, මා. නි. | 100 | 200 | | 200 | 200 | 200 | 600 | 250 | 250 | 250 | 250 |
| එරමුදුලියද්ද, ග්‍රා. රෝ. | 100 | 400 | | 100 | 100 | 150 | 500 | 150 | 150 | 200 | 1,000 |
| ගලහ, මා. නි. | 100 | 200 | | 50 | 50 | 50 | 100 | 100 | 100 | 100 | 500 |
| ගල්පිහිල්ල, මා. නි. | 100 | 400 | 1970 | 200 | 200 | 200 | 800 | 100 | 100 | 100 | 400 |
| ගොහාගොඩ වශංගත රෝගීන්ගේ රෝහල | 100 | 300 | දෙසැම්බර් මස 3 වැනි | 200 | 150 | 150 | 500 | 200 | 200 | 200 | 400 |
| ගෝනගන්තැන්න, මා. නි. | 100 | 300 | දින පෙ.ව. | 150 | 150 | 200 | 600 | 250 | 250 | 250 | 900 |
| කොලොන්ගොඩ, ග්‍රා. රෝ. | 100 | 200 | 10 ට | 50 | 50 | 50 | 100 | 100 | 100 | 100 | 500 |
| මල්දෙනිය, ග්‍රා. රෝ. | 100 | 600 | | 400 | 400 | 400 | 1,500 | 800 | 1,000 | 800 | 3,400 |
| මුල්හල්කැලේ, දි. රෝ. | 100 | 800 | | 400 | 300 | 500 | 1,800 | 1,500 | 1,500 | 1,500 | 7,000 |
| මුරුතලාව, මා. නි. | 100 | 400 | | 100 | 100 | 100 | 300 | 150 | 150 | 150 | 500 |
| නිල්දන්ඩාහින්න, මා. නි. | 100 | 400 | | 100 | 200 | 400 | 800 | 200 | 300 | 500 | 1,000 |
| පමුනුව, මා. නි. | 100 | 200 | | 50 | 50 | 50 | 100 | 100 | 100 | 100 | 500 |
| පන්විලතැන්න, ග්‍රා. රෝ. | 100 | 600 | | 400 | 400 | 400 | 1,700 | 1,000 | 1,000 | 1,000 | 4,000 |
| තලාතුඔය, ග්‍රා. රෝ. | 100 | 600 | | 200 | 200 | 200 | 1,000 | 500 | 500 | 500 | 2,000 |
| තිත්තපජ්ජල, මා. නි. | 100 | 300 | | 300 | 300 | 300 | 1,000 | 800 | 800 | 800 | 3,000 |
| උඩුවෙල, ග්‍රා. රෝ. | 100 | 600 | | 300 | 300 | 300 | 1,200 | 400 | 400 | 500 | 1,800 |
| වත්ටප්පොල, ග්‍රා. රෝ. | 100 | 300 | | 150 | 150 | 150 | 500 | 250 | 250 | 250 | 750 |
| වත්තේගම, ග්‍රා. රෝ. | 100 | 400 | | 150 | 150 | 150 | 600 | 1,000 | 1,000 | 1,000 | 4,000 |
| යක්ගහපිටිය, මා. නි. | 100 | 200 | | 100 | 100 | 100 | 250 | 150 | 150 | 150 | 500 |
| මඩවල, මා. නි. | 100 | 200 | | 50 | 50 | 50 | 100 | 100 | 100 | 100 | 500 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### සතුන් සැපයීම

1971 ජනවාරි 1 වැනිදා සිට 1971 සැප්තැම්බර් මස 30 (දෙදිනම ඇතුළත්ව) වැනිදායින් අවසන් වන කාලය තුළ මේ සමඟ ඇති උපලේඛනයේ පළමු වැනි තීරයෙහි දක්වා ඇති සේවය සඳහා එවනු ලබන සීල් තැබූ ටෙන්ඩර් පත්‍ර ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම්වලින් කොළඹ රැජින වීදියේ සෙලින්කො මන්දිරයේ 5 වැනි මහලේ පිහිටි සෞඛ්‍ය අමාත්‍යාංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් භාරගනු ලැබේ.

2. කොළඹ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂගෙන් ඉල්ලුම් කළ විට ඔහු විසින් සපයන ලද පෝර්මවල පමණක් පිටපත් දෙකකින් ටෙන්ඩර් ඉදිරිපත් කළ යුතුය. නියමිත පෝර්මයේ නොවන ටෙන්ඩර් භාරගනු නොලැබේ.

3. මේ සමග ඇති උපලේඛනයේ 4 වැනි තීරයෙහි සඳහන් දිනවල පෙරවරු 10 ට ටෙන්ඩර් පත්‍ර භාරගැනීම අවසන් වූ වහාම ඒවා විවෘත කරනු ලැබේ. ටෙන්ඩර්පත්‍ර විවෘත කරන අවස්ථාවේදී ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැකිය. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් විසින් ටෙන්ඩර්පත්වල සඳහන් කරන ලද මිළ ගණන් ද පැමිණ සිටින්නන් ඉදිරියේ කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකුට ටෙන්ඩර් පත්‍ර පරීක්ෂා කිරීමට අවශ්‍ය වුවහොත් ටෙන්ඩර් මණ්ඩලයේ අනුමතිය ඇතිව ඒවායේ පිටපතක් පරීක්ෂා කළ හැකිය.

4. මේ සමග ඇති උපලේඛනයේ දෙවැනි තීරයෙහි සඳහන් ප්‍රමාණයේ මුදලක් කොළඹ කච්චේරියෙහි හැර අනිකුත් කච්චේරිවල හෝ කොළඹ යෝක් වීදියේ ලංකා බැංකුවේ තැන්පත් කළ යුතුය. මුදල් තැන්පත් කිරීමට අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැකිය. නියමිත පෝර්මයේ නොවන තැන්පත් මුදල් බැංකුව භාරගනු නොලැබේ.

විවිධ සේවා සමුපකාර සමිති හා විවිධ සේවා සමුපකාර සමිති සංගම් ඇතුළුව අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිතිවලට ද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැකිය. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

5. අයදුම්කරුවන් විසින් තැන්පත් කරන ලද මුදලට ලබාගත් කුවිතාන්සි ටෙන්ඩර් පත්‍ර භාරගන්නා අවසාන දිනට පෙර දින දවල් 12ට පෙර ඉදිරිපත් කර අවශ්‍ය පෝර්ම ලබාගත යුතුයි. තැපෑලෙන් ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කරන අය මුදල් තැන්පත් කළ කුවිතාන්සි කල්වේලා ඇතිව එවීමෙන් අවසාන දිනයට ප්‍රථම ටෙන්ඩර් එවීම සඳහා අවශ්‍ය පෝර්ම ලබාගත හැකිය.

6. මෙම දෙපාර්තමේන්තුවේ දැනට කොන්ත්‍රාත්තුවක් නොදරන අය ටෙන්ඩර්පත්‍ර ඉල්ලා එවීමට පෙර තම තමන්ගේ වටිනාකම පිළිබඳ තොරතුරු මා වෙත දැන්විය යුතුයි. මේ සඳහා අවශ්‍ය පෝර්ම මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

**සැළකිය යුතුයි.**—ටෙන්ඩර්කරුවන්ගේ මුදල් තත්වයේ ස්ථිර භාවය පිළිබඳ තොරතුරු දැන ගැනීමට පෙර ඔවුන් විසින් එවන ලද ටෙන්ඩර් පිළිබඳ තීරණයක් කළ නොහැකි බැවින් තම තමන්ගේ වටිනාකම් පිළිබඳ තොරතුරු කල්වේලා ඇතිව ඉදිරිපත් කළ යුතුයි. වටිනාකම පිළිබඳ තොරතුරු හෝ මුදල් තත්වයේ තොරතුරු ඉදිරිපත් කිරීමට බැරි වුවහොත් ටෙන්ඩර් තැන්පත් මුදල අහිමි වේ.

7. සෑම ටෙන්ඩරයක්ම කොළඹ, රැජින වීදියේ සෙලින්කො මන්දිරයේ 5 වැනි මහලේ කාමර අංක E 10 දරණ සෞඛ්‍ය අමාත්‍යාංශ කාර්යාලයේ මුදල් අංශයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ඉහත සඳහන් I වෙනි ඡෙදයේ සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුයි. ටෙන්ඩර් කරුවෝ ඔවුන්ගේ ටෙන්ඩර් ලියාපදිංචි කළ තැපෑලෙන් එවීමට බලාපොරොත්තු නොවන්නේ නම් ඔවුන් හෝ නියෝජිතයන්ට ඉහත සඳහන් ලිපිනයෙහි සිටින සෞඛ්‍ය අමාත්‍යාංශයේ ප්‍රධාන ගණකාධිකාරි තැනට පුද්ගලිකව භාරදිය හැක.

ටෙන්ඩර්කරුවන් විසින් ටෙන්ඩර් බහාලන කවරයේ පිටපැත්තේ වම් උඩ කෙළවරේ සේවයේ ස්වභාවය, නම් හා ලිපිනය සටහන් කළ යුතුය.

**සැළකිය යුතුයි.**—ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනයේ පෙරවරු 10 යෙන් පසු තැපෑලෙන් හෝ වෙනයම් ක්‍රමයකින් ලැබෙන ටෙන්ඩර් ගැන සළකා බලනු නො ලැබේ.

8. 1969 අප්‍රේල් මස 1 දින සිට 1970 මාර්තු මස 31 දින දක්වා ලබාගත් සැපයීම් ප්‍රමාණය දළ වශයෙන් පහත සඳහන් උපලේඛනයේ දක්වා ඇත.

9. සපයනු ලබන වසු පැටවුන්ගෙන් වසා, ලබාගත් පසු එම සතුන් නැවතත් කොන්ත්‍රාත්කරු වෙත ආපසු භාර දෙනු ලැබේ.

10. ටෙන්ඩර් පත්‍රයේ සඳහන් කරන ලද මිළ ගණන් අඩු වශයෙන් මාස 3 ක කාලපරිච්ඡෙදයක් දක්වා වලංගු විය යුතුයි.

11. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ දක්වා ඇත. ටෙන්ඩර් ඉල්ලුම් කරන විට එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම ඒවා පිළිපැදිය යුතු ද වන්නේය. එම කොන්දේසිවලට අනුකූල නොවන ඉල්ලුම් පත්‍ර ප්‍රතික්ෂේප කළ හැකි බැවිනි.

12. කිසිම ගිවිසුමක් නොමැතිව ටෙන්ඩරය සම්පූර්ණයෙන් හෝ කොටසක් භාරගැනීමටද නැතහොත් සියලුම ටෙන්ඩර් හෝ කොටසක් ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුව ඇත.

13. වැඩි විස්තර මෙම කාර්යාලයට අයදුම් පතක් එවීමෙන් දැනගත හැකිය.

වී. අයියාමුත්තු,
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙනුවට.

1970 නොවැම්බර් මස 3 වැනි දින,
සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, තැ. පෙ. 584,
කොළඹ 1.

### උපලේඛනය

| (1) සේවය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල රු. | (3) ඇප මුදල රු. | (4) ටෙන්ඩර් භාරගන්නා අවසාන දිනය හා වේලාව |
|---|---|---|---|
| කොළඹ වෛද්‍ය පර්යේෂණායතනයට සහ කොළඹ මහාරෝග්‍යශාලාවට සතුන් සැපයීම ... | 100 ... | 700 ... | 1970.12.7 දින පෙ.ව. 10 |

### උපලේඛනය (දළ වශයෙන්)

| | |
|---|---|
| වසු පැටවුන් ... ... | 90 |
| මීහරක් පැටවුන් ... ... | 1 |
| එළුවෝ ... ... ... | 890 |
| හාවුන් (ලොකු) ... ... | 160 |
| ගෙම්බන් ... ... ... | 9,600 |

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව—කොළඹ කොට්ඨාශය

### කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම

**ටෙන්ඩර් ඉදිරිපත් කිරීමට සුදුසුකම් ඇති පුද්ගලයින් හා සේවා.**—වර්ෂ 1971 ජනවාරි 1 දින සිට 1971 දෙසැම්බර් 31 වනදා දක්වා (දින දෙකම ඇතුළත්ව) කාලය තුළ, මේ සමඟ ඇති උපලේඛනයෙහි පළමුවන තීරයේ සඳහන් වන ආයතනයන්ට කිරි නොමැතිව පිසූ ආහාර සැපයීම සඳහා ලාංකිකයන්ගෙන් හෝ ලාංකික සමාගම් විසින් එවනු ලබන සීල් තබන ලද ටෙන්ඩර් පත් කොළඹ පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේදී, සෞඛ්‍ය සේවා අධිකාරි තැන විසින් භාරගනු ලැබේ.

2. (i) **ටෙන්ඩර් සඳහා මුදල් තැන්පත් කිරීම.**—මෙහි උපලේඛනයේ දෙවන තීරයේ සඳහන් නියම කරන ලද මුදල මා නමට කච්චේරියක තැන්පත් කොට කුවිතාන්සියක් ලබාගත යුතුයි.

අනුමත කරන ලද ග්‍රාම සංවර්ධන සමිති හෝ ලියාපදිංචි කරන ලද සමුපකාර සමිති ඇතුළත් සංගම් හා විවිධ සේවා සංගම්වලට අයිති සමිතිවලටද තැන්පත් මුදලක් නොතබා ටෙන්ඩර් පත්‍රිකා ඉල්විය හැක. කෙසේ හෝ වේවා එවැනි ඉල්ලීම් කරන විට ඒ ඒ සංගම් හෝ සමිතිවල ලියාපදිංචි අංකය පැහැදිලිව සඳහන් කළ යුතුය.

(ii) **ටෙන්ඩර් පත්‍ර.**—ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට පළමු දිනයෙහි දවල් 12 වනතුරු මෙම කාර්‍යාලයෙන් හෝ අනුරාධපුරය, බදුල්ල, මඩකලපුව, කොළඹ, ගාල්ල, යාපනය, කළුතර, නුවර, කෑගල්ල, කුරුණෑගල, මාතර, මාතලේ, පුත්තලම, රත්නපුරය සහ වවුනියාව යන පළාත්වල පිහිටි සෞඛ්‍ය සේවා අධිකාරිවරුන්ගේ කාර්‍යාලවලින් හෝ ලබාගත හැක. නියමිත පෝර්මයේ නොවන මොනම ටෙන්ඩරයක්වත් භාරගනු නොලැබේ. ටෙන්ඩර් පෝර්ම ඉල්ලුම් කිරීමේදී මුදල් තැන්පත් කළ බවට සාක්ෂි වශයෙන් නිකුත් කරන ලද කුවිතාන්සියක් ඉල්ලුම් පත්‍රයට අමුණා එවිය යුතුයි. ටෙන්ඩර්කරුවන්ට ටෙන්ඩර් පෝර්ම ලබාගෙන ඒවා අවසාන දිනට පළමු ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි පෝර්ම සඳහා තැපෑලෙන් ඉල්ලුම් කරන අය තම ඉල්ලුම් පත් කල්වේලා ඇතිව එවිය යුතුයි.

3. **වත්කමේ විස්තර.**—සියලුම ටෙන්ඩර්කරුවන් ටෙන්ඩර් පෝර්ම සඳහා ඉල්ලුම් කිරීමේදී ටෙන්ඩර් පත්‍ර භාරගැනීමේ අවසාන දිනට සැලකිය යුතු කාලයකට ප්‍රථම තම වත්කම මට හෝ තමා ටෙන්ඩර් පෝර්ම ලබාගැනීමට සතුටු සෞඛ්‍ය සේවා අධිකාරීන්ට හෝ දන්විය යුතුයි. මේ සඳහා වුවමනා පෝර්ම ඉහත පෙනෙන දෙවන ඡේදයේ (ii) කොටසෙහි සඳහන් ඕනෑම තැනකින් ලබාගත හැක. වත්කමේ විස්තර ඉදිරිපත් කිරීමට නොහැකිවීම හෝ මුදල් තත්ත්වය විදහා පෑමට කරුණු ඉදිරිපත් කරන ලෙස දන්වූ විට එසේ කිරීමට අපොහොසත් වුවහොත් ටෙන්ඩර් සඳහා තැන්පත් කරන ලද මුදල අහිමි වන්නට ඉඩ තිබේ.

4. **ප්‍රමාණයන්.**—සැපයිය යුතු ආහාර ප්‍රමාණයන් දළ වශයෙන් දැනගැනීමට, මේ සමග ඇති උපලේඛනයෙහි 5 වැනි තීරය බලන්න.

5. **ටෙන්ඩර් එවිය යුතු අන්දම.**—සියලුම ටෙන්ඩර් පත් පිටපත් දෙකකින් යුතුව කවරයක බහා " සෞඛ්‍ය සේවා අධිකාරි, කොළඹ " කියා එවිය යුතුයි. සීල් කරන ලද ටෙන්ඩර් පත් බහා එවන කවරයෙහි වම්පස උඩ කෙළවරේ එය කවර සේවාවක් සඳහාදැයි පැහැදිලිව සඳහන් කළ යුතුවාක් මෙන්ම එහි වම්පස කෙළවරේ ටෙන්ඩර්කරුගේ නම සහ ලිපිනය පැහැදිලිව සඳහන් කළ යුතුය. කවරයෙහි බහන ලද ටෙන්ඩර් පත් මෙම කාර්‍යාලයේ තිබෙන ටෙන්ඩර් පෙට්ටියට දැමීමෙන් හෝ ලියාපදිංචි කළ තැපෑලෙන් හෝ ලැබීමට සැලැස්විය හැක. ටෙන්ඩර් පත්‍රිකා පුද්ගලිකව මට හෝ ගණකාධිකාරි/ලේකම් තැනට භාර දෙන්නේ නම්, ටෙන්ඩර් පත්‍රිකා ලැබුණ බවට කුවිතාන්සියක් ඔහුගෙන් ලබාගත යුතුය.

6. **ටෙන්ඩර් පත් භාරගන්නා අවසාන දිනය.**—මෙහි පහත පෙනෙන උපලේඛනයේ 4 වන තීරයේ සඳහන් දිනයන්හි පෙරවරු 10 ට ටෙන්ඩර් පත් භාරගැනීම අවසන්වූ වහාම ඒවා මෙම කාර්‍යාලයේදී විවෘත කරනු ලැබේ.

7. **ටෙන්ඩර් පත් විවෘත කිරීම.**—ටෙන්ඩර් පත් විවෘත කිරීම කරන වේලාවට ටෙන්ඩර්කරුවන්ට ඒ ස්ථානයේ සිටිය හැක. ටෙන්ඩර්කරුවන්ගේ නම් සහ ඔවුන් සඳහන් කරන ලද මිළ ගණන්ද පැමිණ සිටින ටෙන්ඩර්කරුවන් ඉදිරියෙහි කියවනු ලැබේ. යම්කිසි ටෙන්ඩර්කරුවෙකු ඉදිරිපත් කරන ලද ඕනෑම ටෙන්ඩරයක් පිළිබඳ සැකයක් ඇති වුවහොත් ඒ සැකය දුරුකර ගැනීමට මා සමග කලින් පිළියෙල කරගත් දිනක මවිසින් හෝ බලය පවරනු ලැබූ මගේ නියෝජිතයෙකුගේ අනුමැතිය ඇතිව ඒවායේ පිටපත් පරීක්ෂා කළ හැකිය.

8. **ටෙන්ඩරයන්හි තීරණය.**—ටෙන්ඩර් පත් තෝරාගනු ලබන්නේ ප්‍රධාන වශයෙන් ටෙන්ඩර්කරු විසින් පෝර්මයේ " බී " උපලේඛනයෙහි සඳහන් ආහාර සැපයීම සඳහා බලාපොරොත්තු වන මිළ ගණන් අනුව ඒ සඳහා වියදම් වන මුදල අනුවය. එසේ වුවත් ටෙන්ඩර් පෝර්මයෙහි " සී " උපලේඛනයට අයත් වැඩිපුර ද්‍රව්‍ය සඳහා අය කිරීමට අදහස් කරන මිළ ගණන් සඳහන් කළ යුතුයි. එහෙත් ඒ සඳහා මුදල් ගෙවීම කරන විට ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන හෝ එවකට වෙළඳපොලේ පවතින මිළ ගණන හෝ යන දෙකින් අඩු ගණන හෝ ගෙවනු ලැබේ. පාලන මිළක් පවතී නම් එම පාලන මිළ ගණන් අනුව ගෙවීම කරනු ලැබේ.

9. **ටෙන්ඩරයෙහි සඳහන් කරන ලද මිළ ගණන් වලංගු කාලසීමාව.**—ටෙන්ඩර්කරුවන් විසින් සඳහන් කරන ලද මිළ ගණන් මෙහි පළමුවන ඡේදයේ සඳහන් කාලසීමාව ඉකුත් වනතුරු වලංගු වේ. කොන්ත්‍රාත්කරුගේ අත්සන තබන ලද පොරොන්දු පත්‍රයෙහි විශේෂයෙන් සඳහන් කර නැති නම් ටෙන්ඩර් පත්‍රයේ සඳහන් මිළ ගණන් මොනම හේතුවක් නිසාවත් එම කාලය තුළ වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

10. **තැන්පත් ඇප මුදල්.**—තෝරාගන්නා ලද ටෙන්ඩර්කරු මෙහි පහත පෙනෙන උපලේඛනයෙහි 3 වන තීරයෙහි සඳහන් වන ඇප මුදල තැන්පත් කිරීමෙන් පසු පොරොන්දු පත්‍රය අත්සන් කළ යුතුය.

11. **බඩු බාහිරාදිය තබාගැනීම.**—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩු බාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. **ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.**—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දැනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසිද ටෙන්ඩර්කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියෙකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 4½ක් ඇතුළත් වන බත්වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දැක්විය යුතුය.

(ii) දැනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝම්බර් සිට ඒ වෙනුවෙන් අමතරව පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දැනට සලාක නොවන සහල් රාත්තලක මිළ ශත 50කි.

පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිළයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසියම් අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒ අතර සලාක නොවන සහල් මිළේ සහ සලාක සහල් මිළේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරගනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දැනට මෙන් නොමිළයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිළේත් සලාක සහල් මිළේත් වෙනස අඩු කරගනු ලැබේ.

වෛද්‍ය එච්. සී. ගෝමස්,<br>
කොළඹ සෞඛ්‍ය සේවා අධිකාරි.

1970 නොවැම්බර් මස 4 වැනි දින,<br>
කොළඹ, සෞඛ්‍ය සේවා අධිකාරි කාර්‍යාලයේ දීය.

11. බඩුබාහිරාදිය තබාගැනීම.—තෝරාගත් ටෙන්ඩර්කරුවන්ගේ බඩුබාහිරාදිය ගබඩා කර තබාගැනීම සඳහා ආයතනයේ හෝ එහි පිහිටි ඉඩම තුළ ඉඩකඩ සලසා දෙනු නොලැබේ.

12. ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි.—ටෙන්ඩර් පිළිබඳ කොන්දේසි ටෙන්ඩර් පත්‍රයේ පිටුපස දක්වා ඇත. ටෙන්ඩර්කරුවකු වීමට බලාපොරොත්තු වන්නන් එහි අඩංගු කොන්දේසි හොඳින් දනගත යුතුවාක් මෙන්ම පිළිපැදිය යුතුද වන්නේය. ටෙන්ඩර් පත්‍රයෙහි තිබෙන ගිවිසුමේ කොන්දේසි ටෙන්ඩර් කරුවන් විසින් සැලකිය යුතුය.

13. (i) රෝගියකුගේ සම්පූර්ණ ආහාර වේලකට සහල් අවුන්ස 4½ක් ඇතුළත් වන සේ බත් වේල් සැපයීමට ටෙන්ඩර්කරුවන් මිළ ගණන් දක්විය යුතුය.

(ii) දනට ආහාර උපලේඛනයේ දක්වා ඇති සහල් අවුන්ස 12 ප්‍රමාණය අවුන්ස 9 වශයෙන් වෙනස් කර ඇති නිසා 1970 ඔක්තෝබර් සිට ඒ වෙනු වෙන් අමතර පාන් සැපයීම අනවශ්‍ය වනු ඇත.

(iii) අවශ්‍ය සහල් ආහාර කොමසාරිස් විසින් සලාක නොවන මිළට සපයන අතර ඒ සඳහා ටෙන්ඩර්කරු මුදල් ගෙවිය යුතුය. දනට සලාක නො වන සහල් රාත්තලක මිළ ශත 50 යි. පරිත්‍යාග කරන ලද සහල් හෝ නොමිලයේ සහල් හෝ පිසීම සඳහා කොන්ත්‍රාත්කරුට සැපයුවහොත් ඒ සඳහා සලාක නොවන සහල් මිළට කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ.

කිසිම අවස්ථාවකදී සලාක සහල් සැපයුවහොත් ඒ සහල් සඳහා සලාක මිළට කොන්ත්‍රාත්කරු විසින් මුදල් ගෙවිය යුතුය. ඒඅකර සලාක නොවන සහල් මිලේ සහ සලාක සහල් මිලේ වෙනස කොන්ත්‍රාත්කරුගේ ආහාර වවුචරයෙන් අඩු කරනු ලැබේ.

(iv) කූපන් භාර නොදුනහොත් සේවකයන්ට සැපයිය යුත්තේ පාන්ය. කූපන් භාර දුනහොත් ඒ වෙනුවෙන් නොසපයනු ලබන පාන් සඳහා පහත සඳහන් පරිදි කොන්ත්‍රාත්කරුගේ වවුචරයෙන් මුදල් අඩු කරනු ලැබේ :—

(අ) කූපන්වලට ලබාගන්නා සහල් දනට මෙන් නොමිලයේ වුවහොත් නොසපයනු ලබන පාන්වල සම්පූර්ණ වටිනාකම අඩු කරනු ලැබේ.

(ආ) එවැනි කූපන්වලට සහල් නිකුත් කරන්නේ කොන්ත්‍රාත්කරු ගෙවන සලාක මිළට නම් නොසපයනු ලබන පාන්වල මිලේත් සලාක සහල් මිලේත් වෙනස අඩු කරනු ලැබේ.

වී. ෂන්මුගනාදන්,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරී.

1970 නොවැම්බර් මස 3 වැනි දින,
මඩකලපුවේ සෞඛ්‍ය සේවා අධිකාරීගේ කාර්‍යාලයේ දීය.

## උපලේඛනය

| (1) ආයතනය | (2) ටෙන්ඩර් සඳහා තැන්පත් මුදල් | (3) ඇප මුදල් | (4) ටෙන්ඩර් භාර ගන්නා අවසාන දිනය හා වේලාව | (5) ආහාර ප්‍රමාණය දළ වශයෙන් — සේවකයින්ට: අළුත් මාළු | සේවකයින්ට: හරක් මස් | සේවකයින්ට: කරවල | සේවකයින්ට: එළවළු | නොගෙවන රෝගීන්ට: අළුත් මාළු | නොගෙවන රෝගීන්ට: හරක් මස් | නොගෙවන රෝගීන්ට: කරවල | නොගෙවන රෝගීන්ට: එළවළු |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| එරාවූර් ග්‍රාමීය ආරෝග්‍යශාලාව | 100 | 600 | 1970.12.10 පෙ.ව. 10 | 200 | — | 430 | 880 | 1,180 | — | 2,200 | 4,710 |
| පොතුවිල් ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව | 100 | 400 | | 330 | — | 640 | 1,300 | 650 | — | 1,290 | 2,650 |
| අක්කරපත්තු ග්‍රාමීය ආරෝග්‍ය ශාලාව | 100 | 600 | | 390 | — | 630 | 1,250 | 580 | — | 1,280 | 2,510 |
| නින්දවූර් පර්යන්ත ඒකකය | 100 | 300 | | 400 | — | 790 | 1,600 | 50 | — | 120 | 240 |
| කළුවාන්චිකුඩි පර්යන්ත ඒකකය | 100 | 300 | | 1[illegible]0 | — | 190 | 270 | 640 | — | 1,280 | 2,560 |
| වාකරේ පර්යන්ත ඒකකය | 100 | 500 | | 330 | — | 640 | 1,340 | 240 | — | 470 | 1,030 |
| ලාහුගල මාතෘ නිවාසය | 100 | 300 | | 140 | — | 290 | 580 | 250 | — | 510 | 1,020 |
| නාවක්කාඩු මාතෘ නිවාසය | 100 | 300 | | 170 | — | 360 | 730 | 110 | — | 230 | 490 |
| තිරුකෝවිල් මාතෘ නිවාසය | 100 | 300 | | 190 | — | 370 | 750 | 140 | — | 220 | 430 |
| අක්කරපත්තු මාතෘ නිවාසය | 100 | 300 | | 50 | — | 100 | 200 | 60 | — | 120 | 300 |

11-386—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

අංක 14,926 සහ 1970 ඔක්තෝබර් මස 2 වැනි දින දරන ගැසට් පත්‍රයේ පෙල්ට රවුම් සැපයීම සඳහා වූ ටෙන්ඩර් ඇන්වීම කෙරෙහි අවධානය යොමු කරවන අතර එම ටෙන්ඩරයේ අවසාන දිනය 1970 නොවැම්බර් මස 23 වැනි දින පෙරවරු 10 දක්වා දීර්ඝ කර ඇති බව දන්වමු.

මිළට ගැණුම් කළමනාකාර.

242, හැව්ලොක් පාර,
කොළඹ 5.

11-301/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව

### කෝච සැපයීම සඳහා ටෙන්ඩරය

1970 දෙසැම්බර් 17 වැනි දින පෙරවරු 10 වන්තෙක් ඉහත සඳහන් සැපයීම් සඳහා ටෙන්ඩර් බාරගනු ලැබේ. රු. 100 ක ආපසු ලබාගත හැකි ටෙන්ඩර් තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ටෙන්ඩර් පෝරම් කොල මෙම කාර්යාලයෙන් ලබාගත හැක. ටෙන්ඩර් තැන්පත් මුදල් ටෙන්ඩර් පත් භාරගන්නා දිනට කලින් දින දහවල් 12 න් පසු බැරගනු නොලැබේ. අවලංගු කරන ලද ටෙන්ඩර් පෝරම් කොල රු. 5 ක් ගෙවීමෙන් ලබාගත හැක.

මිළට ගැණුම් කළමනාකාර.

ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
තැ. පෙ. 672, 242, හැව්ලොක් පාර,
කොළඹ 5.

11-301/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## යක්කල කර්මාන්ත ශාලා වත්ත වටා කටු කම්බි වැටක් ගැසීම සඳහා මිළ ගණන් කැඳවීම

1970.11.29 වැනි දින පස්වරු 1.30 වන තෙක් කටු කම්බි වැටක් ගැසීම සඳහා මිළ ගණන් භාරගනු ලැබේ. රු. 100 ක ආපසු ලබාගත හැකි තැන්පත් මුදලක් ගෙවා අවශ්‍ය ෆෝරම් කොළ මෙම කාර්යාලයෙන් ලබාගත හැක. තැන්පත් මුදල් මිළ ගණන් භාර ගන්නා දිනට කලින් දින දවල් 12න් පසු බාරගනු නොලැබේ.

මිළට ගැනුම් කළමනාකාර.
ලංකා රාජ්‍ය ලෝහ භාණ්ඩ සංස්ථාව,
242, හැව්ලොක් පාර,
කොළඹ 5.

11-361/3—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය දැව සංස්ථාව

### මාතර, මහනුවර, බදුල්ල, අනුරාධපුරය, යාපනය හා රත්නපුරය ප්‍රදේශවල කැලෑවලින් දැව සැපයීම සඳහා ටෙන්ඩර් කැඳවීම

පහත දක්වෙන ප්‍රදේශයන්ගේ දැව සැපයීම සඳහා කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ රාජ්‍ය දැව සංස්ථාවේ ක්‍රියාකාරි කළමනාකාර අංශයේ ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති විසින් ටෙන්ඩර් කැඳවනු ලැබේ.

**ටෙන්ඩර් කිරීමට සුදුස්සෝ.—**

2. (අ) රු. 1,00,000 ට වැඩි වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා—

මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ පළමුවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 1,00,000 වටිනාකමට දක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

(ආ) රු. 50,000 ට වැඩි හා රු. 1,00,000 අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා—

මේ ටෙන්ඩර් සඳහා කැලෑ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිවූ පළමුවෙනි, දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා රු. 50,000 වටිනාකම දක්වෙන පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

(ඇ) රු. 30,000 ට අඩු වටිනාකමින් යුත් ටෙන්ඩර් සඳහා—

පළමුවෙනි, දෙවෙනි පෙළ කොන්ත්‍රාත්කරුවන් හා ටෙන්ඩරයේ දක්වෙන වටිනාකමට පොදු ආකෘති 170 හි වත්කම් සහතිකයක් ඉදිරිපත් කළ හැකි අය.

3. මෙහි යට දක්වා ඇති වටිනාකමට දැව සැපයීමට සහ අනවශ්‍ය දැව ටෙන්ඩර් දන්වීමේ විග්‍රහ කර ඇති මිළට මිළදී ගැනීම සඳහා ටෙන්ඩර් :—

(i) මහනුවර ප්‍රදේශය :
(අ) කරුක්කමාඩු වැව.—කඳන් සැපයීම—රු. 3,000 වටිනාකමට
(ආ) මැදඋල්පොත.—කඳන් සැපයීම—රු. 10,000 වටිනාකමට

(ii) බදුල්ල ප්‍රදේශය :
(අ) බටලආර වැව.—කඳන් සැපයීම—රු. 3,000 වටිනාකමට

(iii) අනුරාධපුර ප්‍රදේශය :
(අ) මනිඅර්සන්කුලම්.—කඳන් සැපයීම—රු. 10,000 වටිනාකමට

(iv) රත්නපුර ප්‍රදේශය :
(අ) නිරිඇල්ල වතුයායෙන් ආපසු ලබාගත් ඉඩම්.—කඳන් හා සිල්පර සැපයීම—රු. 15,000 වටිනාකමට

4. මෙහි යට දක්වා ඇති වටිනාකමට දැව සැපයීම සඳහා ටෙන්ඩර් :—

(i) මාතර ප්‍රදේශය :
(අ) දියදව 17.—කඳන්, සිල්පර හා විදුලි සම්ප්‍රේක්ෂණ කණු සැපයීම—රු. 50,000 වටිනාකමට

(ii) මහනුවර ප්‍රදේශය :
(අ) වැලඩකන්ද යෝජිත රක්ෂිතය.—සිල්පර හා ඉරු ලී සැපයීම—රු. 3,00,000 වටිනාකමට

(iii) අනුරාධපුර ප්‍රදේශය :
(අ) සුංගාවිල සෝමාවතී වනාන්තරය.—කඳන් හා සිල්පර සැපයීම—රු. 1,00,000 වටිනාකමට

(iv) රත්නපුරය ප්‍රදේශය :
(අ) කෝප්පකන්ද ර.අ.කැ.—කඳන් හා සිල්පර සැපයීම—රු. 2,50,000 වටිනාකමට

(v) යාපනය ප්‍රදේශය :
(අ) මානවලම් පද්දමුරිප්පුකුලම් ර.අ.කැ.—කඳන් හා සිල්පර සැපයීම—රු. 1,00,000 වටිනාකමට

5. 70.11.29 වැනි දින අ.භා. 2 දක්වා ටෙන්ඩර් ආකෘති පත්‍ර නිකුත් කරනු ඇත.

6. 70.11.30 වැනි දින පූ.භා. 11 ට ටෙන්ඩර් ආකෘති පත්‍ර භාරගැනීම අවසන් කරනු ඇත.

7. වැඩි විස්තර රාජ්‍ය දැව සංස්ථාවේ ඒ ඒ ප්‍රාදේශීය කළමනාකාර වරුන්ගෙන් හෝ කොළඹ 5, තිඹිරිගස්යාය පාරේ අංක 265 දරණ ස්ථානයේ ක්‍රියාකාරි කළමනාකරුගෙන් හෝ ලබාගත හැකිය.

ඒ. ඩී. ආර්. රත්නරාජා,
ටෙන්ඩර් මණ්ඩලයේ සභාපති වෙනුවට.

1970 නොවැම්බර් මස 12 වැනි දින,
රාජ්‍ය දැව සංස්ථාව,
ක්‍රියාකාරී අංශය,
265, තිඹිරිගස්යාය පාර,
කොළඹ 5.

11-321—70.11.12 දින 14,932 දරන ගැසට් පත්‍රය

---

## ශ්‍රීපාදස්ථාන මාර්ගය දෙපස රජයේ ඉඩම් තාවකාලික වෙළඳ සැල් (කඩ) සඳහා බදු දීම—1970-71

මස්කෙළිය හරහා ශ්‍රීපාදස්ථානයට යන මාර්ගයේ දෙපස තිබෙන මෙහි පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් රජයේ ඉඩම් 1970-71 වන්දනා කාලයේදී තාවකාලික වෙළඳ සැල් (කඩ) පැවැත්වීම සඳහා බදු දීම පිණිස මුද්‍රාව (සීල්) තබන ලද ඉල්ලුම්පත්‍ර (ටෙන්ඩර්) 1970 දෙසැම්බර් මස 10 වැනි දින පෙරවරු 10 දක්වා මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති විසින් භාරගනු ලැබේ.

2. " ශ්‍රීපාදස්ථානයට යන මාර්ගයෙන් වෙළඳ සැල් ඇමීම සඳහා " යන වැකිය ලියුම් කවරයේ වම්පස මුදුනේ ලිවිය යුතු ය. තවද, මෙහි පහත උපලේඛනයේ සඳහන් එක් එක් ඉඩම් කැබැල්ල වෙනුවෙන් වෙන වෙනම ඉල්ලුම්පත්‍ර ඉල්ලුම් කරන ඉඩම් කැබැල්ල පැහැදිලිව සඳහන් කොට ඉදිරිපත් කළ යුතු ය.

3. ඉල්ලුම්පත්‍ර ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. නැතහොත් කච්චේරියේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියෙහි තැන්පත් කළ යුතු ය.

4 ටෙන්ඩර් ඉදිරිපත් කළ යුත්තේ ඒ සඳහා නියමිත ෆෝර්මයේ ය. ඉල්ලුම් කරන එක් එක් ඉඩම් කැබැල්ලක් සඳහා රු. 50 ක මුදලක් මෙම කච්චේරියේ තැන්පත් කොට ඒ වෙනුවෙන් ලැබෙන කුවිතාන්සිය මෙම කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අවශ්‍ය ටෙන්ඩර් ෆෝර්ම ලබාගත යුතු ය.

5. ඉල්ලුම්පත්‍රයෙහි මැකීමක් කොට හෝ වරදක් කොට හෝ වරදක් නිවැරදි කොට ඇතොත් ඒ ස්ථානයෙහි ඉල්ලුම්කරුගේ කෙටි අත්සන යෙදිය යුතු ය. ඉල්ලුම් කරන බදු මුදල අකුරෙන් සහ ඉලක්කමෙන් සඳහන් කළ යුතුය. යම් හෙයකින් අකුරෙන් සඳහන් මුදල ඉලක්ක මෙන් සඳහන් කළ මුදලට වෙනස් වේ නම් නිවරැදි සේ පිළිගනු ලබන්නේ අකුරෙන් සඳහන් මුදල ය.

6. මේ විස්තර පත්‍රයෙහි එකද කොන්දේසියකට අනුකූලතාවය නොදක්වන ඉල්ලුම්පත්‍රයක් වේ නම් එය සැලැකිල්ලට භාජනය කරනු නොලැබේ.

7. ටෙන්ඩර් පිළිබඳ වැරදිකරුවන්ගේ ලැයිස්තුවෙහි නම සඳහන් කිසිදු ඉල්ලුම්කරුවෙකුගේ ඉල්ලුම්පත්‍ර භාරගනු නොලැබේ. තවද, දැනට බද්දට ලබාගත් ඉඩම් කැබලිවල කඩ සාදා ඇති අයගෙන් ද, ඔවුන්ගේ නියෝජිතයන්ගෙන් ද ටෙන්ඩර්පත්‍ර භාරගනු නොලැබේ.

8. ඉල්ලුම්පත්‍ර භාරගත් පසු එම ඉල්ලුම්කරු විසින් මුළු බදු මුදලම දන්වීමක් එවීමෙන් දින 7 ක් ඇතුළත තැන්පත් කොට අවශ්‍ය බදු බලපත්‍ර ලබා නොගතහොත් ඉල්ලුම්පත්‍ර අවලංගු වනු ඇත.

9. තෝරාගත් ඉල්ලුම්කරුට ඉඩම් කැබැල්ල පිළියෙල කිරීම සඳහා අඩි 30 × 40 ක ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ලක් සුද්ධ කළ හැකිය.

10. තෝරාගත් ඉල්ලුම්කරු විසින් රජයේ ඉඩමකින් ලී කැපීම හෝ රජයේ ඉඩමක් අවසර නොලබා එළි කිරීම නොකළ යුතු ය. අවසර නැතිව රජයේ ඉඩමකින් ලී නොකැපීම සඳහා ආරක්ෂා විධිවිධානයක නියායෙන් තෝරාගත් ඉල්ලුම්කරු විසින් රු. 100ක මුදලක් කච්චේරියේ තැන්පත් කළ යුතු සි. මේ කොන්දේසිය සතුටුදායක අන්දමින් අනුගමනය කළහොත් එසේ තැන්පත් කළ මුදල බද්ද අවසානයේ දී ඉල්ලුම්කරුට ආපසු දෙනු ලැබේ.

11. තෝරාගත් ඉල්ලුම්කරු විදුලි දෙපාර්තමේන්තුව මගින් පොලොව යටින් දමා ඇති විදුලි කම්බිවලට කිසිදු අනතුරක් නොකළ යුතු ය.

12. තෝරාගත් ඉල්ලුම්කරු තමාගේ කඩයේ ඇති කෑම මැස්සන් ආදී රෝග බෝකරන සතුන්ගෙන් ප්‍රවේසම්ව තබා ගත යුතුයි. තවද, මෙම කෑම වර්ග සහ ඒවා තබා ඇති අන්දම සෞඛ්‍ය නීති රීතීන්ට එකඟ විය යුතු ය.

13. සෞඛ්‍ය නිලධාරීන්ගේ උපදෙස් අනුව සෑම කඩයක් වෙනුවෙන් ම අඩු වශයෙන් (සිමෙන්ති ඇල්ලක් සහිත) එක වැසිකිලියක් වත් තිබිය යුතු ය. තෝරාගත් ඉල්ලුම්කරු මේ කොන්දේසි මත එක කඩයක් වෙනුවෙන් රු. 75 ක් කච්චේරියේ තැන් පත් කළ යුතු ය. වර්ෂ 1971 ජනවාරි මස 1 වැනි දිනට පෙර සෞඛ්‍ය නීති රීතීන්ට එකඟව වැසිකිලියක් සාදා නිම කළහොත් මේ තැන්පත් මුදල ආපසු ගෙවනු ලැබේ. නැතහොත් මේ මුදල වැසිකිලියක් සෑදීම සඳහා වැය කරනු ඇත.

14. ඉතා අඩු වශයෙන් 1971 ජූනි මස 1 වැනි දිනට පෙර බද්දට ගත් ඉඩම් කැබැල්ල අත්හැර දැමිය යුතු ය. තෝරාගත් ඉල්ලුම්කරු බද්ද අත්හැර දැමීමට පෙර සෞඛ්‍ය නිලධාරීන්ගේ මතයට සරිලන සේ කඩය කඩා දමා, ස්ථානය ශුද්ධ පවිත්‍ර කොට වැසිකිලි වළවල් ආදිය වසා දැමිය යුතු ය. මෙසේ නොකළහොත් රු. 75 ක් තැන්පත් මුදල රාජසන්තක වේ.

15. ඉල්ලුම්පත්‍රයක කොටස් පිළිගැනීමේ හෝ ඉල්ලුම්පත්‍ර ඇතමක් ප්‍රතික්ෂේප කිරීමේ අවිවාදාත්මක බලය මහනුවර දිස්ත්‍රික්කයේ දිසාපති කෙරෙහි පවතී.

16. මේ පිළිබඳ වැඩි දුරටත් විස්තර මහනුවර දිසාපතිගෙන් ලබා ගත හැකි ය.

### උපලේඛනය

1. ගඟුලේ තැන්නේ, නිස්සංබ ලෙන අසළ ලිඳ අසල පිහිටි ඉඩම.
2. තැන්න-කුරුණෑගල දන් සැලට අඩි 125 පහළින් පිහිටි ඉඩම.
3. තැන්න-කුරුණෑගල දන් සැලට අඩි 75 පහළින් පිහිටි ඉඩම.
4. තැන්න-කුරුණෑගල දන් සැලට අඩි 75 ඉහළින් පිහිටි ඉඩම.
5. ඉදිකටුපාන සහ තැන්නට අතර පිහිටි ඉඩම (විදුලි පහන් කණුව හා ලිඳ ඉදිරිපිට).

එම්. බී. තෙන්නකෝන්,
මහනුවර දිසාපති වෙනුවට.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
මහනුවර කච්චේරියේ දීය.

11–239—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## තැපැල් සහ විදුලි සංදේශ දෙපාර්තමේන්තුව

### සේවයට නුසුදුසු මෝටර් වාහන 17ක් විකිණීම

මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩා භූමියෙහි ඇති, විදුලි සංදේශ ප්‍රවාහන අංශයට අයත් සේවයට නුසුදුසු මෝටර් වාහන 17ක් විකිණීම සඳහා, කොළඹ 1, තැපැල් හා විදුලි සංදේශ මූලස්ථානයේ පෝස්ට්මාස්ටර් ජනරාල් සහ විදුලි සංදේශ අධ්‍යක්ෂ කාර්යාලයේ, තැපැල් හා විදුලි සංදේශ දෙපාර්තමේන්තු ගැණුම් පත් මණ්ඩල සභාපති විසින්, 1970 දෙසැම්බර් මස 8 වෙනි දින පෙරවරු 10 දක්වා ටෙන්ඩර් පත් භාරගනු ලැබේ.

2. කොළඹ 1, තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානයේ පස්වන මහලේ, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලයෙන් ලබාගත් පෝර්ම වලින් පිටපත් දෙකකින් යුක්තව ටෙන්ඩර් පත් ඉදිරිපත් කළ යුතුය. ඉහත සඳහන් කාර්යාලයේදී ටෙන්ඩර් ලියකියවිලි පරීක්ෂා කර බැලීමටද, අවශ්‍ය විස්තර දැනගැනීමටද පුළුවන. මරදානේ තැපැල් සහ විදුලි සංදේශ ගබඩාවේ ප්‍රවාහන නිලධාරී තැන හමුවී වාහන පරීක්ෂාකර බැලීමට පිළිවෙල යොදා ගත හැකිය.

3. තැපැල් කාර්යාලයක හෝ මධ්‍ය විදුලි පණිවුඩ කාර්යාලයේ විදුලි පණිවුඩ කැෂියර්වෙත ටෙන්ඩර් තැන්පත් මුදල් වශයෙන් රු. 100ක් තැන්පත් කොට ලබාගත් කුවිතාන්සියක්, ප්‍රධාන විදුලි සංදේශ ඉංජිනේරු කාර්යාලය වෙත ඉදිරිපත් කිරීමෙන් 1970 දෙසැම්බර් මස 3 වෙනි දින දවල් 12 වනතෙක් බලාපොරොත්තු ටෙන්ඩර්කරුවනට ටෙන්ඩර් ඉල්ලුම්පත් ලබාගත හැකිය.

වී. ඇම්. අබේසේකර,
පෝස්ට්මාස්ටර් ජනරාල් හා විදුලි සංදේශ අධ්‍යක්ෂ.

පාලන කොට්ඨාශය,
තැපැල් සහ විදුලි සංදේශ මූලස්ථානය,
ලෝටස් පාර,
කොළඹ 1.

11–265—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ලංකා ටයර් සංස්ථාව

වතුර පිරිසිදු කිරීමට ගන්නා "හයිඩ්රේටඩ් ලයිම්" ටොන් 100ක් සැපයීම සඳහා ලංකා ටයර් සංස්ථාව විසින් සීල් තබන ලද මිළ ගණන් කැඳවනු ලැබේ.

සීල් තබන ලද මිළ ගණන් "හයිඩ්රේටඩ් ලයිම් සඳහා මිළ ගණන්" යනුවෙන් කවරයේ වම් පස උඩ කෙලවරෙහි ලකුණු කොට කැළණියේ ලංකා ටයර් සංස්ථාවේ සැපයුම් කළමනාකාර තැන වෙත 1970 දෙසැම්බර් 6 වෙනිදා පස්වරු 2.30 ට ප්‍රථමයෙන් එවිය යුතුය.

වැඩිපුර විස්තර සැපයුම් කළමණාකාර තැනගෙන් ලබා ගත හැකිය.

ලංකා ටයර් සංස්ථාව, කැළණිය.

සැපයුම් කළමනාකාර.

ටැලිපෝන් : 305, 241, 274, කැළණිය.

11–312—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ජාතික කිරි මණ්ඩලය

පහත දක්වා තිබෙන ද්‍රව්‍ය රාගම, වැලිසර ජාතික කිරි මණ්ඩලයේ පිටිකිරි යළි ඇහිරීමේ කර්මාන්ත ශාලාවෙන් මිළදී ගෙන, එම ස්ථානයෙන් ඒවා ඉවත් කරගෙන යාම පිණිස 1970 දෙසැම්බර් මස 3 වැනි දින අපරභාග 2.00 දක්වා මවිසින් ටෙන්ඩර් පත් භාර ගනු ලැබේ.

### විස්තර

1. රාත්තල් 56 ඇහිරිය හැකි හය පටකින් යුත් (පලුදු වූ හා පලුදු නොවූ) හිස් කඩදසි බෑග්
2. රාත්තල් 56 ඇහිරිය හැකි පස් පටකින් යුත් (පලුදු වූ හා පලුදු නොවූ) හිස් කඩදසි බෑග්
3. රාත්තල් 50 ඇහිරිය හැකි හය පටකින් යුත් (පලුදු වූ හා පලුදු නොවූ) හිස් කඩදසි බෑග්
4. රාත්තල් 50 ඇහිරිය හැකි පස් පටකින් යුත් (පලුදු වූ හා පලුදු නොවූ) හිස් කඩදසි බෑග්
5. රාත්තල් 56 ඇහිරිය හැකි පොලිතීන් බෑග්
6. රාත්තල් 50 ඇහිරිය හැකි පොලිතීන් බෑග්
7. පලුදු වූ රාත්තල් $2\frac{1}{2}$ හිස් පිටිකිරි ටින්
8. පලුදු වූ රාත්තලේ හිස් පිටිකිරි ටින්
9. ලී පෙට්ටිවල ප්‍රමාණය පහත දැක්වේ :—

$22\frac{1}{2}'' \times 15\frac{1}{4}'' \times 9\frac{1}{4}''$
$21\frac{1}{4}'' \times 15'' \times 11\frac{1}{2}''$
$21'' \times 15\frac{1}{2}'' \times 9\frac{1}{4}''$
$20\frac{3}{4}'' \times 13'' \times 12''$
$19\frac{1}{4}'' \times 15'' \times 13\frac{1}{4}''$
$18\frac{1}{4}'' \times 18\frac{1}{4}'' \times 13\frac{3}{4}''$
$18\frac{1}{4}'' \times 14\frac{1}{2}'' \times 9\frac{5}{8}''$
$18\frac{1}{8}'' \times 17\frac{7}{8}'' \times 13''$
$17\frac{3}{4}'' \times 12\frac{1}{2}'' \times 9\frac{3}{4}''$
$17'' \times 16'' \times 11''$

10. වානේ පටි.

ඉහත සඳහන් ද්‍රව්‍ය රාගම, වැලිසර (කොළඹ/මීගමු පාරේ 8 සැතපු කණුව) පිටිකිරි යළි ඇහිරීමේ කර්මාන්ත ශාලාවේදී වැඩ කරන සාමාන වේලාවන් තුළ පරීක්ෂා කළ හැකි වේ.

පසුව ආපසු ගෙවනු ලබන රු. 250 තැන්පත් මුදලක් තබන අයදු කරුවන්ට රාගම, වැලිසර, පිටිකිරි යළි ඇහිරීමේ කර්මාන්ත ශාලා ගණකාධිකාරී විසින් 1970 දෙසැම්බර් මස 2 වැනි දින අපරභාග 3 දක් ටෙන්ඩර් පත්‍රිකා නිකුත් කරනු ලැබේ.

වැඩිමනත් විස්තර රාගම, වැලිසර පිහිටුවා තිබෙන පිටිකිරි යළි ඇසිරී කර්මාන්ත ශාලාවේ සම්පාදනාගාර හා වාණිජ කළමනාකරුගෙන් ලබාග හැක.

සභාපති,
කිරි මණ්ඩල

කිරි මණ්ඩලීය මූලස්ථානය,
33, එළිබැන්ක් පාර,
කොළඹ 5.

11–389—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## බඩු බාහිරාදිය විකිණීම

### රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ එෆ්. 1 විකිණීම් ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1970 නොවැම්බර් මස 24 වෙනි දින පෙ.ව. 10.00 ට එම ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 නොවැම්බර් මස 23 වෙනි දින එම බඩු ගැණුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිලයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැළකිය යුතුය.

ඊ. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම්/40.
1970 නොවැම්බර් මස 4 දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. 'නෙස්ටම්' ළදරු ආහාර කාටුන් 1 යි.
2. කඩදාසි රීල් 2 යි.
3. විදුලි ස්විච් පෙට්ටි 1 යි.
4. 'හොන්ඩා' මෝටර් සයිකල් 1 යි.
5. ට්‍රැක්ටර් කොටස් පෙට්ටි 1 යි.
6. ඉන්ටර්නල් මයික්‍රොමීටර් පෙට්ටි 1 යි.
7. වෛද්‍ය පොත්පත් පෙට්ටි 1 යි
8. මේන් ස්විච් පෙට්ටි 1 යි.
9. විද්‍යාත්මක රසායනාගාර උපකරණ පෙට්ටි 1 යි.
10. මුද්‍රණ තීන්ත කාටුන් 1 යි.
11. රසායන ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
12. දුකැති කාටුන් 1 යි.
13. රෙසින් සහ වැලෝ ඩ්‍රම් 17 යි.
14. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 1 යි.
15. පැලෑටි නාශක තෙල් ඩ්‍රම් 1 යි.
16. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 1 යි.
17. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 2 යි.
18. කොම්ප්‍රෙසර් පෙට්ටි 1 යි.
19. හිසකේ සායම් පෙට්ටි 1 යි.
20. කන්නාඩි පෙට්ටි 1 යි.
21. මඩගාඩ් පෙට්ටි 1 යි.
22. එකතු කිරීමේ යන්ත්‍ර පෙට්ටි 1 යි.
23. ත්‍රෙඩ් බාර් පෙට්ටි 1 යි.
24. ඔටෝ සිකර්ට් කාටුන් 1 යි.
25. වැලි කඩදාසි පෙට්ටි 1 යි.
26. වීවීමේ දල් පෙට්ටි 1 යි.
27. ප්‍රචාරක ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
28. රසායන ද්‍රව්‍ය ඩ්‍රම් 4 යි.
29. ඉටි මලු 1 යි.
30. වල්කනයිසින් රබර් ෆ්‍රෙලැප්ස් පෙට්ටි 1 යි.
31. උණුවතුර බෝතල් ඇතුල් භාජන පෙට්ටි 1 යි.
32. මුද්‍රිත ද්‍රව්‍ය පෙට්ටි 2 යි.
33. මුද්‍රිත ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
34. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
35. මුද්‍රිත ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
36. සූට්කේස් සරනේරු පෙට්ටි 1 යි.
37. ප්‍රොජෙක්ටිව් ෂීට් පෙට්ටි 1 යි.
38. විදුලි උපකරණ පෙට්ටි 1 යි.
39. පොළුව ඔපදමන යන්ත්‍ර පෙට්ටි 1 යි.
40. ටෝච් විදුලි බුබුළු පෙට්ටි 1 යි.
41. කඩදාසි බෙල් 1 යි.
42. බෝල් රේසර් පෙට්ටි 1 යි.
43. රසායනාගාර උපකරණ පෙට්ටි 2 යි.
44. සුදු කඩදාසි පෙට්ටි 1 යි.
45. යන්ත්‍රෝපකරණ කොටස් පෙට්ටි 1 යි.
46. පිඟන් බඩු පෙට්ටි 1 යි.
47. මෝටර් රථ අමතර කොටස් පෙට්ටි 1 යි.
48. 'ඩෙස්ක් වර්ක්' පොත් පෙට්ටි 1 යි.
49. 'සිබකෝන් වර්කිච්ස්' නිල් පෙට්ටි 1 යි.
50. වීවීමේ රෝද පෙට්ටි 3 යි.
51. බයිසිකල් සීනු පෙට්ටි 1 යි.
52. රතු සිමෙන්ති කුඩු පෙට්ටි 1 යි.
53. යන්ත්‍රෝපකරණ කොටස් පෙට්ටි 1 යි.
54. ට්‍රැක්ටර් කොටස් පෙට්ටි 1 යි.
55. ටින් බොටම් පෙට්ටි 1 යි.
56. ටයර් 4 යි.
57. ලී දඬු ආරක්ෂා කරන ද්‍රව්‍ය ටින් 1 යි.
58. ඇල්කතීන් මලු 1 යි.
59. පාවිච්චි කළ ටයර් 5 යි.
60. සිමෙන්ති අච්චු පෙට්ටි 1 යි.
61. කොම්ප්‍රෙසර් පෙට්ටි 1 යි.
62. රසායනාගාර උපකරණ පෙට්ටි 1 යි.
63. කොන්ක්‍රීට් අච්චු පෙට්ටි 1 යි.
64. රසායන ද්‍රව්‍ය පෙට්ටි 1 යි.
65. ලී කපන යන්ත්‍ර කොටස් පෙට්ටි 1 යි.
66. කපු මිටි 3 යි.
67. බුල්ඩෝසර් කොටස් පෙට්ටි 1 යි.
68. රෝද සමඟ ටයර් 4 යි.
69. කපු නූල් මිටි 12 යි.
70. පොත් පෙට්ටි 3 යි.
71. කපු මිටි 2 යි.
72. කිරිගරුඬ රෝද 1 යි.
73. ට්‍රැක්ටර් ටයර් 2 යි.
74. ටයර් 110 යි.
75. පරණ ඇඳුම් මිටි 16 යි.
76. කපු නූල් මිටි 12 යි.

11–405—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියයි

1970 නොවැම්බර් 27 වෙනි දින පෙ. ව. 9 ට ඉඩම් සංවර්ධන දෙපාර්තමේන්තුවේ කිලිනොච්චිය ලී මෝලේදී පිටපළු ඝන යාර 800 ක පමණ තොගයක් ඝන යාර 100 බැගින් ම විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

අවශ්‍ය අයට සතියේ දිනවල උදේ 7 සිට සවස 4.30 දක්වාත් පෙර පෝය දිනවල උදේ 7 සිට දවල් 12.30 දක්වාත් මේවා කිලිනොච්චිය ලී මෝලේදී පරීක්ෂා කර බැලිය හැක.

ගැනුම්කරුවන්ට තේරීමට හෝ නුසුදුසු යැයි ඉවත දැමීමට අවසර නැත.

ගැනුම්කරු 10% ක මුදලක් එවලේම ගෙවිය යුතු අතර ඉතිරි මුදල දින 3ක් ඇතුලත මගේ කාර්යාලයේ තැන්පත් කළ යුතුයි. ඉතිරි මුදල දින 3ක් ඇතුලත ගෙවීමට අපහසු වන ගැනුම්කරුවන්ගේ 10% මුදල ආපසු ගෙවනු නොලැබේ.

තෝරා ගත් ගැනුම්කරුවන් වෙන්දේසි කළ දිනයේ සිට සති දෙකක් ඇතුලත පිටපළු ඉවත් කර ගෙන යා යුතුය.

ගැනුම්කරුවන් ඉහත සඳහන් නියෝගයන්ට අනුව ක්‍රියා කළ යුතු අතර වැඩි විස්තර අවශ්‍ය නම් මගෙන් හෝ කිලිනොච්චිය ලී මෝලේ කළමනාකරුගෙන් ලබාගත හැකිය.

එස්. කුමාරසාමි,
ඉඩම් සංවර්ධන නිලධාරී, මාන්කුලම.

1970 ඔක්තෝබර් මස 1 දින,
මාන්කුලම ඉඩම් සංවර්ධන කාර්යාලයේදීය.

11–285—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## රේගුවේ වෙන්දේසියක්

කොළඹ, රේගුවේ කොච්චිකඩේ ගුදමෙහි තැන්පත් පහත සඳහන් බඩු 1970 නොවැම්බර් මස 19 වෙනි දින පෙ.ව. 10 ට එම ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ. 1970 නොවැම්බර් මස 18 වෙනි දින එම බඩු ගැනුම්කරුවන්ට පරීක්ෂා කර බැලීමට පිළිවන.

මෙම වෙන්දේසියෙන් මිළයට ගන්නා බඩු වෙන්දේසිය අනුමත කර දින හතකින් ගෙන නොගියහොත් එම බඩු නැවත විකුණන බවත්, ඒ සඳහා ගෙවා ඇති අත්තිකාරම් මුදල් රාජසන්තක වන බවත් සැලකිය යුතුය.

ටී. බී. ඒ. දසනායක,
ප්‍රධාන රේගු අයකැමි වෙනුවට.

මගේ අංකය : ඒඩී/විකිණීම/39.

1970 නොවැම්බර් මස 3 වන දින,
කොළඹ, රේගු දෙපාර්තමේන්තුවේ දී ය.

1. කපු බෙල් 2 යි
2. කාඩ්බෝඩ් බෙල් 1 යි
3. රෙයන් සහ නයිලොන් නූල් තොග 1 යි
4. කලු කුඩු තොග 1 යි
5. කෘත්‍රිම හම් රෙදි තොග 1 යි
6. ඊයම් තොග 1 යි
7. යීස්ට් තොග 1 යි
8. ලාම්පු ආවරණ තොග 1 යි
9. ඇස්බැස්ටස් ක්ලච් ප්ලේට් ලයිනින් තොග 1 යි
10. කපු නූල් සුදු සහ පාට තොග 1 යි
11. ගල් ලෑලි තොග 1 යි
12. කිරි පොවන බෝතල තොග 1 යි
13. කඩදාසි රීම් තොග 1 යි
14. සුදු සහ පාට කඩදාසි තොග 1 යි
15. කාර් ටයර් ටියුබ් තොග 1 යි
16. රූෆින් ෆේල්ට් තොග 1 යි
17. ' හීරෝ ' බයිසිකල් අමතර කොටස් තොග 1 යි
18. ටැනිස් බෝල තොග 1 යි
19. සෙලොපින් කඩදාසි තොග 1 යි
20. බයිසිකල් ටයර් තොග 1 යි
21. නොයෙකුත් වර්ග බෝතල් තොග 1 යි
22. ෆ්ලොරසන් ටියුබ් ලොකු සහ කුඩා තොග 1යි
23. සූට් කේස් ෆයිබර් බෝඩ් තොග 1 යි
24. පාට ප්ලාස්ටික් රෝල් තොග 1 යි
25. වයර් කොයිල් (කුඩා) තොග 1 යි
26. වයර් කොයිල් (ලොකු) තොග 1 යි
27. බෙලෙක් තහඩු තොග 1 යි
28. කුකර් ප්ලේට් තොග 1 යි
29. වයර් මිටි තොග 1 යි
30. බයිසිකල් ටියුබ් කොටස් තොග 1 යි
31. ලී පොලු තොග 1 යි
32. ඉටි තොග 1 යි
33. ෆයර් ක්ලේ තොග 1 යි
34. වයර් කටර් තොග 1 යි
35. වෙල්ඩින් රොඩ් තොග 1 යි
36. වයිටින් තොග 1 යි
37. රබර් ෂීටින් තොග 1 යි
38. පාවිච්චි කළ වූලන් ඇඳුම් තොග 1 යි
39. ගැස්කට් සෙලැක් කම්පවුන්ඩ් තොග 1 යි
40. පාහින යන්ත්‍ර කොටස් (බෙයරින්ස්) තොග 1 යි
41. "ඌෂා" මැෂින් කොටස් තොග 1 යි
42. යකඩ ඉස්කුරුප්පු සහ පෙති තොග 1 යි
43. කුඩා ඊයම් කැලි තොග 1 යි
44. ' නෝ රොඩ් ' කිලර් තොග 1 යි
45 මෝටර් රථ දුනු තොග 1 යි
46. ටයර් දමූ රෝද 2 යි
47. දම්වැල් 1 යි
48. විදුලි පංකා කොටස් තොග 1 යි
49. රසායන ද්‍රව්‍ය මලු 1 යි
50. ගෙන්දගම් තොග 1 යි
51. මෙතිලේටඩ් ස්පිරිට් (බ පත්‍ර ඇති අයට පමණයි)
52. මෙතිලේටඩ් ස්පිරිට් හිස් භාජන
53. හිස් තීන්ත භාජන
54. යකඩ සහ වානේ පොලු
55. නොයෙකුත් තඹ පයිප්ප
56. මැටි වතුර භාජන—කුඩා (සින්ක්ස්)
57. මැටි වතුර භාජන—ලොකු (සින්ක්ස්)
58. විටලයිස් ඔයිල් තොග 1 යි
59. ප්ලාස්ටික් කොම්පවුන්ඩ් තොග 1
60. එස්ලොන් පයිප්ප 1 යි
61. රසායන ද්‍රව්‍ය තොග 1 යි
62. ලොකු ස්පැනර් අඬු 2 යි
63. නොයෙකුත් චිමිනි තොග 1 යි
64. ෆ්ලෙක්සිබල් ආර්මර්
65. ට්‍රැක්ටර් කොටස්
66. ට්‍රැක්ටර් කොටස් (කප් ලින්ස්)
67. ට්‍රැක්ටර් කොටස් (බ්‍රේක් ඩිස්ක්ස්)
68. සුදු යකඩ පොලු
69. තඹ පොලු
70. වයර් රීල්
71. පාහින යන්ත්‍ර කොටස්—තල
72. ඇලුමිනියම් ප්‍රේම් සහ චැනල් තොග 1 යි
73. මෝර තෙල් බෝතල කොග 1 යි
74. ෆ්ලෑෂ් ලයිට්ස්
75. සහරා තොග 1 යි
76. ගල්කටු
77. හෝස් පයිප්ප
78. බවුරිල් තොග 1 යි
79. ඇමෝනියම් ක්ලෝරයිඩ්
80. ඇඹරුම් ගල්
81. ගැල්වනයිස් ඉස්කුරුප්පු පෙති සහ වොෂර් තොග 1 යි
82. ටින් සර්කල්ස්—ලොකු
83. ෆෑන් බ්ලේඩ්ස්
84. වී බ්ලේඩ්ස්
85. ටින් ඉන්ගට්ස්
86. විදුලි උපකරණ—චෝක්
87. ' එල්වොලැක් ' ටින් 1 යි
88. මෝටර් රථ අමතර කොටස්
89. බල්බ් කැප්ස් (පිත්තල)
90. රේෆ්‍රිජරේෂන් ඔයිල් ඩ්‍රම් 1 යි
91. මයිල්ඩ් ස්ටීල් $\frac{1}{4}$" ප්ලැට් ලෙන්ත්
92. වෙල්ඩින් රොඩ් තොග 1 යි
93. පාහින යන්ත්‍ර කොටස් තොග 1 යි
94. කිරිගරුඬ කැබලි තොග 1 යි
95. මිශ්‍ර පොහොර මලු තොග 1 යි
96. අත් යන්ත්‍ර විවීමේ උපකරණ තොග 1 යි
97. තීන්ත අමු ද්‍රව්‍ය මලු
98. බෙරෙක් බැටරි තොග 1 යි
99. ට්‍රැක්ටර් අමතර කොටස්
100. ඩයි

11–291—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## බන්ධනාගාර දෙපාර්තමේන්තුව

### පාවිච්චි කළ වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1970 දෙසැම්බර් මස 8 වැනි දින පෙරවරු 10 ට කොළඹ රිමාන්ඩ් බන්ධනාගාර ආරක්ෂක අංශ භූමියේදී පහත සඳහන් අංක දරණ වාහන තුන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ :—

| වාහනයේ අංකය | වර්ගය |
|---|---|
| 1. 33 ශ්‍රී 2026 | මොරිස් කොමර්ෂල් |
| 2. 33 ශ්‍රී 2029 | මොරිස් කොමර්ෂල් |
| 3. 33 ශ්‍රී 892 | ඉන්ටර් නැෂනල් |

2. 1970 නොවැම්බර් මස 13 වැනි දින සිට 1970 දෙසැම්බර් 5 වැනිදා දක්වා මෙම වාහන ඉහත සඳහන් ස්ථානයේදී කාර්යාලීය වේලාවලදී පරීක්ෂා කර බැලීමට පුළුවන.

3. වැඩිම ඉල්ලුම්කරු එකෙනෙහිම මුදල් ගෙවා පැය 24 ක් ඇතුළත දී වාහන රැගෙන යා යුතුය.

4. ඉල්ලුම් කළ යම් ඉල්ලුම්කරුවෙකුගේ මිල ගණන් නැතහොත් සියළුම ඉල්ලුම්කරුවන්ගේ මිල ගණන් වුවත් ප්‍රශ්නයක් නොමැතිව ප්‍රතික්ෂේප කිරීමේ බලය රජය සතුව ඇත.

ඒ. ඒ. ද සිල්වා,
වැ. බ. බන්ධනාගාර කොමසාරිස්.

11–340—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

### වෙන්දේසියක්

පහත සඳහන් ගවයින් 1970 නොවැම්බර් මස 30 වෙනි දින පෙරවරු 10.00 ට අංගොඩ මානසික රෝහල කිරිපට්ටියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

| ගවයාගේ අංකය | වර්ගය | විස්තර |
|---|---|---|
| 147 | අයර්ෂයර් දෙමුහුන් | එළදෙන |
| 171 | ජර්සි දෙමුහුන් | එම |
| 175 | එම | එම |
| 178 | එම | එම |
| 179 | එම | එම |
| 195 | එම | එම |
| 212 | එම | එම |
| 147 කේ | එම | වස්සු පැටවා |
| 157 ජී | එම | එම |
| 171 ජේ | එම | එම |
| 176 එම් | එම | එම |
| 177 ජී | එම | එම |
| 179 එච් | එම | එම |
| 179 අයි | එම | එම |
| 191 එෆ් | එම | එම |
| 198 එෆ් | එම | එම |
| 213 ඩී | එම | එම |
| 214 ඩී | එම | එම |
| 213 ඊ | එම | එම |
| 225 බී | එම | එම |
| 225 සී | එම | එම |
| 231 බී | එම | එම |
| 232 බී | එම | එම |
| 234 බී | එම | එම |
| 235 ඒ | එම | එම |
| 243 ඒ | එම | එම |
| 221 සී | අයර්ෂයර් දෙමුහුන් | එම |
| 228 සී | එම | එම |

මෙම සතුන් අංගොඩ මානසික රෝහල කිරිපට්ටියේදී පරීක්ෂා කර බැලීමට, අංගොඩ මානසික රෝහල වෛද්‍ය අධිකාරි තැන සමඟ පෝ දින, පෙර පෝ දින හා ප්‍රසිද්ධ නිවාඩු දිනයන් හැර සතියේ වැඩ කරන දිනයන්හිදී විධිවිධාන යොදගත හැකිය.

ජයග්‍රාහක ගැනුම්කරු විසින් වෙන්දේසිය අවසානවූ වහාම සම්පූර්ණ මුදල් ගෙවා සතුන් ගෙන යා යුතුය.

මෙම වෙන්දේසිය අවලංගු කිරීමට, කල් දැමීමට හෝ කවර ගැනුම් කරුවකු හෝ ඉවත් කිරීමට මානසික සෞඛ්‍ය සේවා අධිකාරි වෙත සම්පූර්ණ බලය තිබේ.

වැඩිමනත් විස්තර අංගොඩ මානසික රෝහල වෛද්‍ය අධිකාරි තැනගෙන් ලබාගත හැකිය.

වෛද්‍ය වයි. සෙනෙවිරත්න,
වැඩබලන මානසික සෞඛ්‍ය සේවා අධිකාරි.

මානසික සෞඛ්‍ය සේවා අධිකාරි කාර්යාලය,
අංගොඩ, 1970.

11-270—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## පොලිස් දෙපාර්තමේන්තුව

### වෙන්දේසියේ විකිණීමයි

මෙහි පහත දක්වෙන පැරණි බඩු 1970 නොවැම්බර් 30 වැනි දින පෙ.ව. 9 ට කුලියාපිටිය සහකාර පොලිස් අධිකාරි කාර්යාලයේදී ප්‍රසිද්ධ වෙන්සියේ විකුණනු ලැබේ.

| අනු අංකය | බඩුවල විස්තර | ප්‍රමාණය |
|---|---|---|
| 1 | ලී ඇඳන් | 2 |
| 2 | පාපැදි ආසන | 1 |
| 3 | පුටු (සාමාන්‍ය) | 2 |
| 4 | පුටු (අත්) | 2 |
| 5 | පීඩන ලාම්පු | 4 |
| 6 | මේස ලාම්පු | 1 |
| 7 | කුණාටු ලන්තෑරුම් | 1 |
| 8 | ගැලුම් හතරේ ටින් | 33 |
| 9 | කොහු ගුදිරි | 17 |
| 10 | යතුරු ලියන (ඉංග්‍රීසි) | 1 |
| 11 | ගට්ටන කොප්පි | 3 |
| 12 | කාකි බට කබා | 17 |
| 13 | කාකි කැලෑ කබා | 3 |
| 14 | කාකි කොට කලිසම් | 24 |
| 15 | නිල පලස් | 14 |
| 16 | වැහි කබා (කලු) | 3 |
| 17 | වැහි කබා පටි | 3 |
| 18 | වැහි කබා රබර් | 1 |
| 19 | බූට්ස් සපත්තු කුට්ටම් | 34 |
| 20 | උන්ඩා උර | 7 |
| 21 | හම් පටි ... | 7 |
| 22 | හම් සපත්තු කුට්ටම් | 145 |
| 23 | කැන්වස් සපත්තු කුට්ටම් | 4 |
| 24 | ඇල කොප්පි | 125 |

ඉහත සඳහන් බඩු 1970 නොවැම්බර් 29 දින පෙ.ව. 9 සිට ප.ව. 4 දක්වා කාලය ඇතුළත කුලියාපිටිය සහකාර පොලිස් අධිකාරි කාර්යාලයේදී බැලිය හැක.

ජ. දෙ. මී. ආරියසිංහ,
කුලියාපිටිය සහකාර පොලිස් අධිකාරි.

1970 ඔක්තෝබර් මස 30 වැනි දින,
කුලියාපිටිය පොලිස් කාර්යාලය.

11-240—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

මෙහි පහත සඳහන් ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ 1970 නොවැම්බර් මස 27 වැනි දින කොළඹ 7, රීඩ් මාවතේ, රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දී පෙ. ව. 10 ට වෙන්දේසියේ විකුණනු ලැබේ. මෙම භාණ්ඩයන් කාර්යාල වේලාවන් හිදී ඉහත කී ස්ථානයේ දී පරීක්ෂා කළ හැකිය. බඩු ගැනුම්කරුවන් විසින් ඉල්ලා මිළට ගත් බඩු මුදල් ගෙවා එවේලේම ඉවත් කර ගත යුතුය. චෙක්පත් භාරගනු නොලැබේ.

### වෙන්දේසි කරන භාණ්ඩ විස්තරය

| | | |
|---|---|---|
| (1) | පුටු, ටයිප්කරු, වෙනස්කළ හැකි | 2 |
| (2) | යතුරු ලියන යන්ත්‍ර, දෙමළ, රෙමින්ටන් | 1 |
| (3) | ශීතකරණ කවර | 1 |

පීටර් පී. අබේසේකර,
රාජ්‍ය භාෂා කටයුතු පිළිබඳ කොමසාරිස්.

වර්ෂ 1970 නොවැම්බර් මස 2 ද,
කොළඹ 7, රීඩ් මාවතේ,
රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුවේ දී ය.

11-292—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### ගොඩනැගිලි උපකරණ සැපයීමේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම

1971 වර්‍ෂය සඳහා, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, මැද කොළඹ, දකුණු කොළඹ, මීගමුව හා කළුතර යන දිස්ත්‍රික්කයන් සඳහා අවශ්‍ය ගොඩනැගිලි උපකරණ සැපයීමේ කොන්ත්‍රාත්කරුවන් වශයෙන් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ. පහත සඳහන් දෑ ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ගෙන් ඉල්ලා සිටිනු ලැබේ.

(1) ගොඩනැගිලි උපකරණ සැපයීම සඳහා, අයදුම්කරුට මිල මුදල් අතින් ශක්තියක් තිබිය යුතුය. එය සනාථ කිරීමට රජයේ දෙපාර්තමේන්තුවලට ද්‍රව්‍ය සැපයීම සඳහා, අයදුම්කරුට ඇති මිල මුදල් ශක්තිය හා සාමාන්‍ය තත්ත්වය දක්වෙන දිස්ත්‍රික් ආදායම් නිලධාරී තැනගෙන් ලබාගත් රිපෝර්තුවක් අයදුම්පතට ඇමිණිය යුතුයි.

(2) කළ පළපුරුද්ද හා රජයේ දෙපාර්තමේන්තු සහ/හෝ පිළිගත් පුද්ගලික ආයතන සමග හෝ තිබූ කොන්ත්‍රාත් හෝ භාරගත් වගකීම් තිබේ නම් ඒවා සාර්ථක ලෙස නිම කළ බවට සාධක ඉදිරිපත් කළ යුතුයි.

(3) බඩුමුට්ටු ප්‍රවාහන කිරීම සඳහා වාහන ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතුයි.

**අවශ්‍ය උපකරණ :**

1. $\frac{3}{4}$" කලුගල්
2. 1" කලුගල්
3. $1\frac{1}{2}$" කලුගල්
4. 2" කලුගල්
5. 6"—9" සක්ක ගල්
6. ගඩොල්
7. ගංගාවැලි
8. හුනු (පදම් කළ සහ තම්බන ලද)
9. රවුම් කැලෑ ලී
10. පලංචි සඳහා උණ බම්බු
11. පොල් අතු
12. පැතලි කැලිකට් උළු
13. මුදුන් උළු
14. අධිකවාකාර උළු

කුමන දිස්ත්‍රික්කයක් සඳහා ගොඩනැගිලි උපකරණ සැපයීමට බලාපොරොත්තු වන්නේද යන්න අයදුම්කරු විසින් සඳහන් කළ යුතුය.

මේ සඳහා අයදුම් පත්, 1970 නොවැම්බර් මස විසිහය වැනි දින තෙක් කොළඹ 7, ටොරින්ටන් චතුරශ්‍රයේ, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ, බටහිර කොටසේ අධිකාරී ඉංජිනේරු තැන විසින් භාරගනු ලැබේ. අයදුම් පත් ලේඛනගත තැපෑලෙන් එවිය යුතු හෝ අතින් ගෙනවිත් භාරදිය යුතු අතර, තැපෑලේදී ඇතිවන ප්‍රමාද දෝෂයන් සම්බන්ධයෙන් මෙම දෙපාර්තමේන්තුව වගකියනු නොලැබේ. එදින එකී වේලාවට පසුව ලැබෙන අයදුම් පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පී. එස්. මුතුකුමාරස්වාමි,
බටහිර කොටසේ අධිකාරී ඉංජිනේරු තැන
(ගොඩනැගිලි).

1970 නොවැම්බර් 3 දින.

11–336—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### 1970–71 මුදල් වර්‍ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමට ලියාපදිංචි කිරීම

බදුල්ල දිස්ත්‍රික්කයේ වැඩ සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අවශ්‍යව ඇත. බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු විසින් මෙම ද්‍රව්‍ය සැපයීමට ලියා පදිංචිවූ අයගෙන් පමණක්, වරින් වර මිළ ගණන් ඉල්ලා සපයා ගනු ලැබේ.

2. මෙම ද්‍රව්‍ය සැපයීමට ලියා පදිංචි වීමට සතුටු අය ඔවුන්ගේ ඉල්ලුම් පත්, 70.11.29 වැනි දින පෙ.ව. 10.30 ට හෝ ඊට ප්‍රථම බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරුට ලැබෙන ලෙස ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය එම ඉල්ලුම් පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ " 1970/71 මුදල් වර්‍ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ලියා පදිංචිවීම " යනුවෙන් සඳහන් කළ යුතුයි.

3. ඉල්ලුම්කරුවන් විසින් පහත සඳහන් විස්තර සැපයිය යුතුය:—
(අ) ඉල්ලුම්කරු විසින් සැපයිය හැකි ද්‍රව්‍ය වල විස්තර ලැයිස්තුවක්.
(ආ) ද්‍රව්‍ය සැපයීම සඳහා ඉල්ලුම්කරුට ලබාගත හැකි ලොරි, ටිපර්, ට්‍රැක්ටර් යනාදි වාහනවල විස්තර.
(ඇ) මෙවැනි වැඩ ගැන පළපුරුද්දක් තිබේ නම් ඒ බව සනාථ කරන ලියවිලි.
(ඈ) ඉල්ලුම් කරුට මෙම ද්‍රව්‍ය සැපයීමට හැකි නගර හෝ පළාත් සීමාව.

4. අවශ්‍ය කරන ද්‍රව්‍යයන් පිළිබඳ විස්තර :—

| | | | |
|---|---|---|---|
| i. | ගඩොල් | vii. | 1" කලුගල් |
| ii. | ග්‍රවල් පස් | viii. | $\frac{3}{4}$" කලුගල් |
| iii. | 6"–9" සක්ක ගල් | ix. | වලවල්වලින් භාරන ලද වැලි |
| iv. | 4" කලුගල් | x. | ගඟේ වැලි |
| v. | 2" කලුගල් | xi. | අළු හුණු |
| vi. | $1\frac{1}{2}$" කලුගල් | xii. | තම්බපු හුණු |

xiii. පලංචි සඳහා උණ බම්බු.

5. වෙනත් රජයේ දෙපාර්තමේන්තුවලට මෙම ද්‍රව්‍ය සපයා පළපුරුද්දක් ඇති අය හෝ මුදලින් වත්කම ඇති අය පමණක් ලියා පදිංචිවීමට සුදුසුවනවා ඇත. තමා පදිංචි ප්‍රදේශයේ ප්‍රා.ආ.නි. ගෙන් ලබාගත් වත්කම් පිළිබඳ සහතිකයක් සහ මෙම ද්‍රව්‍ය සැපයීමට සුදුසු බවටත් සහතිකයක් ඉල්ලුම් පත් සමඟ ඉදිරිපත් කළ යුතුය.

ජී. ඩී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු
(ගොඩනැගිලි).

1970 නොවැම්බර් මස 4 වැනි දින,
බදුල්ල, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දීය.

11–400/1—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

---

## ගොඩනැගිලි දෙපාර්තමේන්තුව

### 1970–71 මුදල් වර්‍ෂයේ කල්මුනේ දිස්ත්‍රික්කයේ ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීමට ලියාපදිංචි කිරීම

කල්මුනේ දිස්ත්‍රික්කයේ වැඩ සඳහා ගොඩනැගිලි ද්‍රව්‍ය විශාල ප්‍රමාණයක් අවශ්‍යව ඇත. බදුල්ල ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු විසින් මෙම ද්‍රව්‍ය සැපයීමට ලියා පදිංචි වූ අයගෙන් පමණක් වරින් වර මිළ ගණන් ඉල්ලා සපයා ගනු ලැබේ.

2. මෙම ද්‍රව්‍ය සැපයීමට ලියා පදිංචි වීමට සතුටු අය ඔවුන්ගේ ඉල්ලුම් පත්, 70.11.29 දින පෙ.ව. 10.30 ට හෝ ඊට ප්‍රථම බදුල්ලේ ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරුට ලැබෙන ලෙස ලියා පදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. එම ඉල්ලුම් පත් බහාලන කවරයේ වම් පස උඩ කෙළවරේ " 1970/71 මුදල් වර්‍ෂයේ බදුල්ල දිස්ත්‍රික්කයට ගොඩනැගිලි ද්‍රව්‍ය සැපයීම සඳහා ලියා පදිංචි වීම " යනුවෙන් සඳහන් කළ යුතුයි.

3. ඉල්ලුම් කරුවන් විසින් පහත සඳහන් විස්තර සැපයිය යුතුය:—
(අ) ඉල්ලුම්කරු විසින් සැපයිය හැකි ද්‍රව්‍ය වල විස්තර ලැයිස්තුවක්,
(ආ) ද්‍රව්‍ය සැපයීම සඳහා ඉල්ලුම් කරුට ලබාගත හැකි ලොරි, ටිපර්, ට්‍රැක්ටර් යනාදි වාහන වල විස්තර.
(ඇ) මෙවැනි වැඩ ගැන පළපුරුද්දක් තිබේ නම් ඒ බව සනාථ කරන ලියවිලි.
(ඈ) ඉල්ලුම් කරුට මෙම ද්‍රව්‍යය සැපයීමට හැකි නගර හෝ පළාත් සීමාව .

4. අවශ්‍ය කරන ද්‍රව්‍යයන් පිළිබඳ විස්තර :

| | | | |
|---|---|---|---|
| i. | ගඩොල් | vii. | 1" කලුගල් |
| ii. | ග්‍රවල් පස් | viii. | $\frac{3}{4}$" කලුගල් |
| iii. | 6"–9" සක්ක ගල් | ix. | වලවල්වලින් භාරන ලද වැලි |
| iv. | 4' කලුගල් | x. | ගඟේ වැලි |
| v. | 2" කලුගල් | xi. | අළු හුණු |
| vi. | $1\frac{1}{2}$" කලුගල් | xii. | තම්බපු හුණු |

xiii. පලංචි සඳහා උණ බම්බු.

5. වෙනත් රජයේ දෙපාර්තමේන්තු වලට මෙම ද්‍රව්‍ය සපයා පළපුරුද්දක් ඇති අය හෝ මුදලින් වත්කම ඇති අය පමණක් ලියා පදිංචිවීමට සුදුසු වනවා ඇත. තමා පදිංචි ප්‍රදේශයේ ප්‍රා.ආ.නි. ගෙන් ලබාගත් වත්කම් පිළිබඳ සහතිකයක් සහ මෙම ද්‍රව්‍ය සැපයීමට සුදුසු බවටත්, සහතිකයක් ඉල්ලුම්පත් සමහ ඉදිරිපත් කළ යුතුය.

ජී. ඩී. සමරසූරිය,
නැගෙනහිර කොට්ඨාශයේ අධිකාරි ඉංජිනේරු
(ගොඩනැගිලි).

1970 නොවැම්බර් මස 4 වැනි දින,
බදුල්ල, ගොඩනැගිලි දෙපාර්තමේන්තුවේ දී ය.

11–400/2—70.11.12 දින අංක 14,932 දරන ගැසට් පත්‍රය

## ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළකරනු ලැබේ. සිකුරාදා දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව, එනී ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුලත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතු වන බව සලකන්න

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් කොළඹ මහලේකම් කාර්යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත කෙලින්ම ගෙවිය යුතුයි.

### උපලේඛනය

### 1970

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | | |
|---|---|---|---|---|
| ජූලි ... | 70. 7. 2 බ්‍රහස්පතින්දා ... | 70. 6.25 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |
| | 70. 7.10 සිකුරාදා ... | 70. 7. 2 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |
| | 70. 7.17 සිකුරාදා ... | 70. 7.10 සිකුරාදා | දහවල් | 12.0 |
| | 70. 7.24 සිකුරාදා ... | 70. 7.17 සිකුරාදා | දහවල් | 12.0 |
| | 70. 7.31 සිකුරාදා ... | 70. 7.24 සිකුරාදා | දහවල් | 12.0 |
| අගෝස්තු ... | 70. 8. 7 සිකුරාදා ... | 70. 7.30 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70. 8.14 සිකුරාදා ... | 70. 8. 7 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 8.21 සිකුරාදා ... | 70. 8.14 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 8.28 සිකුරාදා ... | 70. 8.21 සිකුරාදා | ප.ව. | 3.30 |
| සැප්තැම්බර් ... | 70. 9. 4 සිකුරාදා ... | 70. 8.28 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 9.11 සිකුරාදා ... | 70. 9. 4 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 9.18 සිකුරාදා ... | 70. 9.11 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70. 9.25 සිකුරාදා ... | 70. 9.18 සිකුරාදා | ප.ව. | 3.30 |
| ඔක්තෝබර් ... | 70.10. 2 සිකුරාදා ... | 70. 9.25 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70.10. 9 සිකුරාදා ... | 70.10. 2 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70.10.16 සිකුරාදා ... | 70.10. 9 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70.10.23 සිකුරාදා ... | 70.10.16 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70.10.30 සිකුරාදා ... | 70.10.23 සිකුරාදා | ප.ව. | 3.30 |
| නොවැම්බර් ... | 70.11. 5 බ්‍රහස්පතින්දා ... | 70.10.30 සිකුරාදා | ප.ව. | 3.30 |
| | 70.11.12 බ්‍රහස්පතින්දා ... | 70.11. 5 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |
| | 70.11.20 සිකුරාදා ... | 70.11.12 බ්‍රහස්පතින්දා | දහවල් | 12.0 |
| | 70.11.27 සිකුරාදා ... | 70.11.20 සිකුරාදා | දහවල් | 12.0 |
| දෙසැම්බර් ... | 70.12. 4 සිකුරාදා ... | 70.11.27 සිකුරාදා | දහවල් | 12.0 |
| | 70.12.11 සිකුරාදා ... | 70.12. 4 සිකුරාදා | දහවල් | 12.0 |
| | 70.12.18 සිකුරාදා ... | 70.12.10 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70.12.24 බ්‍රහස්පතින්දා ... | 70.12.17 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |
| | 70.12.31 බ්‍රහස්පතින්දා ... | 70.12.24 බ්‍රහස්පතින්දා | ප.ව. | 3.30 |

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

1970 ජූනි 2 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව කොළඹ.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණයකි.